SINHALI

# මුස්ලිම්වරුන් සඳහා

# මාර්ගෝපදේශයක්

he Co-operative Office for Call & foreigners Guidance at Sultanah
nder the supervision of Ministry of Islamic Affairs and Endowment and Propagation and Guidance
el. 4240077 Fax 4251005 P.O.Box 92675 Riyadh 11663 E-mail : Sultanah22@hotmail.com

# منهاج المسلم

أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

الطبعة الأولى: ١٤٢٢/٨

ⓒ المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالزلفي ، ١٤٢٢ هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

منهاج المسلم.ـ الزلفي .

... ص ؛ .. سم

ردمك : ٥ – ٠٦- ٨٦٤- ٩٩٦٠

( النص باللغة السنهالية )

١- الشريعة الإسلامية ٢- الفقه الإسلامي أ- العنوان

ديوي ٢٥٠ ٢٢/٣١٨٥

رقم الإيداع : ٢٢/٣١٨٥

ردمك : ٥- ٠٦- ٨٦٤- ٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# منهاج المسلم

# මුස්ලිම්වරුන් සඳහා මාර්ගෝපදේශයක්

## අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම

මුස්ලිම්වරයෙකු දෙවියෙකු සිටින බවත්, ඔහු අහස හා පොළොව නිර්මානය කළ බවත්, ඔහු ප්‍රසිද්ධ හා ගුප්තවූ කරුණු සියල්ල දැන සිටින බවත්, සෑම දේ නිර්මානය කළේ හා පරිපාලනය කරන්නේ ඔහු බවත්, වන්දනාමාන බල මහිමයට සුදුස්සා ඔහු හැර අන් කිසියම් කෙනෙකු නොමැති බවත්, ඔහු කිසිදු ඌනතා හෝ අඩුපාඩු හෝ නොමැති පරිපූර්ණ වන්තයා බවත් විශ්වාස කළ යුතුයි. මෙය ආධාරමය හා බුද්ධිමය සාධක මගින් තහවුරුවෙ.

## ආධාරමය සාධක

අල්ලාහ් දෙවියන් වහන්සේ සිටින බවත් ඔහු සෑම නිර්මානයන් මවා පාලනය කරන බවත් ඔහුට අලංකාර නාමයන් හා ලක්ෂණයන් තිබෙන බවත් ඔහුම සාක්ෂි දරා මෙසේ ප්‍රකාශ කරයි.

﴿إِنَّ رَبَّكُمُ اللهُ الَّذِيْ خَلَقَ السَّمَاوَاتِ وَالْأَرْضَ فِيْ سِتَّةِ أَيَّامٍ ثُمَّ اسْتَوَى عَلَى الْعَرْشِ، يُغْشِي اللَّيْلَ النَّهَارَ يَطْلُبُهُ حَثِيْثًا وَّالشَّمْسَ وَالْقَمَرَ وَالنُّجُوْمَ مُسَخَّرَاتٍ بِأَمْرِهِ، أَلاَ لَهُ الْخَلْقُ وَالْأَمْرُ، تَبَارَكَ اللهُ رَبُّ الْعَالَمِيْنَ﴾ [الأعراف: ٥٤]

නිසැකයෙන්ම, ඔබලාගේ දෙවියා අල්ලාහ්ය. ඔහු කවරෙකු නම්, අහස හා පොළොව දින හයකින් නිර්මානය කළාය. පසුව අර්ෂ (සිංහාසන)යෙහි තම පාලනය පිහිටුවේය. ඔහු දහවල රාත්‍රියෙන් වසන්නාය. එම රාත්‍රිය සීඝ්‍රයෙන් දහවල ලුහු බඳිමින් යන්නේය. ඔහුම ඉර, හඳ හා තාරකා යනාදීන් නිර්මානය කළාය. ඒ සියල්ල ඔහුගේ අණට යටත්ව පවතින්නේය. දැනගන්න. නිර්මානය කිරීමේ හා අණ කිරීමේ බලය ඔහුටම හිමිවේ. විශ්වයේ අධිපතියාවූ අල්ලාහ් භාග්‍ය බල සම්පන්නාය. *(අල්කුර්ආන්-7:54)*

﴿أَنْ يَّا مُوْسَى إِنِّيْ أَنَا اللهُ رَبُّ الْعَالَمِيْنَ﴾ [القصص: ٣٠]

මූසා (නබිතුමනි)! විශ්වයෙහි අධිපතියාවූ අල්ලාහ් හෙතම මමය. *(අල්කුර්ආන්-28:30)*

﴿إِنَّنِيْ أَنَا اللهُ لاَ إِلَهَ إِلاَّ أَنَا فَاعْبُدْنِيْ وَأَقِمِ الصَّلاَةَ لِذِكْرِيْ﴾ [طه: ١٤]

අල්ලාහ් මමය. වන්දනාමාන බල මහිමයට සුදුසු දෙවියා මා හැර අන් කිසිවෙකු නොමැත. එබැවින්, මාහට යටහත් වන්න. මාව සිහිකිරීම වස් නැමදුම ඉටුකරන්න *(අල්කුර්ආන්-20:14)*

﴿لَوْ كَانَ فِيْهِمَا آلِهَةٌ إِلاَّ اللهُ لَفَسَدَتَا،فَسُبْحَانَ اللهِ رَبِّ الْعَرْشِ عَمَّا يَصِفُوْنَ﴾

[الأنبياء: ٢٢]

ඒවාහි (අහස හා පොළොවෙහි) එකම අල්ලාහ් හැර වෙනත් දෙවිවරුන් සිටියේනම්, එවාහි පැවැත්ම පරිහානියට පත්ව ඇති. එබැවින්, ඔවුන්ගේ ව්‍යාජ වර්ණනා කෙරෙහි අර්ෂ (නම්වූ සිංහාසන)යට හිමිකාරයාවූ අල්ලාහ් ඉමහත් පවිත්‍රවන්ත යාය. *(අල්කුර්ආන්-21:22)*

විවිධ ලෝක හා විවිධ නිර්මාන සියල්ල තමාව නිර්මානය කළ දෙවි කෙනෙකු සිටින බවත්, එම දෙවියා අල්ලාහ් බවත් සාක්ෂි දරයි. මක්තිසාදයන්, මෙලොව මවා නිර්මානය කළේ තමා බව තර්ක කරන්නා ඔහු (අල්ලාහ්) හැර මෙලොවෙහි අන් කිසිවෙකු හෝ නොමැත. එසේම, මවන්නෙකු නොමැතුව මැවීම් නිර්මානයවීමද සාර්ථක නොවන බව මිනිස් බුද්ධියද පිළිගනී. එබැවින්, මෙවන් ආධාරමය, බුද්ධිමය හා වෙනත් සාදක මගින් අල්ලාහ්වද සැම දේ මවා පාලනය කරන ඔහුගේ බල මහිමයද පැරැන්නන් හා පසු වසන්නන් වන්දනාමානය කිරීමට සුදුසු එකම දෙවියා ඔහු බවද මුස්ලිම් වරයා විශ්වාස කරන්නේය.

සැම දේ නිර්මානය කර පාලනය කරන්නා අල්ලාහ්ය. ඔහුගේ පාලන බලයෙහි කිසියම් ආදේශ කරුවෙකු නොමැත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿الْحَمْدُ لِلَّهِ رَبِّ الْعَالَمِيْنَ﴾ [الفاتحة:١]

ප්‍රශංසා සියල්ල සමස්ත විශ්වයම මවා පාලනය කරන අල්ලාහ්ටම හිමිවේ. *(අල්කුර්ආන්-1:1)*

# බුද්ධිමය සාධක

1-කුඩා හෝ ලොකු හෝ සෑම දේ නිර්මානය කළේ අල්ලාහ් පමණි. අල්ලාහ් '(නබිතුමනි!) සෑම දේ නිර්මානය කළේ අල්ලාහ්ම බව (ඔබ) පවසන්න. *(අල්කුර්ආන්-13:16)* යනුවෙන් පවසන්නේය.

2-මැවීම් සියල්ලන්ටම ආහාර පානය සපයන්නේ අල්ලාහ්මවේ. අල්ලාහ් 'ආහාර පානයන් සැපයීම සඳහා අල්ලාහ් වගකීම් නොකියන කිසිදු පණ ඇති ජාතියක් හෝ පොළෝ තලය මත නොවන්නේය. *(අල්කුර්ආන්-11:6)* යනුවෙන් පවසන් නේය.

3-අල්ලාහ්ගේ පාලන බල මහිමය පිළිබඳව නිවැරදි මිනිස් බුද්ධිය සාක්ෂි දරන බව මිනිසුන් සෑම දෙනා තම සිත්සතන් මගින් දැන සිටිති. මේ පිළිබඳව අල්ලාහ් 'අහස් හතෙහි පාලකයා (දෙවියා) හා උතුම්වූ අර්ෂයෙහි පාලකයා (දෙවියා) කවරෙකුද ? යනුවෙන් (නබිතුමනි ඔබ මිනිසුන්ගෙන්) විමසනු. නිසැකයෙන්ම, ඔහු අල්ලාහ්මයවේ බව ඔවුහු පවසති' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-23:86,87)*

4-අල්ලාහ් සෑම දෙයකටම හිමිකාරයා හා පොදුවෙන් සෑම කාර්යම සිය මතය පරිදි පරිපාලනය කරන්නාය. අල්ලාහ් මේ බව 'ඔබලාට අහසෙන් හා පොළොවෙන් සිට ආහාර පානය සපයන්නේ කවරෙකුද ? (ඔබලාගේ) කන්දීමේ හා පෙනීමේ ශක්තිය කවරෙකුගේ බලයෙහි රැඳී පවතින්නේද? තවද, ප්‍රාණය නැති දේයින් සිට ප්‍රාණය ඇති දේද, ප්‍රාණය ඇති දේයින් සිට ප්‍රාණය නැති දේද මතු කරන්නේ කවරෙකුද ? තවද, (සර්ව විශ්වයෙහි) පැවැත්ම සැලසුම්කර

පරිපාලනය කරන්නේ කවරෙකුද ? යනුවෙන් (නබිතුමනි) ඔබ විමසන්න. එවිගස ඔවුහු 'අල්ලාහ්' යනුවෙන් පිළිතුරු දේවි. එසේනම්, ඔහු කෙරෙහි ඔබලා බැති සිතින් සිටිය නොහැකිද ? යනුවෙන් (ඔබ) විමසන්න. නිසැකයෙන්ම, ඔබලාව නිර්මානයකර පාලනය කරන අල්ලාහ් ගෙතම ඔහුමය. මෙම සත්‍යතාවයෙන් පසුද (ඔබලා) ඔහුට කීකරුවී වන්දනාමානය නොකළේනම්) එය (ඔබලාට) නොමගක් හැර කිසිවක් නොවන්නේය' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-10:31,32)*

එසේම, පැරැන්නන් හා පසු කාලයෙහි ජීවත්වන්නන් සෑම දෙනාටම වන්දනාමානය කිරීමට සුදුසු දෙවියා අල්ලාහ් බවත් වන්දනාමාය කිරීමට සුදුස්සා ඔහු හැර අන්කිසියම් කෙනෙකු නොමැති බවත් මුස්ලිම්වරයෙකු විශ්වාස කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿شَهِدَ اللهُ أَنَّهُ لَاإِلَهَ إِلاَّ هُوَ وَالْمَلآئِكَةُ وَأُولُواالْعِلْمِ قَائِمًا بِالْقِسْطِ، لاَ إِلَهَ إِلاَّ هُوَ الْعَزِيْزُ الْحَكِيْمُ﴾ [آل عمران:١٨]

අල්ලාහ් නීතිය (යුක්තිය) පිහිටුවන තැනැත්තා ලෙස සිටි යදී (කීකරුවී) වන්දනාමානය කිරීමට සුදුස්සා ඔහු හැර කිසි වෙකු නොමැති බව ඔහුම සාක්ෂි දරයි. එසේම, මලක් (සුර දූත) වරුන්ද ඥානවන්තයින්ද මෙසේම සාක්ෂි දරති. ඔහු හැර වන්දනාමාය කිරීමට සුදුස්සා අන් කිසිවෙකු නොමැත. ඔහු සියුම් බුද්ධිමතා හා ඥානවන්තයාය. *(අල්කුර්ආන්-3:18)*

﴿وَإِلَهُكُمْ إِلَهٌ وَاحِدٌ، لاَ إِلَهَ إِلاَّ هُوَ الرَّحْمَنُ الرَّحِيْمُ﴾ [البقرة:١٦٣]

තවද, ඔබලාගේ දෙවියා හෙතම එකම දෙවියාය. වන්දනා මානය කිරීමට සුදුසු දෙවියා ඔහු හැර අන් කිසියම් කෙනෙකු හෝ නොමැත. ඔහු අසීමිත කරුණා වන්තයාය. අපරිමිත ආදර වන්තයාය. *(අල්කුර්ආන්-2:163)*

සෑම රසූල් හෙවත් අල්ලාහ්ගේ දූත වරුන්ගේම පණිවිඩය වූයේද, ඔවුහු තම සමාජයින් කැඳවූයේද එකම දෙවියෙක්වූ අල්ලාහ්ට පමණක් වන්දනාමානය කළ යුතු බවටය. මෙය වන් දනාමානය කිරීමට සුදුස්සා අල්ලාහ් පමණක් වීමට සාදක වේ. නබි නූහ් (අලෛ) තුමා, නබි හූද් (අලෛ) තුමා, නබි සාලිහ් (අලෛ) තුමා හා නබි ෂුඅෙබ් (අලෛ) තුමා යනාදි අල්ලාහ් ගේ දූතයින් තම සමාජයින් අමතා මෙසේ කැඳවන්නට වූහ.

﴿يَا قَوْمِ اعْبُدُوا اللهَ مَا لَكُمْ مِنْ إِلَهٍ غَيْرُهُ﴾ [الأعراف:٥٩ و هود:٨٤،٦١،٥٠]

මාගේ සමාජයිනි, අල්ලාහ්ට (පමණක්) වන්දනාමානය කරන්න. ඔහු හැර වන්දනාමානය කිරීමට සුදුසු දෙවියෙකු ඔබලාට නොමැත. *(අල්කුර්ආන්-7:59,11:50,61,84)*

එසේම, අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙසේ පවසන්නේය.

﴿وَلَقَدْ بَعَثْنَا فِيْ كُلِّ أُمَّةٍ رَّسُوْلاً أَنِ اعْبُدُوا اللهَ وَاجْتَنِبُوا الطَّاغُوْتَ﴾

[النحل:٣٦]

නිසැකයෙන්ම, ඔබ අල්ලාහ්ට (පමණක්) වන්දනාමානය කරන්න. තාගූත් (ව්‍යාජ දෙවි) වරුන්ගෙන් වැළකී සිටින්න. යනුවෙන් දේශනා කිරීම සඳහා අපි සෑම සමාජයන් කරාම රසූල් හෙවත් දූතවරයෙක් එවා ඇත්තෙමු.

*(අල්කුර්ආන්-16:36)*

නබිනායක මුහම්මද් (සල්) තුමා අබ්දුල්ලාහ් බින් අබ්බාස් (රලි) තුමා අමතා මෙසේ පැවැසීය.

(رواه الترمذي) [ إِذَا سَأَلْتَ فَسْأَلِ اللهَ وَإِذَا اسْتَعَنْتَ فَاسْتَعِنْ بِاللهِ]

ඔබ යමක් අයැදින්නේනම්, අල්ලාහ්ගෙන්ම අයැදින්න. උප කාරයක් පතන්නේනම්, අල්ලාහ්ගෙන්ම පතන්න. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මද් (සල්) තුමාගේ වදනක් උබ්බාදා බින් සාමිත් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

(رواه الطبراني) [إِنَّهُ لاَ يُسْتَغَاثُ بِيْ، وَإِنَّمَا يُسْتَغَاثُ بِاللهِ]

මාගෙන් ආරක්ෂා පතනු නොලැබේ. නිසැකයෙන්ම, ආරක්ෂා පැතිය යුත්තේ අල්ලාහ්ගෙන් පමණක්ය. (තබරානි ග්‍රන්ථය ඇසුරෙනි)

නබි මුහම්මද් (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් තුමා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

(رواه الترمذي) [مَنْ حَلَفَ بِغَيْرِ اللهِ فَقَدْ أَشْرَكَ]

කවරෙකු අල්ලාහ් හැර අන් කිසියම් දෙයකු මත දිවුරා ප්‍රකාශ කරන්නේද, ඔහු (අල්ලාහ්ට) ආදේශ කළේය. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මද් (සල්) තුමාගේ වදනක් ඉබ්නු මස්ඌද් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

(رواه أحمد وأبو داود) [إِنَّ الرُّقَى وَالتَّمَائِمَ وَالتِّوَلَةَ شِرْكٌ]

නිසැකයෙන්ම, මතුරීම, දාදු කැටය පෑළීම හා (සැමියා යටහත්වීම සඳහා බිරිඳ කරන) මන්ත්‍රය කිරීම (අල්ලාහ්ට) ආදේශ කිරීමකි. *(අහ්මද් හා අබූදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම මුස්ලිම්වරයෙකු අල්ලාහ්ට අලංකාර නාමයන් හා උතුම් ලක්ෂණයන් ඇති බවත් ඒවා ඔහුට හැර අන් කිසි දෙය කට හෝ ආදේශ කිරීම, ඒවාට වැරදි අර්ථගත කිරීම, එවා ප්‍රතික්ෂේප කිරීම හා ඒවා මැවිලිවල ලක්ෂණවලට සමාන කිරීම යනාදීන් නොකළ යුතු බවත් විශ්වාස කළ යුතුයි.

තවද, අල්ලාහ්ට කුමන නාමයන් හා ලක්ෂණයන් ඇති බව අල්ලාහ් හා නබිනායක (සල්) තුමා තහවුරුකර ඇත්තේද ඒවා එලෙසම පිළිගත යුතු අතර, අල්ලාහ්ට කිසිඳු අඩුපාඩු හෝ බැලහීනකම් නොමැති බව අල්ලාහ් හා නබිනායක (සල්) තුමා යමක් ප්‍රතික්ෂේපකර ඇත්තේද ඒවා එලෙසම ප්‍රතික්ෂේප කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَلِلّٰهِ الْأَسْمَاءُ الْحُسْنَى فَادْعُوْهُ بِهَا وَذَرُوا الَّذِيْنَ يُلْحِدُوْنَ فِيْ أَسْمَائِه، سَيُجْزَوْنَ مَا كَانُوْا يَعْمَلُوْنَ﴾ [الأعراف: ١٨٠]

අල්ලාහ්ට අලංකාරවත් නාමයන් තිබේ. ඔබලා ඔහුගෙන් එමගින්ම ප්‍රාර්ථනා කරන්න. ඔහුගේ නාමයන් වැරදි සහගතව පරිහරණය කරන්නන් (ප්‍රතික්ෂේප කොට) අත් හරින්න. මවුන් ගේ ක්‍රියාවන් සඳහා මවුන්ට (සුදුසු) කුලිය ලැබෙනු ඇත.

*(අල්කුර්ආන්-7:180)*

﴿قُلِ ادْعُوا اللهَ أَوِادْعُوا الرَّحْمٰنَ، أَيًّامَّا تَدْعُوْا فَلَهُ الْأَسْمَاءُ الْحُسْنَى﴾

[الإسراء: ١١٠]

ඔබලා (මහුව) අල්ලාහ් යනුවෙන් හෝ අර්රහ්මාන් යනු වෙන් හෝ (කැඳවා) ප්‍රාර්ථනා කරන්න. ඔබලා කිසියම් නාම යෙන් හෝ මහුව (කැඳවා) ප්‍රාර්ථනා කළේද, මහුට (විවිධ) අලංකාරමත් නාමයන් තිබෙන්නේය. *(අල්කුර්ආන්-18:110)*

එසේම අල්ලාහ්ගේ දූතවරයාවූ නබිනායක මුහම්මදු (සල්) තුමාගේ වදන්වලද සාදකයන් තිබේය. එතුමා පැවැසූ බව අබූ හුරෙරා (රලි) තුමා මෙසේ පවසන්නේය.

[يَضْحَكُ اللهُ إِلَى رَجُلَيْنِ يَقْتُلُ أَحَدُهُمَا الآخَرَ، كِلاَهُمَا فِي الْجَنَّةِ]

(متفق عليه)

අල්ලාහ් පුද්ගලයන් දෙන්නෙකු කෙරෙහි සිනාහවන්නේය. මවුන්ගෙන් කෙනෙකු අනෙකා ඝාතනය කළායෙ. මවුන් දෙදෙ නාම ස්වර්ගයෙහි සිටිති. *(බුහාරි හා මුස්ලිම් ඇසුරෙනි)*

[لاَ تَزَالُ جَهَنَّمُ يُلْقَى فِيهَا وَهِيَ تَقُوْلُ : هَلْ مِنْ مَزِيْدٍ ؟ حَتَّى يَضَعَ رَبُّ الْعِزَّةِ فِيهَا رِجْلَهُ – وَفِيْ رِوَايَةٍ قَدَمَهُ – فَيَنْزَوِيَ بَعْضُهَا إِلَى بَعْضٍ ، فَتَقُوْلُ قَطْ قَطْ]

(متفق عليه)

අපායට අදාල සුදුස්සන් එහි පිවිසෙමින් සිටිති. එවිට අපාය 'තවත් සිටින්නෙහිද ? තවත් සිටින්නෙහිද ?' යනුවෙන් අසමින් සිටී. අවසානයේදී දෙවියා තම කකුල (වෙනත් වාර්තාවෙහි තම පාදය) එහි තබයි. එවිට එහි සමහරුන් සමහරුන් සමඟ එකතුවී තදබදයෙන් සිටිති. එවිට අපාය 'ප්‍රමාණවත්වේ, ප්‍රමාණ වත්වේ' යනුවෙන් පවසයි.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[يَقْبِضُ اللهُ الْأَرْضَ يَوْمَ الْقِيَامَةِ ، وَيَطْوِي السَّمَاءَ بِيَمِيْنِه ، ثُمَّ يَقُوْلُ : أَنَا الْمَلِكُ ، أَيْنَ مُلُوْكُ الْأَرْضِ ؟] (رواه البخاري)

පරලොව දිනයෙහි අල්ලාහ් (තම වමතින්) පොළොව අත් පත්කර තම දකුණු අතින් අහස අකුලා ගනී. පසුව 'පාලනය කරන රජු හෙතම මමය. මේ පොළොවෙහි රජුන් කොහිද ?' යනුවෙන් අල්ලාහ් විමසයි. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

මුස්ලිම්වරයෙකු අල්ලාහ්ගේ අලංකාර නාමයන් විශ්වාසය කරන කළද, එමගින් අල්ලාහ්ව වර්ණනා කරන කළද අල්ලාහ් ගේ අත මැවිලිවල අත්වලට සමානව පවතින බව උපමා කොට කිසිදු අර්ථයෙන් හෝ සිතාගත නොයුතුයි. එවන් සිතුවිලි කිසි යම් විටක හෝ මහුගේ සිත්සතන් තුල හැඟිය නොයුතුයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿لَيْسَ كَمِثْلِهِ شَيْءٌ وَهُوَ السَّمِيْعُ الْبَصِيْرُ﴾ [الشورى : ١١]

මහු (අල්ලාහ්) හා සමානව කිසිවක් නොමැත. මහු සැම දේ ශ්‍රවනය කරන්නා හා නෙත් යොමා සිටින්නාය.

*(අල්කුර්ආන්-42:11)*

# සහාබාවරුන් ප්‍රිය කිරීම

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ සහාබාවරුන් හෙවත් අනුගාමිකයින්ද එතුමාගේ පවුල් ඥාතීන්ද ප්‍රියකිරීම අනිවාර්ය

බවත්, මවුහු අන් මුස්ලිම් වරුන් හා විශ්වාස වන්තයින්ට වඩා ඉතා ශ්‍රේෂ්ඨවන්තයින් බවත් මුස්ලිම්වරයා විශ්වාස කළ යුතුයි. මවුන් අතර ශ්‍රේෂ්ඨභාවයෙහි වෙනස්කම් තිබේ. මවුහු ඉස්ලාම් ධර්මයෙහි පිවිසී ස්ථාවරය මත මවුන්ගේ තරාතිරමෙහි ශ්‍රේෂ්ඨ භාවය පවතී. මවුන් අතර ඉතාම ශ්‍රේෂ්ඨ වන්තයෝ නබිනායක තුමාගේ වියෝවෙන් පසු කලීෆා (ජනාධි පති) තනතුර දැරූ අබූබක්ර් බින් සිද්දීක් (රලි) තුමා, උමර් බින් කත්තාබ් (රලි) තුමා, උස්මාන් බින් අෆ්වාන් (රලි) තුමා හා අලි බින් අබීතාලිබ් (රලි) තුමා යන සතර දෙනාය.

පසුව නබිනායක තුමා විසින් ස්වර්ගවාසීන් බව සුභාරංචිය පතනලද දස දෙනාය. මවුහු කලීෆාවරුන් සතර දෙනා සමග තල්හා බින් අබ්දුල්ලාහ් (රලි) තුමා, සුබයිර් බින් අවාම් (රලි) තුමා, සඃද් බින් අබී වක්කාස් (රලි) තුමා, සඊද් බින් සෙයිද් (රලි) තුමා, අබූ උබයිදා ආමිර් බින් අල්ජර්රාහ් (රලි) තුමා, අබ්දුර් රහ්මාන් බින් අවෆ් (රලි) තුමා යන්නන්ය. පසුව බද්ර් යුද්ධයට සහභාගිවූ අයද, පසුව ස්වර්ගවාසීන් ලෙස සුභාරංචි පතනලද ඉහත කී දස දෙනා හැර ෆාතිමා (රලි) තුමිය, ඇගේ පුත්‍රයන්වූ හසන් සහ හුසෙයින් (රලි) තුමන්, සාබිත් බින් කෙයිස් (රලි) තුමා, බිලාල් බින් රභාහ් (රලි) තුමා හා මෙවන් අයවේ.

මෙසේම, ඉස්ලාමය වෙනුවෙන් කැපවී කටයුතු කළ ඉමාම් වරුන් (විද්වතුන්) ගරු කිරීම හා මවුන්ට ගෞරවය දැක්වීම අවශ්‍ය බව මුස්ලිම්වරයා විශ්වාස කළ යුතුයි. මවුන් සහාබා වරුන්ගේ කාල පරිච්ඡේදයෙන් පසුවූ පළවෙනි හා දෙවැනි කාල පරිච්ඡේදවල විසූ කාරිවරුන් (අල්කුර්ආනය කටපාඩම්

කර අලංකාර නාදයෙන් පාරායනා කරන්නන්), ෆුකහාවරුන් (නීති පද්ධතියෙහි විශාරදයින්), මුහද්දිස්වරුන් (නබිවදන් විවරණ පිළිබඳ විද්වතුන්) හා මුෆස්සිර්වරුන් (අල්කුර්ආනයෙහි අර්ථ විවරණ පණ්ඩිතයින්) යන්නන්ය.

එසේම, මුස්ලිම්වරුන්ගේ කාර්ය හා කටයුතුවල නායකත්වය දරන අමීර්වරුන්ට කීකරුවීම, ඔවුන් ගරුකිරීම, ඔවුන් හා එක්ව ඉස්ලාමය වෙනුවෙන් යුද්ධ කිරීම යනාදීන් අනිවාර්ය බවත් ඔවුන්ට එරෙහිව කටයුතු කිරීම හරාම් (තහනම්) බවත් මුස්ලිම් වරයා විශ්වාස කළ යුතුයි.

එබැවින්, ඉහත සඳහන් අය කෙරෙහි හැසිරීමේ සමහර සාරධර්මයෙන් පිළිපැදීම අනිවාර්යවේ.

# සහාබාවරුන් හා නබි පවුල් ඥාතීන්

අල්ලාහ් හා ඔහුගේ වක්තෘවරයාවූ නබිනායක මුහම්මදු (සල්) තුමා ඔවුහු ප්‍රියකරන බැවින් මුස්ලිම්වරයාද ඔවුන්ව ප්‍රිය කළ යුතු අතර, ඔවුහු වෙනත් මුස්ලිම් හා විශ්වාසීන්ට වඩා ශ්‍රේෂ්ඨයින් බවද විශ්වාස කළ යුතුයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَالسَّابِقُوْنَ الْأَوَّلُوْنَ مِنَ الْمُهَاجِرِيْنَ وَالْأَنْصَارِ وَالَّذِيْنَ اتَّبَعُوْهُمْ بِإِحْسَانٍ رَّضِيَ اللهُ عَنْهُمْ وَرَضُوْا عَنْهُ﴾ [التوبة : ١٠٠]

තවද, මුහාජිර්වරුන් හා අන්සාර්වරුන් අතර, ප්‍රථමයෙන් (විශ්වාස කිරීමෙහි) අභිබවා ගිය අය හා ඔවුන්ව (සෑම) කුසල් ක්‍රියාවන්හිම අනුගමනය කළ අය සිටින්නේද, ඔවුන් ගැන

අල්ලාහ් තෘප්තියට පත්වේ. ඔවුන්ද ඔහු ගැන තෘප්තියට පත් වෙති. *(අල්කුර්ආන්-9:100)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ සර්ද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لاَ تَسُبُّوْا أَصْحَابِيْ فَإِنَّ أَحَدَكُمْ لَوْ أَنْفَقَ مِثْلَ أُحُدٍ ذَهَبًا مَا بَلَغَ مُدَّ أَحَدِهِمْ وَلاَ نَصِيْفَهُ] (رواه أبو داود)

මාගේ අනුගාමිකයන්ට (දොස්පද කියා) නොබණින්න. කුමක්නිසාදයත්, (ඔබලාගෙන්) කෙනෙකු උහද් කඳු ගැටයට සමාන ප්‍රමාණයේ රත්රන් (අල්ලාහ්ගේ මාර්ගයෙහි) වියදම් කළද, ඔවුන්ගෙන් කෙනෙකු වියදම් කළ මුද්දු ප්‍රමාණය හෝ එහි අඩ ප්‍රමාණය(හි කුලිය ඔබලා) ලැබිය නොහැක. (මුද්දු යනු දෑතින් අල්ලා ගත හැකි ප්‍රමාණයකි) *(අබූදාවූද් ඇසුරෙනි)*

පොදුවෙන් සහාබාවරුන් අතර ශ්‍රේෂ්ඨයා අබූබක්ර් (රලි) තුමාය. පසුව උමර් (රලි) තුමා පසුව උස්මාන් (රලි) තුමා පසුව අලි (රලි) තුමා යනුවෙන් වටහා ගත යුතුයි.

'නබි මුහම්මදු (සල්) තුමා ජීවතුන් අතර සිටින කළ (සහාබාවරුන් අතර ශ්‍රේෂ්ඨයා) අබූබක්ර් (රලි) තුමා පසුව උමර් (රලි) තුමා පසුව උස්මාන් (රලි) තුමා පසුව අලි (රලි) තුමා යන පිළිවෙළට අපි පවසමින් සිටියෙමු. මෙය නබිතුමා දැන සිටියද එතුමා ප්‍රතික්ෂේප නොකළේය' යනුවෙන් ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

සහාබාවරුන්ගේ අඩුපාඩුකම් හා වැරදීත් ප්‍රසිද්ධ කිරීම, ඔවුන් අතර සිදුවූ මත භේද ගැන විවේචන කිරීම තහනම්ය.

නබිනායක මුහම්මද් (සල්) තුමාගේ භාර්යාවන්ගේ ගරුත්වය සහ අවංකභාවය ගැනත්, ඔවුන් (නින්දාවලින්) පවිත්‍රවන්තින් බවත්, ඔවුන් අතර ශ්‍රේෂ්ඨවන්තින් කුවයිලිද්ගේ දියණිය වූ කදීජා (රලි) තුමිය හා අබූබක්ර් (රලි) තුමාගේ දියණියවූ ආයිෂා (රලි) තුමිය බවත් විශ්වාසය කළ යුතුයි.

# ඉස්ලාමීය විද්වතුන්

අල්කුර්ආනය අලංකාරමත් කටහඬින් පාරායනා කරන කාරීවරුන්, ඉස්ලාමීය නීති විශාරදයින් (ෆකීහ්) හා නබිවදන් විවරණ කරන (මුහද්දිස්) විද්වතුන් ප්‍රිය කිරීම, ඔවුන්ට ආදරය දැක්වීම හා ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගැනීම අනිවාර්යවේ.

ඔවුන් ගැන යහපත් කරුණු පමණක් කිව යුතු අතර, ඔවුන් පිළිබඳව දොස් කීම හෝ ව්‍යාජ මත පතුරුවීම හෝ නොකළ යුතුයි. ඔවුහු අල්ලාහ් වෙනුවෙන් යනු පිරිසිදු චේතනාවෙන් ආගමික (අල්කුර්ආන් හා නබිවදන් පිළිබඳ) කරුණු පර්යේෂනය කරමින් සිටි අය ලෙස සිතාගත යුතුයි. ඔවුන්ගේ දැනුම හා මතය ඔවුන්ට පසු විසූවන්ගේ දැනුම හා මතවලට වඩා ශ්‍රේෂ්ඨයකි. අල්ලාහ්ගේ හෝ නබිතුමාගේ හෝ සහාබාවරුන් ගේ හෝ කරුණුවලට පටහැනි නොවීමෙන් තොරව ඔවුන්ගේ කරුණු හා මත ප්‍රතික්ෂේප නොකළ යුතුයි.

ඉමාම් මාලික් (රහ්), ඉමාම් ෂාෆිර් (රහ්), ඉමාම් අහ්මද් (රහ්) හා ඉමාම් අබූහනීෆා (රහ්) යනාදි විද්වතුන් සතර දෙනා සම්පාදනය කළ ග්‍රන්ථද ඔවුන් ප්‍රකාශ කළ ආගමික කරුණු හා ෆික්හ් හෙවත් ෂරීආ නීතිරීතින් සියල්ල අල්ලාහ්ගේ

අල්කුර්ආන් හා නබිතුමාගේ නබි වදන් මාර්ගයෙන් සම්පාදනය කළ එකකි. ඒවා සියල්ල අල්කුර්ආන් හා නබිවදන් යන මූලික සාධක මගින් වටහා ගත් හෝ එමගින් පර්යේෂනය කළ උපුටා ගත් හෝ මෙම සාධක දෙක මගින් උපමා (කියාස්) කොට ලබා ගත් හෝ හැර අන් කිසිවක් නොමැත.

ඔවුහු නිවැරදි හා වැරදි මත ප්‍රකාශ කිරීමට හැකි සාමාන්‍ය මිනිසුන් ලෙසත් පිළිගත යුතුය. සමහර අවස්ථාවල ඔවුන්ගෙන් කෙනෙකු යම් කරුණක් පිළිබඳ නිතිරීතිවල සත්‍යභාවයට පට හැනිව යමක් කියවා ඇත. නමුත් එවා ඕනෑකමින් කළ එකක් නොවේ. සමහරවිට අමතකවීමෙන් හෝ නොසැලකිලිමත්ව හෝ ගැඹුරු පර්යේෂනයකින් තොරව හෝ ඒවා ප්‍රකාශ කිරීමට සිදුවී ඇත. එබැවින්, මුස්ලිම්වරයා කිසිම අවස්ථාවක ඔවුන්ගෙන් (අන් අය ප්‍රතික්ෂේප කරමින්) කෙනෙකුගේ කරුණු පමණක් හිතුවත්කාර කමින් අනුගමනය නොකළ යුතුය. නමුත්, ඔවුන්ගෙන් කිසියම් කෙනෙකුගේ හෝ වේවා ඔහුගේ කරුණු අනුගමනය කළ හැක.

# වගකීම් දරන්නන්

මුස්ලිම් වරුන් තමන්ට නායකත්වය දී තම කාර්යයන් පාලනය කරන වගකීම් දරන්නන්ට කීකරුවී ඔවුන් පිළිපැදීම අනිවාර්යයවේ. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوْا أَطِيْعُوا اللهَ وَأَطِيْعُوا الرَّسُوْلَ وَأُولِي الْأَمْرِ مِنْكُمْ﴾

[النساء: ٥٩]

විශ්වාස වන්තයිනි, ඔබලා අල්ලාහ්ද, (ඔහුගේ) දූතවරයාද, ඔබලාගේ කාර්යවල වගකීම් දරන්නන්ද අනුගමනය කරන්න. *(අල්කුර්ආන්-4:56)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[اِسْمَعُوْا وَأَطِيْعُوْا وَإِنْ تَأَمَّرَ عَلَيْكُمْ عَبْدٌ حَبَشِيٌّ كَأَنَّ رَأْسَهُ زَبِيْبَةٌ]

(رواه البخاري)

ඔබලාගේ වගකීම් දරන්නා වියලුණු මිදි සේ හිසකින් යුත් නීග්‍රෝ දාසයෙකු හෝ වේවා (ඔහුගේ අණට කීකරුවෙන්) සවන් දී ඔහුව පිළිපදින්න. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

එනමුත්, අල්ලාහ්ට පටහැනි කරුණුවල ඔවුන්ට කීකරු නොවිය යුතුයි. මක්නිසාදයත්, ඔවුන්ට කීකරුවීමට වඩා අල් ලාහ්ව පිළිපැදීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතුයි. නබිනායක තුමා 'නිර්මාතෘවරයාට පටහැනි කාර්යවල කිසියම් නිර්මානවලට කීකරු නොවිය යුතුයි' යනුවෙන් පවසා ඇත. ඔවුන්ව ප්‍රතික් ෂේප කිරීම හා ඔවුන්ගේ අඩුපාඩු ප්‍රසිද්ධ කිරීම තහනම්ය. නබිනයෙක (සල්) තුමා පැවැසූ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[مَنْ كَرِهَ مِنْ أَمِيْرِهِ شَيْئًا فَلْيَصْبِرْ، فَإِنَّهُ مَنْ خَرَجَ عَلَى السُّلْطَانِ شِبْرًا مَاتَ مِيْتَةَ الْجَاهِلِيَّةِ] (متفق عليه)

කවරෙකු තම නායකයාගෙන් අප්‍රිය දෙයක් දුටුවේද, ඔහු ඒ ගැන ඉවසා සිටිනු. මන්දයත්, නායකයෙකුට කීකරුවීමෙහි

ව්‍යක්ත ප්‍රමාණයක් පිටත්වූයේනම්, ඔහු අඥාන කාලයේ විසූ වුවත් නැසී ගිය සේ මරණයට පත්වේ.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

ඔවුන් යුක්ති සහගතව හා අවංකව ක්‍රියා කිරීම සඳහාද, ඔවුන්ට කරුණාව හා උපකාරය ලැබීම සඳහාද, අකුසල් හා නපුරු දේවලින් ඔවුන් ආරක්ෂාවීම සඳහාද අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුතුයි. මක්නිසාදයත්, සමාජයෙහි ශීලචාරය ඔවුන් ශීලාචාරවීමෙන්ද, සමාජයේ පරිහානිය ඔවුන් පරිහානිය වීමේ පදනම මතද පවතින්නේය.

ඔවුහු දේව ප්‍රතික්ෂේපය හැර කිසියම් පාප කාර්යයන්හි හෝ නහනම් කාර්යයන්හි යෙදුනද, ඔවුන් සමග එක්වී ජිහාද් හෙවත් සටන් කිරීමද ඔවුන් අනුගමනය කොට සලාතය ඉටු කිරීමද අනිවාර්යවේ. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් තම පියාගෙන් තමා සවන් දුන් බව අල්කමා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[اِسْمَعُوْا وَأَطِيْعُوْا فَإِنَّمَا عَلَيْهِمْ مَاحُمِّلُوْا وَعَلَيْكُمْ مَاحُمِّلْتُمْ] (روا مسلم)

ඔවුන්ට සවන් දෙන්න. ඔවුන්ට කීකරුවන්න. ඔවුන් මත පවරන ලද කාර්යයන් සඳහා ඔවුන් වගකිව යුතුයි. ඔබලාට පැවැරූ කාර්යයන් සඳහා ඔබලා වගකිව යුතුයි.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් අපි 'උනන්දුවෙන් සිටින කළද, කම්මැලිකමින් සිටින කළද, ප්‍රීතියෙහි සිටින කළද, දුෂ්කරතාවයෙහි සිටින කළද, අප අයිතිවාසිකම් අපෙන් අහිමි කරන කළද, වගකිව යුත්තන් (නායකයන්)ගේ අණට

සවන්දී කීකරුවෙමින් සිටින්නෙමු. ඔවුන්ගෙන් පැහැදිළි දේව ප්‍රතික්ෂේපය දිටීමෙන් හැර ඔවුන්ගේ වගකීම් පිළිබඳව ඔවුන් සමග අපි තර්ක නොකරන්නෙමු' යනුවෙන් දිවුරා ගිවිසගෙන සිටී බව උබ්බාදා බින් සාමිත් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

# අල්ලාහ් කෙරෙහි සාරධර්ම

මුස්ලිම්වරයා තම මවගේ ගර්භාෂයෙහි ධාතු බිංදුවක් ලෙස සිටිකළ සිට ඔහු තම පරලොවෙහි තම දෙව්යා බැහැ දකින තෙක් ඔහුට අල්ලාහ් පිරිනමා ඇති ඉමහත් භාග්‍යයන් ගැන සිතා බලා ඒ වෙනුවෙන් අල්ලාහ්ට ඔහු සිය දිවෙන් පැසසුම් කර තම අවයවන් ඔහුට කළ යුතු වන්දනාමානයන්හි යෙදීම මගින් ඔහුට තුති පුදකිරීම අනිවාර්යවේ. මෙවා අල්ලාහ් කෙරෙහි සාර ධර්මයන්ය. මන්දයත්, භාග්‍යයන් හා උපකාර යන් පිරිනැමූ තැනැත්තාව ප්‍රතික්ෂේප කිරීම හා ඒවාට තුති පුදකිරීමෙන් වැළකීම යහපත් චරිත ක්‍රියාවක් නොවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَا بِكُمْ مِّنْ نِّعْمَةٍ فَمِنَ اللهِ﴾ [النحل : ٥٣]

තවද, කුමන භාග්‍යයන් ඔබලා සතුව ඇතත්, ඒ (සියල්ල) අල්ලාහ්ගෙන් (ඔබලාට) ලැබූ දෙයකි. *(අල්කුර්ආන්-16:53)*

﴿وَإِنْ تَعُدُّوا نِعْمَةَ اللهِ لَا تُحْصُوهَا﴾ [النحل : ١٨]

අල්ලාගේ භාග්‍යයන් ඔබලා ගැනුම් කළද, ඒවා (සීමිත කොට) ඔබලාට ගැනුම් කළ නොහැක. *(අල්කුර්ආන්-16:18)*

﴿فَاذْكُرُوْنِيْ أَذْكُرْكُم وَاشْكُرُوْلِيْ وَلاَ تَكْفُرُوْنِ﴾ [البقرة : ١٥٢]

එනිසා, ඔබලා මාව සිහි කරන්න. මාද ඔබලාව සිහි කරමි. තවද, ඔබලා මාහට තුති පුද කරන්න. මාහට විරුද්ධකම් නොකරන්න. *(අල්කුර්ආන්-2:153)*

අල්ලාහ් තමාගේ සෑම ස්ථාවරයන්ද පිරිවරා දැන සිටින බව මුස්ලිම්වරයා සිතාගත යුතුයි. අල්ලාහ් පිළිබඳ බියභැතිකම, ඔහුගේ ගරුත්වය හා ශ්‍රේෂ්ටභාවය ඔහුගේ සිත්සතන්තුල හැඟෙන්නේ හොතම එවිටමයවේ. මෙනිසා, අල්ලාහ්ට විරුද්ධ කම් කිරීම හා ඔහුට යටහත්වී කීකරු නොවීම කෙරෙහි ඔහු ලැජ්ජාවට පත්වෙ.

මෙය අල්ලාහ් හා සමග හැසිරීමේ සාරධර්මයන්ය. කුමක් නිසාදයත්, තමා පිළිබඳව පිරිවරා දැන සිටින තම දෙවියාට දාස යෙකු ප්‍රසිද්ධියෙන් විරුද්ධකම් කිරීම හෝ අකුසල් හා නින්දිත ක්‍රියාවන්හි යෙදීම සාරධර්මයක් විය හැකිද ? අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَاللهُ يَعْلَمُ مَا تُسِرُّوْنَ وَمَا تُعْلِنُوْنَ﴾ [النحل:١٩]

තමුදු, ඔබලා රහස්ගතව හා ප්‍රසිද්ධියෙන් යෙදෙන ක්‍රියාවන් (සියල්ල) අල්ලාහ් ඉතා දැන සිටින්නාය. *(අල්කුර්ආන්-16:19)*

තමාව මෙල්ල කිරීමේ ශක්තිය හා බලය අල්ලාහ් ලබා සිටින බවත්, ඔහු හැර තමාට කිසිදු අභයක් හෝ නිදහසක් හෝ ගැලවීමේ මාර්ගයක් හෝ නොමැති බවත් මුස්ලිම්වරයා විශ්වාස කළ යුතුයි. තම සෑම කාර්යයන් ඔහු වෙතම භාරකර ඒ සඳහා ඔහුම විශ්වාසය කළ යුතුයි. මෙය තමා නිර්මාතය

කළ දෙවියා සමග හැසිරීමේ ගුණධර්මයෙකි. මක්නිසාදයත්, අභය ලබාදීමට නොහැකි තැනැත්තාගෙන් අභය පැතීම හෝ යොමුකරන භාරය ඉටුකිරීමට නොහැකි අය වෙත භාර කිරීම හෝ කෙසේ සාරධර්මයක් විය හැකිද? අල්ලාහ් මෙසේ පවසයි.

﴿مَا مِنْ دَابَّةٍ إِلاَّ هُوَ آخِذٌ بِنَاصِيَتِهَا﴾ [هود:٥٦]

කුමන ප්‍රාණියත් හෝ වේවා මවුන්ගේ කුඩුම්භිය මහු (අල් ලාහ්)ගේ ඇතින්නයෙහිම පවතී. *(අල්කුර්ආන -11:56)*

﴿وَعَلَى اللهِ فَتَوَكَّلُوا إِنْ كُنْتُمْ مُؤْمِنِيْنَ﴾ [المائدة:٢٣]

ඔබලා විශ්වාසීන් ලෙස සිටින්නේනම්, (සෑම කාර්යයන්ම) අල්ලාහ් වෙතම තවක්කුල් (භාර) කරන්න. *(අල්කුර්ආන්-5:23)*

තමාට හා අනෙකුත් මැවිල්ලයන්ට අල්ලාහ් ලබාදී ඇති දායාදයන් කෙරෙහි අවධානය යොමු කොට ඒවා තව තවත් තමාට ලැබිය යුතු බව අපේක්ෂා කළ යුතුයි. ඒ සඳහා පිරිසිදු චේතනාවෙන් අල්ලාහ්ට යටහත්ව කීකරුවී ප්‍රාර්තනා කළ යුතුයි. එසේම අලංකාරමත් වචනවලින් හා කුසල් ක්‍රියාවන් මගින් මහුගෙන් උපකාර පැතිය යුතුයි. මෙසේ කිරීම අල්ලාහ් කෙරෙහි හැසිරීමේ සාර ධර්මයක් ලෙස පවතී. මක්නිසාදයත්, කවරෙකුගේ භාගයයන් සෑම දේ පිරිවරා පවතින්නේද, මහු ගේ භාග්‍යයන් තව තවත් ලැබීමට අපේක්ෂා නොවීමද, කව රෙකුගේ උපකාර සෑම මැවිල්ලයන් කෙරෙහි පිරිවරා පවතින් නේද, මහුගේ උපකාර අවිශ්වාස කිරීමද කෙසේ ගුණදර්මයක් විය හැකිද ? අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَرَحْمَتِي وَسِعَتْ كُلَّ شَيْءٍ﴾ [الأعراف:١٥٦]

මාගේ භාග්‍යයන් සෑම දේ කෙරෙහි පිරිවරා පවතින්නේය.
*(අල්කුර්ආන් -7:156)*

﴿وَلاَ تَقْنَطُوْا مِنْ رَوْحِ اللهِ﴾ [النحل:٨٧]

අල්ලාහ්ගේ භාග්‍යයන් කෙරෙහි අපේක්ෂා නොකරමින් නොසිටින්න. *(අල්කුර්ආන් -12:87)*

අල්ලාහ්ගේ ඇතිත්ත ඉතාමත් කෘර බවත්, ඔහු පලිගැනී මේ හැකියා ඇති බලවතා බවත් විශ්වාස කර ඔහුට විරුද්ධ කම් නොකර කීකරුවීම මගින් ඔහු කෙරෙහි බැතිසිතින් සිටිය යුතුයි. මෙය අල්ලාහ් කෙරෙහි ඔහුගේ හැසිරීමේ සත් ගුණාංගයෙකි. මක්නිසාදයත්, කිසියම් හැකියාවන් නොමැති අසරණ දාසයෙකු ශක්තිය හා හැකියාවන් ඇති බලවතාවූ දෙවියාට විරුද්ධකම් කිරීම හා අපරාධ කිරීම සාර ධර්මයක් විය හැකිද ? අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَإِذَا أَرَادَ اللهُ بِقَوْمٍ سُوْءًا فَلاَ مَرَدَّ لَهُ ، وَمَا لَهُمْ مِنْ دُوْنِهِ مِنْ وَالٍ﴾

[الرعد:١١]

අල්ලාහ් එක් සමාජයක් කෙරෙහි අයහපතක් අදහස් කලේ නම්, එය වළක්වන්නෙකු ඔහු හැර අන් කිසිවෙකු නොමැත. තවද, ඔවුන්ට ඔහු හැර උපකාර කරන්නෙකුද නොමැත.
*(අල්කුර්ආන් -13:11)*

﴿إِنَّ بَطْشَ رَبِّكَ لَشَدِيْدٌ﴾ [الطارق:١٢]

සැබැවින්ම. ඔබ දෙවියාගේ ඇතිත්ත කෘරයෙන් පවතී.
*(අල්කුර්ආන් -85:12)*

මුස්ලිම්වරුන් අල්ලාහ්ට කීකරුවී ඔහුගේ ෂරීආත් හෙවත් අණපණත් අනුගමනය කරන කළ, තම පොරොන්දුව ඔහුට ලැබූ බවත්, ඔහුගේ තෘප්තිය නම්වූ ඇඳුම ඔහුට පැළඳූ බවත් අල්ලාහ් සිතන පරිදි, එම මුස්ලිම්වරයා අල්ලාහ්ට විරුද්ධකම් කරන කළ හා ඔහුට කීකරුවීමෙන් වැළකී සිටින කළ, අල් ලාහ්ගේ අවවාදය ඔහුගෙන් තමාට පහළවූ බව ඔහු සිතාගත යුතුයි. මෙය අල්ලාහ් කෙරෙහි ඔහුගේ යහපත් ආකල්පයක් බවට පත්වේ. එසේ නොමැතිව, අල්ලාහ් කෙරෙහි යහපත් ආකල්පයක් ඇති නොකර, ඔහුට විරුද්ධකම් කිරීම, ඔහුට කීකරු නොවීම හා ඔහු තමාව රැකබලා සිටින්නෙකු හෝ කරන පාපයන් සඳහා දඬුවම් කරන්නෙකු හෝ නොවන බව සිතීම සාරධර්ම නොවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَلَكِنْ ظَنَنْتُمْ أَنَّ اللهَ لاَيَعْلَمُ كَثِيْرًا مِمَّا تَعْمَلُوْنَ ، وَذَٰلِكُمْ ظَنُّكُمُ الَّذِيْ
ظَنَنْتُمْ بِرَبِّكُمْ أَرْدَاكُمْ فَأَصْبَحْتُمْ مِنَ الْخَاسِرِيْنَ﴾ [حم سجدة :٢٢،٢٣]

නමුත්, ඔබලා කරන අධික ක්‍රියාවන් අල්ලාහ්ද නොදැන සිටින බව ඔබලා සිතමින් සිටින්නෝය. ඔබලාගේ දෙවියා කෙරෙහි ඔබලා දරන මෙවන් ආකල්පය ඔබලාව විනාශයෙහි හිඳා බැසීය. එබැවින්, ඔබලා අලාභකරුවන් සේ පත්වූහ.

*(අල්කුර්ආන් - 41:22,23)*

එසේම, මුස්ලිම්වරුන් අල්ලාහ් කෙරෙහි බැතිසිතින් ඔහුට කීකරුවී සිටිමින්, ඔහුගේ කුසල් ක්‍රියාවන්ට අල්ලාහ් කුලිය ලබා නොදෙන බවත් තමාගේ වන්දනාමානයන් හා කීකරුවීම ඔහු පිළි නොගන බවත් විශ්වාස කළද, එය ඔහු අල්ලාහ් හා කෙරෙහි ගුණධර්මයක් නොවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَنْ يُطِعِ اللّٰهَ وَرَسُوْلَهُ وَيَخْشَ اللّٰهَ وَيَتَّقْهِ فَأُولَئِكَ هُمُ الْفَائِزُوْنَ﴾ [النور: ٥٢]

කවරෙකු අල්ලාහ්ට හා ඔහුගේ දූතවරයාට කීකරුවී, අල්ලාහ් කෙරෙහි බියබැතිකමින් (සිට ඔහුට විරුද්ධකම් කිරීමෙන් වැළකී) සිටින්නේද, විජයග්‍රාහිකයින් හෙතම ඔවුන්මයවේ.
(අල්කුර්ආන්-52)

කෙටියෙන් කියතොත්නම්, මුස්ලිම්වරයා තමාට දායාදයන් පිරිනැමූ දෙවියාට තුති පුද කිරීමද, ඔහුට විරුද්ධකම් කිරීමට වෙහෙස දරන කළ ලැජ්ජාවීමද, ඔහු කරා සත්‍යභාවයෙන් යොමුවීමද, ඔහු වෙතම විශ්වාසය තැබීමද, ඔහුගේ භාග්‍යයන් අපේක්ෂා කරන අතරම ඔහුගේ දඬුවම් කෙරෙහිද බියවීමද, ඔහු සිය පොරොන්දුව ඉටු කරන බවත්, ඔහු තමා කැමැති අයට තමා අවවාද කළ පරිදි දඬුවම් පිරිනමන බවත් ඔහු කෙරෙහි යහපත් ආකල්පයක් පැවැත්වීමද අල්ලාහ් කෙරෙහි පවත්වන ගුණධර්මයකි. ඔහු මේවා කුමන ආකාරයෙන් හා කුමන ප්‍රමාණයෙන් අනුගමනය කරන්නේද, ඒ අනුව ඔහුගේ තරාතිරම හා ගෞරවය උසස්වේ.

# අල්ලාහ්ගේ වැකි කෙරෙහි සාරධර්ම

අල්ලාහ්ගේ වැකි පරිශුද්ධවූ එකක් බවද, වෙනත් වචන හා වැකිවලට වඩා උතුම් හා ශ්‍රේෂ්ඨ බවද, අල්කුර්ආනය යනු එවන් හැඳින්වෙන්නේ අල්ලාහ්ගේ වැකි බවද විශ්වාස වන්තයකු විශ්වාසය කළ යුතුයි. කවරෙකු අල්කුර්ආනය පවසන්නේද, ඔහු සත්‍යයම පවසන්නාය. එමගින් විනිශ්චය කරන්නා යුක්ති සහගතව විනිශ්චය කරන්නාය. එයට ගිවිකරුවන් අල්ලාහ්ටම

අයත් හිමිකරුවන්ය. එය පිළිපදිමින් අනුගමනය කරන්නන් විජයග්‍රාහිකයින්ය. එය ප්‍රතික්ෂේප කරන්නන් විනාශයට හා අලාභයට පත්වන්නන්ය. අල්කුර්ආනය ගැන නබි මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[اقْرَأُوا الْقُرْآنَ فَإِنَّهُ يَأْتِي يَوْمَ الْقِيَامَةِ شَفِيعًا لِصَاحِبِهِ] (رواه مسلم)

'අල්කුර්ආනය පාරායනා කරන්න. නිසැකව, එය පරලොව දිනයෙහි මහුට නිර්දේශ (රෙකමදාරු) කරන්නා සේ පැමිණේ' යනුවෙන් අබූ උමාමා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

[أَهْلُ الْقُرْآنِ هُمْ أَهْلُ اللهِ وَخَاصَّتُهُ] (رواه النسائي)

'අල්කුර්ආනය පිළිපදිමින් සිය ජීවිතය ගතකරන්නන් අල්ලාහ්ටම අයත් හිමිකරුවන්ය' යනුවෙන් අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. *(නසාඉ ග්‍රන්ථය ඇසුරෙනි)*

[إِنَّ الْقُلُوْبَ لَتَصْدَأُ كَمَا يَصْدَأُ الْحَدِيْدُ، فَقِيْلَ يَارَسُوْلَ اللهِ وَمَا جِلاَؤُهَا ؟
فَقَالَ : تِلاَوَةُ الْقُرْآنِ، وَذِكْرُ الْمَوْتِ] (رواه البيهقي)

'සැබැවින්ම, යකඩ මළකඩ බඳින සේම සිත්සතන්ද මළ කඩ බඳින්නේය' යනුවෙන් නබි නායක මුහම්මදු (සල්) තුමා පැවැසූ කළ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, එය ඉවත් කරන්නේ කෙසේද ?' යනුවෙන් (සහාබාවරුන්) විමසූහ. එකළ එතුමා 'එය අල්කුර්ආනය පාරායනා කිරීම හා මරණය සිහි කිරීම මගින්ය' යනුවෙන් පැවැසූවාය. මෙය අබූ උමාමා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බෛහකී ග්‍රන්ථය ඇසුරෙනි)*

එබැවින්, සෑම මුස්ලිම්වරුන්ම අල්කුර්ආනය කුමන දෙය හලාල් ලෙස අනුමත කර ඇත්තේද, එය හලාල් බවත්, කුමන දෙය හරාම් ලෙස තහනම්කර ඇත්තේද, එය හරාම් බවත් පිළිගත යුතුයි. එසේම, අල්කුර්ආනය වටහා දෙන සාරධර්ම යන් තීකරුවෙන් පිළිපැදිය යුතු අතර, එහි අන්තර්ගතවී ඇති ගුණධර්මයන් තමාගේ ගුණාංගයන් ලෙසට පරිවර්තනය කළ යුතුයි. එසේම, අල්කුර්ආනය පාරායනා කරන .කළ පහත සඳහන් පිළිවෙත් අනුගමනය කළ යුතුයි.

1-වුළු හෙවත් දෝවනය කර, කිබ්ලා (මක්කාවේ කඃබා) දෙසට අභිමුඛව සිට අවංකව හා ගරුත්වයෙන් අසුන්ගෙන පාරායනා කිරීම.

2-හදිසි නොවී කලබල රහිතව හා කල්පනාකාරීව පාරායනා කිරීම. දින තුනකට වඩා අඩු කාලයෙහි අල්කුර්ආනය සම්පූර්ණයෙන් පාරායනා නොකිරීම. මක්නිසාදයත්, නබි මුහම්මදු (සල්) තුමා 'කවරෙකු දින තුනකට වඩා අඩු කාල යෙහි අල්කුර්ආනය සම්පූර්ණයෙන් පාරායනා කර අවසන් කරන්නේද, ඔහු අල්කුර්ආනය වටහා නොගනී' යනුවෙන් පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන නබි වදනක් තිර්මිදි හා නසාඉ ග්‍රන්ථවල සටහන්ව පවතී.

3-පාරායනා කරන කළ බියබැතිකම අනුගමනය කිරීම.

4-අලංකාරමත් මිහිරි නාදයෙන් පාරායනා කිරීම. මක්නිසාද යත්, නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබලාගේ මිහිරි නාද යෙන් අල් කුර්ආනය අලංකාරමත් කරන්න. යනුවෙන් පැවැසූ බව අල්බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා වාර්තා කරන නබි වදනක් අහ්මද් හා ඉබ්නු මාජා ග්‍රන්ථවල සඳහන්වේ.

5-තමාට මුතිච්චාව ඇතිවේ දැයි හෝ සලාතය ඉටු කරන්නන්ට බාධාවන් සිදුවේ යැයි හෝ බියට පත් වන්නේනම්, ශබ්ද නොකර සැනසීමෙන් පාරායනා කිරීම.

6-එහි තේරුම් හා අන්තර්ගතව ඇති කරුණු වටහා ගෙන සිත්සතනින් ආකර්ශණය වන පරිදි සිත මෙල්ලකර පාරායනා කිරීම.

7-අල්කුර්ආනය පාරායනා කරන කළ නොසැළකිලිමත්ව හෝ ප්‍රතික්ෂේප කරමින් හෝ නොසිටිය යුතුයි. මක්නිසාදයත්, එය සමහර විට තමා විසින්ම තමාව ශාප කිරීමට හේතු විය හැක. මෙයට අල්කුර්ආනයේ පහත සඳහන් වැනි උදාහරණවේ.

. 'අසත්‍යකරුවන්ට අල්ලාහ්ගේ ශාපය පහළ වේවා යනුවෙන් අපි ප්‍රාර්තනා කරමු' (3:61)

'අපරාධකරුවන්ට අල්ලාහ්ගේ ශාපය පහළ වේවා' (11:18)

මෙවන් වැනි පාරායනා කරන ඔහු අසත්‍යකරුවෙකු ලෙස හෝ අපරාධකරුවෙකු ලෙස හෝ සිටින කළ ඔහු ඔහුටම ශාප කරන්නෙකු වන්නේය.

8-එනිසා, කුර්ආනයෙහි අන්තර්ගතව ඇති අනුශාසනා හා අවවාද මත සිය ජීවිතය සකසා ගැනීමට උනන්දුවිය යුතුයි.

මෙවන් අය හෙතම අල්ලාහ්ටම අයත් තැනැත්තන්ය.

# නබිතුමා කෙරෙහි සාරධර්ම

පහත සඳහන් හේතූන් මත නබිනායක මුහම්මදු (සල්) තුමා කෙරෙහි පරිපූර්ණ සාරධර්මයෙන් හැසිරීම තමාට අනිවාර්ය බව මුස්ලිම්වරයා දැන සිටිය යුතුයි.

1-මෙවන් සාරධර්මයන් අල්ලාහ් විසින්ම මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන්ට අනිවාර්යවීම. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوْا لاَتُقَدِّمُوْا بَيْنَ يَدَيِ اللهِ وَرَسُوْلِه﴾ [الحجرات:١]

විශ්වාස වන්තයිනි, අල්ලාහ් හා ඔහුගේ දූතයා ඉදිරියේ අභිබවා නොයන්න. *(අල්කුර්ආන්-49-1)*

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوْا لاَتَرْفَعُوْا أَصْوَاتَكُمْ فَوْقَ صَوْتِ النَّبِيِّ وَلاَتَجْهَرُوْا لَهُ بِالْقَوْلِ كَجَهْرِ بَعْضِكُمْ لِبَعْضٍ أَنْ تَحْبَطَ أَعْمَالُكُمْ وَأَنْتُمْ لاَتَشْعُرُوْنَ﴾

[الحجرات:٢]

විශ්වාස වන්තයිනි, නබිතුමාගේ කටහඬට වඩා ඔබලාගේ කටහඬ නාද නොකරන්න. ඔබලා අතර කෙනෙකු අනෙකා සමග ඝෝෂාකර කතාබහක යෙදෙන සේ නබිතුමා සමග ඝෝෂාකර කතා බහක නොයෙදෙන්න. (එසේ කළානම්) ඔබලා නොදැන ආකාරයට ඔබලාගේ කුසල් ක්‍රියාවන් විනාශවෙ. *(අල්කුර්ආන්-49-2)*

2-එතුමාට කීකරුවීම හා එතුමාව ප්‍රිය කිරීම විශ්වාසීන්ට අල්ලාහ් විසින්ම අනිවාර්ය කිරීම.

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوْا أَطِيْعُوا اللهَ وَأَطِيْعُوا الرَّسُوْلَ﴾ [محمد:٣٣]

විශ්වාසවන්තයිනි, අල්ලාහ්ට හා ඔහුගේ දූතවරයාට කීකරු වන්න. *(අල්කුර්ආන්-47:33)*

﴿وَمَا آتَاكُمُ الرَّسُوْلُ فَخُذُوْهُ وَمَا نَهَاكُمْ عَنْهُ فَانْتَهُوْا﴾ [الحشر:٧]

ඔබලාගේ දූතයා ඔබලාට ලබා (අණ) දෙන දේ පිළිපදින්න. එතුමා වළක්වන දේයින් වැළකින්න. *(අල්කුර්ආන්-59:7)*

﴿قُلْ إِنْ كُنْتُمْ تُحِبُّوْنَ اللهَ فَاتَّبِعُوْنِي يُحْبِبْكُمُ اللهُ وَيَغْفِرْ لَكُمْ ذُنُوْبَكُمْ﴾

[آل عمران: ٣١]

(නබිතුමනි,) 'ඔබලා අල්ලාහ්ව ප්‍රිය කරමින් සිටින්නෙහුනම්, මාව පිළිපදින්න. අල්ලාහ් ඔබලාව ප්‍රිය කරයි. ඔබලාගේ පාපයන් කෙරෙහි සමාව ලබා දෙයි' යනුවෙන් (මබ මිනිසුන්ට) පවසන්න. *(අල්කුර්ආන්-3:31)*

[لاَيُؤْمِنُ أَحَدُكُمْ حَتَّى أَكُوْنَ أَحَبَّ إِلَيْهِ مِنْ وَالِدِهِ وَوَلَدِهِ وَالنَّاسِ أَجْمَعِيْنَ] (رواه البخاري)

තම පියා, දරුවා හා අන් සෑම දෙනාට වඩා මාව ප්‍රිය කරන තෙක් ඔබලාගෙන් කවරෙකු හෝ විශ්වාස වන්තයා විය නොහැක. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

එබැවින්, එතුමා කෙරෙහි සාරධර්මය මෙසේ මෙවන් ආකාරයෙහි පැවැතිය යුතුයි.

1-ආගමික හා ලෞකික කාර්ය සැමහි එතුමාට කීකරුවී එතුමාගේ මගපෙන්වීම පිළිපැදීම.

2-එතුමාට දැක්වන ප්‍රිය, ගෞරවය හා අවංකභාවයට වඩා අන් කිසි මැවිල්ලයන්ට දැක්වන ප්‍රිය, ගෞරවය හා අවංකභාවයට ප්‍රමුඛතාවය නොදීම.

3-එතුමා ප්‍රිය කරන්නන් ප්‍රිය කිරීම, එතුමා අප්‍රිය කරන්නන් අප්‍රිය කිරීම, එතුමා තෘප්තිවන දේ කෙරෙහි තෘප්තිවීම හා එතුමා තෘප්ති නොවන දේ කෙරෙහි තෘප්ති නොවීම.

4-එතුමාව ගරු කිරීම වස් එතුමාට සලවාත් (අල්ලාහ්ගේ ආදරය හා කරුණාව මහුට ලැබෙනු මැනවි යනුවෙන්) කීම.

5-එතුමා (අල්ලාහ්ගෙන්) ලබා දුන් ආගමික හා ලෞකික පණිවිඩ සහ මෙලෝ හා පරලෝ ජීවිතය පිළිබඳ සැඟවුණු කරුණු කෙරෙහි මඟුව සත්‍යකර විශ්වාස කිරීම.
6-එතුමාගේ මඟපෙන්වීම පිළිපැදීම, එතුමා ගෙන ආ ධර්මය ප්‍රසිද්ධ කිරීම හා එතුමාගේ අනුශාසනා සහ අවවාද පිළි ගෙන අනුගමනය කිරීම.

# ආත්මභාවය කෙරෙහි සාරධර්ම

මුස්ලිම්වරයා තම මෙලෝ හා පරලෝ විමුක්තිය සිය ආත්මය පවිත්‍ර කිරීමෙන් හා ශීලාචාර කිරීමෙන් පවතින බව විශ්වාස කළ යුතුයි. මේ කෙරෙහි අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿قَدْ أَفْلَحَ مَنْ زَكَّاهَا وَقَدْ خَابَ مَنْ دَسَّاهَا﴾ [الشمس : ٩،١٠]

නිසැකයෙන්ම, කවරෙකු එය (ආත්මය) පවිත්‍ර කළේද, ඔහු ජයග්‍රහණය කළාය. නිසැකයෙන්ම, කවරෙකු එය (පාපයෙහි යොදවා) විනාශ කළේද, ඔහු පරාජය කළාය.

*(අල්කුර්ආන්-91:9,10)*

﴿وَالْعَصْرِ، إِنَّ الْإِنْسَانَ لَفِي خُسْرٍ، إِلاَّ الَّذِيْنَ آمَنُوْا وَعَمِلُوا الصَّالِحَاتِ
وَتَوَاصَوْا بِالْحَقِّ وَتَوَاصَوْا بِالصَّبْرِ﴾ [العصر: ١-٣]

කාලය මත දිවුරා කියමි. නිසැකයෙන්ම, මිනිසා අලාභයෙහි සිටිති. නමුත්, ඔවුන් අතර කවරෙකු විශ්වාසකර, කුසල් ක්‍රියාවන්හි යෙදී සත්‍යභාවයෙන් පරස්පරව උපදෙස් කරමින් සිට (එයින් මුහුණපාන බාධාවන්) පරස්පරව ඉවසා සිටින්නේද ඔවුන් හැර.

*(අල්කුර්ආන්-103:1-3)*

නබිනායක මුහම්මද් (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[كُلُّ أُمَّتِيْ يَدْخُلُوْنَ الْجَنَّةَ إلاَّ مَنْ أَبَى، قِيْلَ : وَمَنْ يَأْبَى يَارَسُوْلَ الله ؟ قَالَ : مَنْ أَطَاعَنِيْ دَخَلَ الْجَنَّةَ، وَمَنْ عَصَانِيْ فَقَدْ أَبَى] ((رواه البخاري))

'ප්‍රතික්ෂේප කරන්නන් හැර මාගේ සමාජයේ අන් සැම දෙනා ස්වර්ගයෙහි පිවිසෙති' යනුවෙන් නබිතුමා පැවැසූවිට 'ප්‍රතික්ෂේප කරන්නන් කවරෙකුද ?' යනුවෙන් එතුමාගෙන් විමසූහ. එකල එතුමා 'මාහට කීකරුවන්නන් ස්වර්ගයෙහි පිවිසෙති. මාහට විරුද්ධකම් කරන්නන් ප්‍රතික්ෂේප කරන්නන්ය' යනුවෙන් පැවැසීය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නියත වශයෙන්ම, ආත්මය පවිත්‍ර කිරීම හා ශීලාචාර කිරීම හෙතම එය රමාන් හෙවත් විශ්වාසභාවය වන සේම ආත්මය කළංක කිරීම හා විනාශ කිරීම හෙතම එය දේව ප්‍රතික්ෂේපය හා පාපයන්ය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿أَقِمِ الصَّلاَةَ طَرَفَيِ النَّهَارِ وَزُلَفًا مِنَ اللَّيْلِ إِنَّ الْحَسَنَاتِ يُذْهِبْنَ السَّيِّئَاتِ﴾ [هود: ١١٤]

මබලා දහවල්හි (උදේ හා සවස යන) කෙළවර දෙකෙහිද, රාත්‍රියෙහි කොටසෙහිද සලාතය ඉටු කරන්න. නිසැකයෙන්ම, කුසල් ක්‍රියාවන් අකුසල ඉවත්කර දමයි. *(අල්කුර්ආන්-11:114)*

﴿كَلاَّ، بَلْ رَانَ عَلَى قُلُوْبِهِمْ مَاكَانُوْا يَكْسِبُوْنَ﴾ [المطففين: ١٤]

එසේ නොව, මවුන් උපයා ගත් (අකුසල් ක්‍රියාවන්) මවුන්ගේ සිත්සතන්තුල මළකඩ සේ බැඳී ඇත. *(අල්කුර්ආන්-82:14)*

එහෙයින්, මුස්ලිම්වරයා සැම විටම තම ආත්මය පවිත්‍ර කිරීමෙහි හා ශීලාචාර කිරීමෙහි යෙදී සිටිය යුතු අතර, කුසල් කිරීමට හා අකුසලින් වැළකී සිටීමට රෑ හා දහවල් නොතකා ආත්මය සමග සටන් කළ යුතුයි. එසේම සැම විටම ආත්මය සමග ස්ව පරීක්‍ෂා කර කුසල් ක්‍රියාවන් කිරීමට උනන්දු කළ යුතු අතර, අකුසල් කිරීමෙන් හා නොමග යාමෙන් ආත්මය වළක්වා වන්දනාමානයන් කිරීම කරා යොමු කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් මාර්ග අනුගමනය කළ යුතුයි.

# 1-පාපොච්චාරනය කිරීම

පාපොච්චාරණය කිරීම යනුවෙන් හැඳින්වන්නේ, සැම පාප යෙන් හා අකුසල් ක්‍රියාවෙන් ඉවත්වී පෙර සිදුවූ පාපයන් කෙරෙහි කම්පනයවී ඉදිරියේදී මෙවන් කිසිදු පාප ක්‍රියාවන් කෙරෙහි නොයෙදන බව ස්ථිර කර සිටීමවේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوْا تُوْبُوا إِلَى اللهِ تَوْبَةً نَّصُوْحًا، عَسَى رَبُّكُمْ أَنْ يُّكَفِّرَ عَنْكُمْ سَيِّئَاتِكُمْ، وَيُدْخِلَكُمْ جَنَّاتٍ تَجْرِيْ مِنْ تَحْتِهَا الْأَنْهَارُ﴾ [التحريم:٨]

විශ්වාස වන්තයිනි, අල්ලාහ්ගෙන් නිශ්කලංක (සිතෙන්) පාපොච්චාරණය කරන්න. ඔබලාගේ දෙවියා ඔබලාගේ පාපයන් ඔබලාගෙන් ඉවත් කොට ඔබලාව ස්වර්ග උයන්හි ප්‍රවේශ කර වයි. එහි පහළෙහි (විවිධ) ගංගාවන් දිවීමින් පවතී.

*(අල්කුර්ආන්-66:8)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ මූසා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إِنَّ اللهَ يَبْسُطُ يَدَهُ بِاللَّيْلِ لِيَتُوْبَ مُسِيْءُ النَّهَارِ، وَيَبْسُطُ يَدَهُ بِالنَّهَارِ لِيَتُوْبَ مُسِيْءُ اللَّيْلِ حَتَّى تَطْلُعَ الشَّمْسُ مِنْ مَغْرِبِهَا] (رواه مسلم)

සැබවින්ම, අල්ලාහ් දහවල්හි පාපයන් කළ අය පාපොච්චාරණය කිරීම සඳහා තම අත රාත්‍රියෙහිද, රාත්‍රියෙහි පාපයන් කළ අය පාපොච්චාරණය කිරීම සඳහා තම අත දහවල්හිද දික් කරයි. මෙසේ ඉර බටහිරෙන් උදාවන තෙක් සිදුවේ.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## 2-අල්ලාහ්ගේ අධීක්ෂණය

මුස්ලිම්වරයා තම ජීවිත කාලයෙහි සෑම තප්පරයක්ම අල්ලාහ් තමාව අධීක්ෂණය කරමින් සිටින බවත්, අල්ලාහ් තමා කරා අවධානය යොමුකර සිටින බවත්, තමාගේ රහස හා පරහස ඔහු දැන සිටින බවත් සත්‍යකර දැන සිටිය යුතුයි.

මෙමගින් ඔහුගේ ආත්මය, අල්ලාහ්ගේ අධීක්ෂණය සථිර කරමින්ද, ඔහුව සිහිකරන කළ ඔහු කරා ප්‍රිය හැඟවමින්ද, ඔහුට යටහත්වී කීකරුවන කළ කිසියම් සැපක් විඳිමින්ද, ඔහු හැර අන් සෑම දේ ප්‍රතික්ෂේප කරන කළ ඔහු කරා පමණක් යොමුවමින්ද පවතී. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَنْ أَحْسَنُ دِيْنًا مِّمَّنْ أَسْلَمَ وَجْهَهُ لِلّٰهِ وَهُوَ مُحْسِنٌ وَّاتَّبَعَ مِلَّةَ إِبْرَاهِيْمَ حَنِيْفًا﴾ [النساء:١٢٥]

තවද, කවරෙකු කුසල්හි යෙදී සිටින ස්ථාවරයෙහි සිට අල්ලාහ්ට පරිපූර්ණයෙන් කීකරුවී (නබි) ඉබ්රාහීම්ගේ පිරිසිදු

ධර්මයද අනුගමනය කරන්නේද, ඔහුට වඩා යහ ධර්මයෙහි සිටින්නා කවරෙකුද? *(අල්කුර්ආන්-4:125)*

﴿وَمَا تَكُوْنُ فِيْ شَأْنٍ وَّمَا تَتْلُوْا مِنْهُ مِنْ قُرْآنٍ وَّلاَ تَعْمَلُوْنَ مِنْ عَمَلٍ إِلاَّ كُنَّا عَلَيْكُمْ شُهُوْدًا إِذْ تُفِيْضُوْنَ فِيْهِ﴾ [يونس:٦١]

(නබිතුමනි) ඔබ කුමන ස්ථාවරයෙහි සිටියද, ඔබලා අල් කුර්ආනයෙන් කුමන කොටස පාරායනා කළද, (මිනිසුනි) ඔබලාද කුමන කාර්යන්හි යෙදී සිටියද ඔබලා එහි යෙදමින් සිටින කල අපි ඔබලා ගැන අවධානය යොමුකර සිටින්නෙමු. *(අල්කුර්ආන්-10:61)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أَنْ تَعْبُدَ اللهَ كَأَنَّكَ تَرَاهُ ، فَإِن لَّمْ تَكُنْ تَرَاهُ فَإِنَّهُ يَرَاكَ] (رواه مسلم)

ඔබ අල්ලාහ්ව දිටී සිටින සේ ඔහුට වන්දනාමානය කළ යුතුයි. ඔබ ඔහුව නොදිටියද, ඔහු ඔබව දිටිමින් සිටින්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## 3-ස්ව පරීක්ෂා කිරීම

මෙය මුස්ලිම්වරයා පරලොව දිනයෙහි තමාගේ විමුක්තිය සඳහාද, එහි ලැබෙන දායාදයන් හා අල්ලාහ්ගේ තෘප්තිය තකා තමාව සුදුස්සෙකු ලෙස පත්කර ගැනීම සඳහාද මෙලෝ ජීවිත යෙහි රෑ හා දහවල් නොතකා කුසල් ක්‍රියාවන්හි යෙදීමවේ.

එනම්. ඔහු තමාව වෙළෙන්දෙකු ලෙස උපමා කොට තමා වෙත අනිවාර්යව පවතින කාර්ය සිය වෙළඳාමෙහි මූලධනය

වශයෙන්ද, කාලීනව පවතින කාර්ය සිය වෙළඳාමෙහි මූලධන යට අමතරව ලැබෙන ලාභය වශයෙන්ද, තමාගෙන් සිදුවන පාපයන් හා කුසල් ක්‍රියාවන් සිය වෙළඳාමෙහි ඇතිවන අලා භය වශයෙන්ද සිතා ගත යුතුයි. පසුව තනිවම සිට එදින කළ ක්‍රියාවන් ගැන සිය සිත්සතනෙන් ස්ව පරීක්‍ෂා කළ යුතුයි.

අනිවාර්ය කරුණුවල කිසියම් අඩුපාඩු සිදුවී ඇත්නම්, ඒ සඳහා තමාටම නින්දා කොට වහාම එය සම්පූර්ණ කළ යුතුයි. එය නැවත ඉටුකළ යුතු කරුණක්නම්, එය නැවත ඉටුකළම යුතුයි. එය නැවත ඉටුකළ නොයුතුනම්, කාලීන (නෆ්ල්) කරුණු වැඩිවැඩියෙන් ඉටුකළ යුතුයි. කාලීන කරුණුවල අඩු පාඩු සිදුව ඇත්නම්, එවා නැවත ඉටුකර නිවැරදි කළ යුතුයි. හරාම් නම්වූ තහනම් කාර්යවල යෙදී මෙන් අලාභ සිදුව ඇත් නම්, ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් කණගාටුවී පාපොච්චාරණය කරමින් මඟු වෙන යොමුවිය යුතුයි. එසමග තමාගෙන් සිදුවූ පාපයන් වෙනුවෙන් එයට සමාන කුසල් ක්‍රියාවන්හි යෙදිය යුතුයි. මෙසේ කිරීම හෙතම ස්වපරීක්‍ෂා කිරීමවේ. මේ පිළි බඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوا اتَّقُوا اللهَ وَلْتَنْظُرْ نَفْسٌ مَا قَدَّمَتْ لِغَدٍ، وَاتَّقُوا اللهَ إِنَّ اللهَ خَبِيْرٌ بِمَا تَعْمَلُوْنَ﴾ [الحشر:١٨]

විශ්වාස වන්තයිනි, අල්ලාහ් කෙරෙහි බැතිසිතින් සිටින්න. එසේම, සෑම ආත්මයක්ම පරලොව දිනය වෙනුවෙන් කුමක් පිළියෙළ කරමින් සිටින්නේද, යනුවෙන් සිතා බලනු. අල්ලාහ් කෙරෙහි බැතිසිතින්ම සිටින්න. ඔබලා යෙදී සිටින සෑම ක්‍රියා වන් කෙරෙහිම අල්ලාහ් ඉතා දැන සිටී. *(අල්කුර්ආන්-59:18)*

උමර් බින් කත්තාබ් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[حَاسِبُوْا أَنْفُسَكُمْ قَبْلَ أَنْ تُحَاسَبُوْا] (رواه الترمذي)

ඔබලා විනිශ්චය සඳහා ලක්වීමට පෙර, ඔබලාම ඔබ ආත්මය විනිශ්චය කර ගන්න. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

# 4-සිත්සතන සමග සටන් කිරීම

මුස්ලිම්වරයා තම සතුරන් අතර ඉමහත් සතුරා තම සිත් සතන බව වටහා ගත යුතුයි. එය ස්වභාවයෙන්ම කුසල් ක්‍රියාවන් පිළිකුල්කරමින්ද, අකුසල් ක්‍රියාවන් උනන්දු කරමින්ද පවතී. එසේම, එය සැම විටම විවේකය හා සැප ප්‍රිය කරන අතර, තමාට බාධාවන් වුවද කාමයන් කෙරෙහි අධික ආශාවෙන්ද පවතී.

මේවා දැන සිටීමෙන් පසු මුස්ලිම්වරයා කුසල් ක්‍රියාවන්හි යෙදීම හා අකුසල් ක්‍රියාවෙන් ඈත්වීම සඳහා තම සිත්සතන සමග සටන් කළ යුතුයි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وَالَّذِيْنَ جَاهَدُوْا فِيْنَا لَنَهْدِيَنَّهُمْ سُبُلَنَا وَإِنَّ اللهَ لَمَعَ الْمُحْسِنِيْنَ﴾ [العنكبوت: ٦٩]

තවද, කවරෙකු අප මගෙහි (සිත්සතන් සමග) සටන් කරන්නේද, නිසැකයෙන්ම, ඔවුන්ව අපි අපගේ යහමගෙහි යොමු කරන්නෙමු. නිසැකයෙන්ම, අල්ලාහ් කුසල් ක්‍රියාවන්හි යෙදෙන්නන් සමග සිටී. *(අල්කුර්ආන්-29:69)*

මෙය හොඳම යහපත් ශීලීන්ගේද, විශ්වාස වන්තයින්ගේද හා සත්‍යවන්තයින්ගේද මාර්ගයෙකි.

නබි මුහම්මදු (සල්) තුමා රාත්‍රියෙහි තම ශ්‍රේෂ්ඨමත් දෙපා ඉදිමින තරමට සිටගෙන සලාතයෙහි නිරතවමින් සිටියේය. මේ පිළිබඳව එතුමාගේ විමසූකළ එතුමා 'මා තුතිමත් දාසයෙකු ලෙස සිටීමට කැමැති විය නොයුතුද?' යනුවෙන් පැවැසීය.
*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

# දෙමාපියන්ට කළයුතු කාර්ය

මුස්ලිම්වරයා තම දෙමාපියන්ට තමා කළ යුතු අනිවාර්ය කරුණු ඇති බවත්, මවුන් දෙදෙනා රැකබලා ගැනීම, මවුන්ට කීකරුවීම හා මවුන්ට උපකාර කිරීම අනිවාර්ය බවත් විශ්වාස කළ යුතුයි. මෙය මහු මෙලොවෙහි ජන්මවීමට මවුන් දෙදෙනා හේතුවීම සඳහා හෝ මවුන් දෙදෙනා මහුට කළ උපකාරයට ප්‍රති උපකාරයක් කිරීම සඳහා හෝ නොවේය. නමුදු මෙය කළ යුත්තේ අල්ලාහ්ම මවුන් දෙදෙනාට කීකරුවීම අනිවාර්ය කිරීම නිසාය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَقَضَى رَبُّكَ أَلاَّ تَعْبُدُوْا إِلاَّ إِيَّاهُ وَبِالْوَالِدَيْنِ إِحْسَانًا﴾ [بني إسرائيل:٢٣]

මහු හැර (අන්කිසියම් කෙනෙකුට) ඔබ වන්දනාමානය නොකළ යුතු බවත්, දෙමාපියන්ට උපකාර කළ යුතු බවත් ඔබ දෙවියා නියම කර ඇත. *(අල්කුර්ආන් - 17:23)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූබක්ර් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أَلاَ أَدُلُّكُمْ بِأَكْبَرِ الْكَبَائِرِ ؟ قَالُوْا بَلَى يَارَسُوْلَ اللهِ ، قَالَ اَلْإِشْرَاكُ بِاللهِ وَعُقُوْقُ الْوَالِدَيْنِ ...] (رواه بخاري ومسلم)

'පාපයන් අතර ඉමහත් පාපය කුමක් බව මා ඔබලාට දැනුම් දෙන්නෙහිද ?' යනුවෙන් නබිතුමා විමසූ කළ එතුමාගේ අනුගාමිකයින් 'දැනුම් දෙන්න' යනුවෙන් කීහ. එවිට එතුමා 'අල්ලාහ්ට සමාන කිරීම, දෙමාපියන්ට විරුද්ධකම් කිරීම...' යනුවෙන් පැවැසීය. *(බුහාරී හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

[سَأَلْتُ رَسُوْلَ الله ﷺ أَيُّ الأَعْمَال أَحَبُّ إِلَى الله ؟ ، قَالَ : اَلصَّلَاةُ عَلَى وَقْتِهَا، قُلْتُ: ثُمَّ أَيٌّ ؟ قَالَ : ثُمَّ بِرُّ الْوَالِدَيْنِ ، قُلْتُ: ثُمَّ أَيٌّ ؟ قَالَ : ثُمَّ الْجِهَادُ فِيْ سَبِيْلِ الله...] (رواه مسلم)

මා නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ට ඉතා මත් ප්‍රිය කාර්ය කුමක් බව විමසූවිට එතුමා 'සලාතය එකී නියි වේලාවට ඉටු කිරීම' බවද, පසුව කුමක් බව විමසූවිට එතුමා 'පසුව දෙමාපියන්ට උපකාර කිරීම' බවද, පසුව කුමක් බව විමසූවිට එතුමා 'පසුව අල්ලාහ්ගේ මාර්ගයෙහි සටන් කිරීම' බවද පැවැසීය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

පුද්ගලයෙකු නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ ජිහාද් (අල්ලාහ්ගේ මගෙහි සටන්) කිරීමට අවසරය පැතීය. එයට එතුමා 'ඔබගේ දෙමාපියන් ජීවතුන් අතර සිටින්නෙහි ද ?' යනුවෙන් විමසීය. එයට ඔහු 'ඔව්' බව කීවිට නබිතුමා 'ඔවුන් දෙදෙනාට උපකාර කිරීමෙහි ජිහාද් කරන්න' යනුවෙන් පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරයි.

*(බුහාරී හා මුස්ලිම් ඇසුරෙනි)*

මුස්ලිම්වරයා දෙමාපියන්ට තමා කළයුතු කාර්ය පිළිගෙන, අල්ලාහ්ට යටත්ව හා මහුගේ අණට කීකරුවී ඒවා සම්පූර්ණ යෙන් ඉටුකිරීම වස් ඔවුන් කෙරෙහි පහත සඳහන් සාරධර්ම යන් පිළිපැදිය යුතුයි.

1-අල්ලාහ්ට විරුද්ධකම් නොකරන හා මහුගේ ෂරීඅත් ධර්ම යට පටහැනිවීමෙන් තොරව දෙමාපියන්ගේ අනුශාසනා හා අවවාද කෙරෙහි කීකරුවීම. මන්දයත්, මැවූ දෙවියාට විරුද්ධවීමේ කාර්යයන්හි කිසියම් මැවිලිවලට කීකරුවීම තහනම්ය. මේ බව අල්ලාහ් 'නමුත්, ඔබ කුමක් පිළිබඳ දැනුම (සාධක) නොලැබ සිටින්නේද, ඒ කෙරෙහි මාහට සමාන කරන ලෙස ඔවුන් දෙදෙනා (දෙමාපියන්) ඔබට බල කළද, එවිට ඔවුන් දෙදෙනාට (කිසිවිටක හෝ) ඔබ කීකරු නොවන්න. නමුත්, මෙලෝ ජීවිතය පිළිබඳ කරුණුවල ඔබ ඔවුන් දෙදෙනා සමග යහපත් භාවයෙන් හැසිරෙන්න' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-31:15)*

නබි මුහම්මදු (සල්) තුමා 'මැවූ තැනැත්තාට පටහැනි කාර් යවල කිසියම් මැවිලිවලට කීකරුවිය නොයුතුයි' යනුවෙන් පවසන්නේය. *(අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

2-ඔවුන් ගරු කිරීම, ඔවුන් සමග සාරධර්මයෙන් හැසිරීම, ඔවුන්ව සිනිඳුකමින් හා කරුණාවෙන් ආශ්‍රය කිරීම, කියම නින් හා ක්‍රියාවෙන් අවංකව හැසිරීම, ඔවුන්ගේ කටහඬට වඩා තමාගේ කටහඬ උස් නොකිරීම, ඔවුන් ඉදිරියෙහි නොඇවිදීම, ඔවුන්ට වඩා තම බිරිඳට හෝ දරුවන්ට ප්‍රමුඛ තාවය නොදීම හා ඔවුන්ගේ අවසරයෙන් හෝ තෘප්තියෙන් තොරව ගමන් බිමන්හි නොයෙදීම.

3-ඔවුන්ට ආහාර පානයන් හා ඇඳුම් පැළඳුම් සැපයීම, ඔවුන් රෝගාතුරුව සිටින කළ ප්‍රතිකාර කිරීම, ඔවුන්ට දුක් පීඩා වන් නොලක්වන සේ රැකබලා ගැනීම හා ඔවුන් වෙනුවෙන් තමාව පරිත්‍යාග කිරීම වැනි තමාගේ හැකියාව මත උදව් උපකාර කිරීම.

4-ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා හා පාපොච්චාරණය කිරීම හා ඔවුන්ගේ මිත්‍රයන් ගරු කිරීම.

# දරුවන්ට කළයුතු කාර්ය

මුස්ලිම්වරයා තම දරුවන්ට තමා කළයුතු කාර්යයන් කීප යක් ඇති බව පිළිගත යුතුයි. මෙය යහපත්ශීල දරු පරම්පරා වක් බිහිකිරීමේ චේතනාවෙන් ඔවුන්ගේ මව තෝරා ගැනීමෙන් සිට ඔවුන්ට අලංකාරමත් නම් කිරීම, සත්වන දින අකීකා නම්වූ කැපීම් කිරීම, චර්මඡේදනය කිරීම, ඔවුන්ට ආදරය දැක්වීම, ඔවුන් සමග සිනිඳුකමින් හැසිරීම, ඔවුන් වෙනුවෙන් වියදම් කිරීම, ඔවුන් යහපත් සාරධර්මයෙහි පුහුණු කිරීම, ඔවුන් ගේ සිත්සතන් පදම් කිරීම හා ශීලාචාර කිරීම, ඔවුන්ට ආගමික දැනුම්ඥානය ලබාදීම, අනිවාර්ය (ෆර්ලු) කරුණු, කාලීන (සුන්නත්) කරුණු හා ඉස්ලාමීය සාරධර්මයන් වටහා ගෙන අනුගමනය කිරීම කෙරෙහි පුහුණු කිරීම දක්වා පවතී.

මේවා සියල්ල පියෙකු තම දරුවන් විවාහවන තෙක් කළ යුතු අනිවාර්ය කාර්යයන්ය. ඔවුන් විවාහවීමෙන් පසු ඔවුන්ගේ සිය මතය පරිදි කටයුතු කිරීම සඳහා නිදහසේ ඇරිය යුතුයි. ඔවුන් සිය කැමැත්ත පරිදි පියාගේ යටතේ හෝ පෞද්ගලිකව වෙන්වී තනිවම හෝ ජීවත්විය හැක. මෙයට පහත සඳහන්

අල්ලාහ්ගේ වැකි හා නබි වදන් සාධකවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَالْوَالِدَاتُ يُرْضِعْنَ أَوْلاَدَهُنَّ حَوْلَيْنِ كَامِلَيْنِ لِمَنْ أَرَادَ أَنْ يُتِمَّ الرَّضَاعَةَ وَعَلَى الْمَوْلُوْدِ لَهُ رِزْقُهُنَّ وَكِسْوَتُهُنَّ بِالْمَعْرُوفِ﴾ [البقرة:٢٣٣]

(දික්කසාදවූ බිරියන් තම) දරුවන්ට සම්පූර්ණයෙන්ම තනකිරි දිය යුතු බව (පියවරුන්) අදහස් කරන්නේනම්, මව්වරුන් තම දරුවන්ට පරිපූරණ දෙවසරක් තනකිරි දිය යුතුයි. (මෙසේ) තනකිරි දෙන මව්වරුන්ට (ආගමික නීතිරීති අනුව) පිළියෙලට ආහාරපාන හා ඇඳුම් පැළඳුම් සැපයීම දරුවන්ගේ පියවරුන්ට අනිවාර්යවේ. *(අල්කුර්ආන්-2:233)*

﴿يَا أَيُّهَا الَّذِيْنَ آمَنُوْا قُوْا أَنْفُسَكُمْ وَأَهْلِيْكُمْ نَارًا وَّقُوْدُهَا النَّاسُ وَالْحِجَارَةُ﴾ [التحريم:٦]

විශ්වාස වන්තයිනි, මිනිසුන් හා ගල් දවන ද්‍රව්‍යවූ එම නිරයෙහි ගින්නෙන් ඔබලාවද ඔබලාගේ (බිරිඳ හා දරුවන් ඇතුළු) පවුලේ ඥාතීන්ද රැක ගන්න. *(අල්කුර්ආන්-66:6)*

﴿وَلاَ تَقْتُلُوْا أَوْلاَدَكُمْ خَشْيَةَ إِمْلاَقٍ ، نَحْنُ نَرْزُقُهُمْ وَإِيَّاكُمْ﴾ [الإسراء:٣١]

දිළිඳුකමට බියවී ඔබලාගේ දරුවන් ඝාතනය නොකරන්න. අපිම ඔවුන්ට හා ඔබලාට ආහාර පානයන් සපයන්නෙමු. *(අල්කුර්ආන්-17:31)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව සමුරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[اَلْغُلاَمُ مُرْتَهِنٌ بِعَقِيْقَةٍ تُذْبَحُ عَنْهُ يَوْمَ السَّابِعِ ، وَيُسَمَّى فِيْهِ وَيُحْلَقُ رَأْسُهُ]

(رواه الترمذي وابن ماجه)

දරුවෙකු අකීකාව (සතෙක් කපා පිං කිරීම)ට වගකිව යුත් නාය. ඔහු වෙනුවෙන් සත්වන දින අකීකා දීම, ඔහුට නමක් තැබීම හා ඔහුගේ හිස බූගැසීම යනාදීන් කළ යුතුයි.

*(තිර්මිදි හා ඉබ්නු මාජා ග්‍රන්ථ ඇසුරෙනි)*

නබිනායක (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[سَاوُوْا بَيْنَ أَوْلاَدِكُمْ فِي الْعَطِيَّةِ] (رواه البيهقي والطبراني)

ඔබලාගේ දරුවන්ට තෑගිබෝග පිරිනමන කළ ඔවුන් අතර සමානව හැසිරෙන්න.

*(බයිහකී හා තබරානි ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[مُرُوْا أَوْلاَدَكُمْ بِالصَّلاَةِ وَهُمْ أَبْنَاءُ سَبْعِ سِنِيْنَ وَاضْرِبُوْهُمْ عَلَيْهَا وَهُمْ أَبْنَاءُ عَشْرِ سِنِيْنَ وَفَرِّقُوْا بَيْنَهُمْ فِي الْمَضَاجِعِ] (رواه أبوداود والطبراني)

ඔබලාගේ දරුවන් සත්වන වියට පත්වූ කළ සලාතය ඉටු කරන මෙන් අණ කරන්න. ඔවුන් දසවන වියට පත්වූ කළ (එය ඉටු නොකළේනම්) ඔවුන්ට ගසන්න. තවද යහනයෙන් ඔවුන්ව වෙන්කරන්න.

*(අබූදාවූද්, තබරානි ග්‍රන්ථ ඇසුරෙනි)*

# සහෝදරයන් කෙරෙහි සාරධර්ම

මුස්ලිම්වරයා තම පියවරුන් හා දරුවන් කෙරෙහි හැසි රෙන සාරධර්මයන් සේම තම සහෝදරයන් සමගද හැසිරිය යුතුයි. මෙහි සැම දෙනා සමාන වන්නයින්ය. එනිසා, තම පිය වරුන් සමග හැසිරෙන සේම, බාල සහෝදරයන් තම වැඩි මහල් සහෝදරයන් සමග හැසිරිය යුතුයි. එසේම, වැඩිමහල් සහෝදරයන් තම බාල සහොදරයන් සමග පියවරුන් තම දරුවන් සමග හැසිරෙන සේ හැසිරිය යුතුයි. ඒවා ඔවුන්ට කළ යුතු අනිවාර්ය කරුණු, ඔවුන්ට ලබාදිය යුතු අයිතිවාසිකම් හා ඔවුන් සමග හැසිරෙන සාරධර්ම යනාදීන්ය.

නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබේ මව, පසුව ඔබේ පියා, පසුව ඔබේ සහෝදරිය, පසුව ඔබේ සහෝදරයා සමගද පසුව එසේ පහලට එන ඔබේ ඥාතීන් සමගද ඔබ යහපත් ශීල යෙන් හැසිරෙන්න' යනුවෙන් පැවසුවාය.

*(බස්සාර් හා තෛලම් ග්‍රන්ථ ඇසුරෙනි)*

# සැමියා හා බිරිඳ කෙරෙහි සාරධර්ම

සැමියා හා බිරිඳ අතර පරස්පර සාරධර්මයන් ඇති බව මුස්ලිම්වරයා පිළිගත යුතුයි. ඒවා ඔවුන් දෙදෙනා පරස්පරව ඉටුකළ යුතු වගකීම් හා අයිතිවාසිකම්ය. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَلَهُنَّ مِثْلُ الَّذِيْ عَلَيْهِنَّ بِالْمَعْرُوْفِ، وَلِلرِّجَالِ عَلَيْهِنَّ دَرَجَةٌ﴾ [البقرة:٢٢٨]

භාර්යාවන් කෙරෙහි සැමියන්ට ඇති අයිතිවාසිකම් සේම, පිළිවෙළට සැමියන් කෙරෙහිද අයිතිවාසිකම් ඇත. එනමුත්, ස්ත්‍රීන්ට වඩා පිරිමින්ට වැඩි තරාතිරමක් ඇත්තේය.

*(අල්කුර්ආන් -2:228)*

සැමියා හා බිරිඳ දෙපළටම මවුන් පරස්පරව ඉටුකළ යුතු වගකීම් ඇති බවත්, විවිධ පෞද්ගලික හේතූන් මත පිරිමින්ට වැඩි තරාතිරමක් ඇති බවත් මෙම වැකිය වටහා දෙන්නේය.

නබි මුහම්මදු (සල්) තුමා තම අවසාන හජ් කර්තව්‍යය ඉටු කළ සමයේ කළ දේශනයෙහි මෙසේද පැවැසූ බව අම්ර් බින් අල්අහ්වස් (රලි) තුමා වාර්තා කරන්නේය.

[... أَلاَإِنَّ لَكُمْ عَلَى نِسَائِكُمْ حَقًّا، وَلِنِسَائِكُمْ عَلَيْكُمْ حَقًّا...]

(رواه الترمذي وأبوداود)

...දැනගන්න. නිසැකයෙන්ම, ඔබලා ඔබ බිරිඳන්ට කළ යුතු වගකීම්ද, ඔබ බිරිඳන් ඔබලාට කළයුතු වගකීම්ද තිබෙන් නේය... *(තිර්මිදි හා අබූදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)*

මෙයින් සමහරයන් සැමියන් හා බිරිඳන් දෙපළටම අයත් පොදු හා පෞද්ගලික අයිතිවාසිකම් වශයෙන් පවතී.

## ❑ - පොදු අයිතිවාසිකම්

### 1- විශ්වාසය :

සැමියා හා බිරිඳ යන දෙදෙනාම පරස්පරව විශ්වාස භාව යෙන් සිටිය යුතු අතර, සුළුවෙන් හෝ එකිනෙකාට ද්‍රෝහි කම් නොකළ යුතුයි.

## 2-ප්‍රේමය හා ප්‍රිය :

ඔවුන් දෙදෙනාම පරස්පරව පවිත්‍ර භාවයෙන් හා පිරිසිදු චේතනාවෙන් පරිපූරණ ප්‍රේමය හා ප්‍රිය හුවමාරු කළ යුතුයි. ඔවුන් දෙදෙනා අල්ලාහ්ගේ වැකිය වටහා දෙන කරුණු අනුව පරස්පරව මෙම ප්‍රේමයෙන් හා ප්‍රියයෙන් පුරා ජීවිත යම ගත කළ යුතුයි. අල්ලාහ් 'තවද, ඔබලා ඔවුන්ගෙන් සැනසීම ලබා ගැනීම වස් ඔහු (අල්ලාහ්) ඔබලාට ඔබ ජාතියෙන්ම බිරිඳන් නිර්මානය කිරීමද, ඔබලා අතර ඔහු ප්‍රිය හා කරුණාව ඇති කිරීමද ඔහුගේ සාධකයන් අතර වේ. සැබැවින්ම, කල්පනා කරන සමාජයට මෙහි සාධක තිබේය' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-30:21)*

එසේම, නබිනායක තුමා 'කවරෙකු (අන් අයට) ආදරය නොකරන්නේද, ඔහු (අන් අයගේ) ආදරයට පාත්‍ර නොවන් නේය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## 3-පරස්පර විශ්වාසය :

ඔවුන් දෙදෙනා පරස්පරව විශ්වාස භාවයෙන් හැසිරිය යුතුයි. ඔවුන් තම තමන්ගේ සත්‍යභාවයෙහිද, හැසිරීමෙහිද, පවිත්‍රභාවයෙහිද කිසිසේත් සැක කළ නොයුතුයි. මක්නිසා දයත්, අල්ලාහ් 'සැබවින්ම, විශ්වාසීන් සැම දෙනා සහෝ දරයින්ය' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-49:10)*

නබි මුහම්මදු (සල්) තුමා 'තමා ප්‍රියවන දේම තම සහෝද රයා කෙරෙහි ප්‍රියවන තෙක් ඔබලාගෙන් කවරෙකු හෝ

විශ්වාසියෙකු විය නොහැක' යනුවෙන් පැවැසූ බව අනස් (රලි)තුමා වාර්තා කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

සැමියා හා බිරිඳ කෙරෙහි සම්බන්ධතාවය විශ්වාසනීය සහෝදරත්වයට ස්ථිරතාවයද, ශීලාචාරයද සිනිඳුභාවයද වර්ධනය කරන්නේය.

## 4-පොදු සාරධර්ම :

එනම්, සාමාන්‍ය කටයුතුවල සිනිඳුකමින් හැසිරීම, ඔවුන් දෙදෙනා පරස්පරව මුහුණේ ප්‍රබෝධයෙන් බැලීම, ගරු කිරීම, යහපත් භාවයෙන් හැසිරීම යනාදියන්ය.
මේවා සියල්ල අල්ලාහ් අල්කුර්ආනය මගින් වටහා දී ඇති සත් ගුණධර්මයන් හා නබි මුහම්මදු (සල්) තුමා පවසා ඇති යහපත්ශීල සාරධර්මයන්ය. අල්ලාහ් මේ බව '(ඔබලා) ඔවුන් (බිරිඳන්) හා සමග යහපත් ජීවිතයක් ගත කරන්න' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-4:19)*

නබි මුහම්මදු (සල්) තුමා '(ඔබලා) ස්ත්‍රීත්ව යහපත් භාවයෙන් මෙහෙයවන්න' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ❑ -පෞද්ගලික අයිතිවාසිකම්

එනම්, සැමියා තම බිරිඳ කෙරෙහිද, බිරිඳ තම සැමියා කෙරෙහිද පෞද්ගලිකව ඉටු කළ යුතු අනිවාර්ය කරුණුද ලබා දිය යුතු අයිතිවාසිකම්ද ඇත්තේය. ඒවා මෙසේය.

# සැමියාගෙන් බිරිඳගේ අයිතිවාසිකම්

සැමියා තම බිරිඳ කෙරෙහි පහත සඳහන් සාරධර්මයන් අනුගමනය කළ යුතුයි.

1-ඇය සමඟ යහපත් ජීවිතයක් ගතකළ යුතුයි. අල්ලාහ් 'මවුන් සමඟ යහපත් ජීවිතයක් ගත කරන්න.' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-4:19)*

එනම්, තමා ආහාරපානය අනුභව කරන හා ඇඳුම් අඳින සේ ඇයටද එසේම ලබාදිය යුතුයි. ඇය තමාට විරුද්ධකම් කරන්නේ දැයි මහු බියට පත්වන කළ අල්ලාහ් කෙසේ බිරිඳන් ශීලාචාර කළ යුතු බව අණකර ඇත්තේද එලෙස ඇයව ක්‍රමවත්ව ශීලාචාර කළ යුතුයි.

ඇයව බැණ නොවදී, දොස්පද නොකී හා නින්දා නොකර උපදෙස් කළ යුතුයි. එයට ඇය කීකරු නොවන කළ ඇයව යහනයෙන් ඉවත්කළ යුතුයි. එයටද ඇය කීකරු නොවන්නේද, තුවාල නොවන පරිදි පහර දිය යුතුයි. ඇයගේ මුහුණට හෝ ලේ පිටවන තරමට හෝ අවයවන් ක්‍රියා විරහිත වන පරිදි හෝ පහර නොදිය යුතුයි. අල්ලාහ් මේ බව 'කුමන ස්ත්‍රීන් කෙරෙහි මවුන් (තම භාර්යාවන්ට) විරුද්ධකම් කරන්නේ දැයි මබලා බියවන්නේද, මවුන්ට උපදෙස් කරන්න. (එමගින් මවුන් කීකරු නොවූයේනම්) මවුන්ව යහනයෙන් ඉවත් කරන්න. (එමගින්ද මවුන් කීකරු නොවූයේනම්) මවුන්ට (සෙමින්) පහර දෙන්න. (නමුත්) මවුන් මබලාට කීකරුවූයේනම්, මවුන්ට එරෙහිව (වෙනත්) කිසියම් මාර්ගයක් නොසොයන්න' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-4:34)*

අපි අපගේ භාර්යාවන්ට කළයුතු කරුණු කුමක්ද ? යනු වෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් මා විමසූවිට එතුමා 'ඔබ ආහාර අනුභව කරන කළ ඇයටද ආහාර සපයන්න. ඔබ ඇඳුම් අඳින කළ ඇයටද පැළඳීමට ඇඳුම් ලබා දෙන්න. ඇගේ මුහුණෙහි පහර නොදෙන්න. ඇයව නින්දිත ලෙස කතාබහ නොකරන්න. ඇයව පිළිකුල් ලෙස අප්‍රිය කරන්නේනම්, නිවසෙහි පමණක් එසේ කරන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව මුආවියා බින් හයිදා .(රලි) තුමා වාර්තා කරන්නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිනායක මුහම්මදු (සල්) තුමා 'දැනගන්න, ඔබලා ඔබ ලාගේ බිරිඳන්හට කළ යුතු අනිවාර්ය කරුණුනම්, ආහාර පාන හා ඇඳුම් පැළඳුම් මවුන්ට සැපයීමෙහි යහපත් ශීල යෙන් හැසිරීමවේ' යනුවෙන් පැවසූ බව අම්ර් බින් අහ්වස් (රලි) වාර්තා කරන්නේය. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

'විශ්වාසනීය පිරිමියෙකු තම විශ්වාසනීය බිරිඳ කෙරෙහි පිළිකුල් නොකරනු. ඇයගේ එක් ගුණාංගයක් ඔහු පිළි කුල් කළත්, ඔහු ප්‍රිය කරන වෙනත් ගුණාංගයක් ඔහු ඇය ගෙන් දිටිය හැක' යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන් නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

2-ඇය ආගමික දැනුම් ඥානය නොලද කෙනෙකුනම්, ඇයට අත්‍යවශ්‍ය කරුණු ඉගැන්විය යුතුයි. නොඑසේනම්, මේවා ඉගෙන ගැනීම සඳහා ආගමික අධ්‍යාපනය උගන්වන පන් තිවලට යාම සඳහා අවසරය ලබා දිය යුතුයි. මක්නිසාදයත්, ආගමික දැනුම් ඥානය ලබාගැනීම කෙරෙහි අවශ්‍යතාවය

ආහාර පානයන් කෙරෙහි අවශ්‍යතාවයට වඩා ඌන දෙයක් නොවන්නේය.

අල්ලාහ් 'විශ්වාසවන්තයිනි, මිනිසුන් හා ගල් දවන ද්‍රව්‍යවූ එම නිරයෙහි ගින්නෙන් ඔබලාවද ඔබ (බිරිඳ හා දරුවන් ඇතුලු) පවුල් පදාතීන්ද රැකගන්න' යනුවෙන් පවසන් නේය. (අල්කුර්ආන්-66:6)

3-ඉස්ලාමීය අනුශාසනා හා අවවාද සිය ජීවිතයෙහි අනුගම නය කිරීම සඳහා ඇයට බල කළ යුතුයි. ඇය සිය අලංකාර පෙන්වමින් ගමන් බිමන් කිරීම, අන් පිරිමින් සමග මිශ්‍රවී ඔවුන් සමග සහවාස කිරීම යනාදීන් කෙරෙහි ඇයව වැළක් විය යුතුයි. මක්නිසාදයත්, සැමියා ඇයව රැකබලා ගතයුතු හා ආරක්ෂා කළ යුතු වගකිව යුත්තාය.

අල්ලාහ් 'පිරිමින් ස්ත්‍රීන්ව පාලනය කරන්නන්ය' යනුවෙන් පවසන්නේය. (අල්කුර්ආන්-4:34)

නබිනාය මුහම්මද් (සල්) තුමා 'පිරිමියා තම පවුල් පදාතීන් කෙරෙහි වගකිව යුත්තාය. ඔහු සිය වගකීම් පිළිබඳව ප්‍රශ්න කරනු ලැබේ' යනුවෙන් පැවසූ බව ඉබිනු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## බිරිඳගෙන් සැමියාගේ අයිතිවාසිකම්

*බිරිඳ තම සැමියා කෙරෙහි පහත සඳහන් සාරධර්ම යන් අනුගමනය කළ යුතුයි.*

1-අල්ලාහ්ට එරෙහි කරුණුවල හැර අන් සෑම දේ කෙරෙහි ඇය තම සැමියාට කීකරු විය යුතුයි. අල්ලාහ් 'මවුන් (බිරි දන්) ඔබලාට කීකරු වූයේනම්, ඔවුන්ට එරෙහිව (වෙනත්) කිසියම් මාර්ගයක් හෝ සොයා නොයන්න' යනුවෙන් පව සන්නේය. *(අල්කුර්ආන්-4:34)*

නබි මුහම්මදු (සල්) තුමා 'පුද්ගලයෙකු තම බිරිඳ යහන යට කැඳවා, ඇය ඔහු කරා නොගියේනම්, (ඒ හේතුවෙන්) ඔහු ඇය කෙරෙහි කෝපයෙන් එදින රාත්‍රිය ගත කළේ නම්, ඇය අළුයම අවදිවන තෙක් අල්ලාහ්ගේ සුර දූතවරුන් ඇයට ශාප කරති' යනුවෙන් පැවසූ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබිනායක තුමා 'පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුගේ පා මුල වැටීම මා අනුමත කරන්නේනම්, බිරිඳ තම සැමියාගේ පා මුල වැටීම සඳහා මා අණකර ඇත්තෙමි' යනුවෙන් පැවසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

2-ඇය තම ගෞරවය හා තම සැමියාගේ නම්බුව රැකගත යුතු අතර, සැමියාගේ සම්පත්, ඔහුගේ දරුවන් හා නිවැස් කටයුතු සියල්ල රැකවරණයෙන් ආරක්ෂා කළ යුතුයි.

අල්ලාහ් 'යහපත්ශීල ස්ත්‍රීන් (තම සැමියන්ට) අවංක භාව යෙන් කීකරුවෙති. තවද, තම සැමියන් නිවැසහි නොසිටින අවස්ථාවන්හි ආරක්ෂා කළ යුතු දේ කෙරෙහි අල්ලාහ්ගේ ආරක්ෂාවෙන් රැක බලා ගෙන සිටිති' යනුවෙන් පවසන් නේය. *(අල්කුර්ආන්-4:34)*

නබි මුහම්මදු (සල්) තුමා 'ස්ත්‍රිය තම සැමියාගේ නිවැස් කෙරෙහි වගකිව යුත්තාය. ඇය සිය වගකීම පිළිබඳව ප්‍රශ්න කරනු ලබේ' යනුවෙන් ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

3-සැමියාගේ නිවසෙහිම ඇය රැඳී සිටිය යුතුයි. ඔහුගේ අවසරය හා තෘප්තියෙන් තොරව ඇය සිය නිවැසින් පිටත්විය නොයුතුයි. තම බැල්ම පහත හෙලිය යුතු අතර, තම කට හඬද පහත් කළ යුතුයි. කවරෙකුට හෝ ඇය අපරාධ නොකළ යුතු අතර, සැමියාගේ පවුල් ඥාතීන් සමග යහපත් ශීලයෙන් හැසිරිය යුතුයි.

අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

'ඔබ ඔබලාගේ නිවැසෙහිම රැඳී සිටින්න. පැරණි අඥාන සමයෙහි (සිටි ස්ත්‍රීන්) මෙන් දේහ අලංකාරය ප්‍රදර්ශනය කරමින් නොඇවිදින්න' *(අල්කුර්ආන්-33:33)*

'ඔබලා (අන් පිරිමින් සමග) ලලිත භාවයෙන් කතා බහවල නොයෙදෙන්න. මන්දයත්, සිත් සතන්හි රෝගය (නපුරු ආකල්ප) තිබෙන්නා සඵල කළ හැක' *(අල්කුර්ආන්-33:32)*

'අපවිත්‍ර වචනයන් ප්‍රසිද්ධියෙන් කීම අල්ලාහ් කැමැති නොවන්නේය' *(අල්කුර්ආන්-4:148)*

(නබිතුමනි) විශ්වාසනීය ස්ත්‍රීන්හට 'ඔවුන් තමන්ගේ බැල්ම පහත හෙළිය යුතු බවත්. තම ආවරණ ප්‍රදේශ රැකගත යුතු බවත්, තම දේහ අලංකාරය සාමාන්‍යයෙන් පිටත පෙනෙන දේ හැර අන් කිසිවක් නොපෙන්විය යුතු බවත් ...' පවසන්න' *(අල්කුර්ආන්-24:31)*

නබිනායක මුහම්මදු (සල්) තුමා 'ඔබ සිය බිරිඳ කරා බැලූවිට ඇය ඔබව සතුටු කරයි. ඔබ අණකළ විට ඔබට ඇය කීකරුවේ. ඔබ නොමැති අවස්ථාවන්හි ඇය ඇගේ කන්‍යාභාවය හා සම්පත රැක ගනී. ස්ත්‍රීන් අතර ශ්‍රේෂ්ඨ වත්තිය හෙතම ඇයමයවේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(නසාඉ ග්‍රන්ථය ඇසුරෙනි)*

# පවුල් ඥාතීන් කෙරෙහි සාරධර්ම

මුස්ලිම්වරයා තම දෙමාපියන්, දරුවන් හා සහෝදර සහෝදරියන් සමග සාරධර්මයෙන් හැසිරෙන සේම, තම ලේ ඥාතීන් හා පවුල් ඥාතීන් සමගද හැසිරිය යුතුයි.

තම දෙමාපියන් සමග හැසිරෙන සේම, ඔවුන්ගේ සහෝදර සහෝදරියන් සමගද හැසිරිය යුතුයි. එනම්, තම මව හා පියගේ සහෝදරියන් සමග තම මව සමග හැසිරෙන සේද, පියා හා මවගේ සහෝදරයන් සමග පියා සමග හැසිරෙන සේද හැසිරිය යුතුයි.

ලේ නෑයෝ මුස්ලිම් හෝ මුස්ලිම් නොවන්නන් වුවද, ඔවුන් සැම දෙනා ලේ ඥාතීන් ලෙස සැලකිය යුතුයි. ඔවුන් සමග සුහද භාවයෙන් ජීවත්වීම හා ඔවුන්ට උදව් කිරීම අනිවාර්යවේ.

ඔවුන් අතර සිටින වැඩිහිටියන් ගරු කිරීම, බාල වුවන්ට ආදරය දැක්වීම, ඔවුන් රෝගාතුරුව සිටින කළ ඒ ගැන විමසීම, ඔවුන් දුක් පීඩාවට ලක්වූ කළ ඔවුන් සැනසුම් කිරීම, ඔවුන් ඥාතිත්වය කඩ කළත් ඔවුන් සමග එක්ව සුහදව හැසිරීම හා ඔවුන් අප්‍රසන්න භාවයෙන් සිටියත් ඔවුන් සමග

සිතිඳු භාවයෙන් හැසිරීම යනාදීන් ඔවුන් සමග හැසිරෙන සාරධර්මයන්ය. මේ බව අල්කුර්ආනයෙහි හා නබි වදන්වල තහවුරුකර ඇත. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿وَاتَّقُوا اللهَ الَّذِيْ تَسَآءَلُوْنَ بِهِ وَالْأَرْحَامَ﴾ [النساء:١]

කුමන අල්ලාහ්ගේ නාමයෙන් ඔබලාගෙන් කෙනෙකු අනෙකුගෙන් පරස්පරව (තම අයිතිවාසිකම) අයැද සිටින්නේද, එම අල්ලාහ්ටම ඔබලා බිය වන්න. තවද, ලේ ඥාතිකම පරිහානිය කිරීමෙන් ඔබලා වැළකී සිටින්න. *(අල්කුර්ආන්-4:1)*

﴿فَآتِ ذَا الْقُرْبَى حَقَّهُ﴾ [الروم:٣٨]

ඥාතීන්හට ඔවුන්ගේ අයිතිවාසිකම ලබා දෙන්න. *(අල් කුර්ආන්-30:38)*

﴿إِنَّ اللهَ يَأْمُرُ بِالْعَدْلِ وَالْإِحْسَانِ وَإِيْتَاءِ ذِي الْقُرْبَى﴾ [النحل:٩٠]

නිසැකයෙන්ම, අල්ලාහ් යුක්ති සහගතව කටයුතු කරන ලෙසද, කුසල් ක්‍රියාවන් කරන ලෙසද, ඥාතීන්ට උපකාර කරන ලෙසද අණ කරයි. *(අල්කුර්ආන්-16:90)*

නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'ස්වර්ගයෙහි පිවිසීමට හා අපායෙන් ඈත්වීමට හේතුවන කරුණු කුමක්ද ?' යනුවෙන් විමසූ කළ එතුමා 'ඔබ අල්ලාහ්ට වන්දනාමානය ඉටු කරන්න. ඔහුට කිසියම් දේ හෝ සමාන නොකරන්න. සලාතය ඉටු කරන්න. සකාතය හෙවත් දුගී බද්ද ගෙවන්න. පවුල් ඥාතීන් සමග එක්ව ජීවත් වන්න' යනුවෙන් පැවසූ බව අබූ අයියූබ් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව සල්මාන් බින් ආමිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[اَلصَّدَقَةُ عَلَى الْمِسْكِيْنِ صَدَقَةٌ وَعَلَى ذِي الْقَرَابَةِ اثْنَتَانِ صَدَقَةٌ وَصِلَةٌ]

(رواه ابن ماجه)

දිළින්දන්ට කරන දානය වෙනුවෙන් එකී කුලිය (පමණක්) ලැබේ. ඥාතීන්ට කරන දානය වෙනුවෙන් කුලී දෙකක් ලැබේ. ඒවා එකී කුලිය හා ඥාත්තවයෙහි කුලියවේ.

*(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

අස්මා බින්ත් අබීබක්ර් (රලි) තුමිය මක්කාවේ සිට (මදීනාවට) පැමිණ සිටි අවස්ථාවේ නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් (ඉස්ලාමය නොවැළඳ සිටි) තම මව කෙරෙහි ඥාතිත්වය පැවැත්විය යුතුද ? යනුවෙන් විමසූ කළ, එතුමා 'මව් ඔබ ඔබ මව සමග ඥාතිත්තවය පවත්විය යුතුයි' යනුවෙන් ප්‍රකාශ

*(බුඛාරී හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

# අසල් වාසීන් කෙරෙහි සාරධර්ම

මුස්ලිම්වරයා අසල් වාසීන්ට ලබා දිය යුතු අයිත්වාසිකම් හා ඔවුන් සමග හැසිරිය යුතු සාරධර්මයන් පිළිගත යුතුයි. ඒවා සියල්ල පරිපූරණයෙන් අනුගමනය කිරීම සෑම අසල් වැසියෙකුටම අනිවාර්යවේ. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَاعْبُدُوا اللهَ وَلاَ تُشْرِكُوْا بِهِ شَيْئًا وَّبِالْوَالِدَيْنِ إِحْسَانًا وَبِذِي الْقُرْبَى وَالْيَتَامَى وَالْمَسَاكِيْنِ وَالْجَارِ ذِى الْقُرْبَى وَالْجَارِ الْجُنُبِ﴾ [النساء:٣٦]

අල්ලාහ්ටම වන්දනාමානය කරන්න. ඔහුට කිසිවක් සමාන නොකරන්න. දෙමාපියන් කෙරෙහි සාර ධර්මයෙන් හැසිරෙන්න. ඥාතීන්, අනාථයන්, දිළින්දන්, ඥාතීන්වූ අසල් වැසියන් හා ඥාතීන් නොවන අසල් වැසියන් යනාදීන් කෙරෙහිද යහපත් භාවයෙන් හැසිරෙන්න. *(අල්කුර්ආන් - 4:36)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නේය.

[مَازَالَ جِبْرِيْلُ يُوْصِيْنِيْ بِالْجَارِ حَتَّي ظَنَنْتُ أَنَّهُ سَيُوَرِّثُهُ] (متفق عليه)

අසල්වැසියන් මාගේ (සම්පත්වල කෙරෙහි) හිමිකරුවෙකු ලෙසට පත්වෙයිද යනුවෙන් සිතන තරමට ජිබ්රීල් (අලෛ) තුමා මවුන් ගැන මහාට අඛණ්ඩව දේශනා කරමින් සිටියේය.
*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[مَنْ كَانَ يُؤْمِنُ بِاللهِ وَالْيَوْمِ الْآخِرِ فَلْيُكْرِمْ جَارَهُ] (متفق عليه)

කවරෙකු අල්ලාහ්ව හා අවසාන දිනය කෙරෙහි විශ්වාස කරමින් සිටින්නේද, ඔහු තම අසල් වැසියා කෙරෙහි යහපත ශීලයෙන් හැසිරෙනු. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## අසල් වැසියන්ට කළයුතු කාර්ය

1 - කියමනින් හෝ ක්‍රියාවෙන් අසල්වාසීට හිරිහැර නොකිරීම. මක්නිසාදයත්, නබිනායක තුමා 'කවරෙකු අල්ලාහ්ව හා අවසාන දිනය කෙරෙහි විශ්වාස කර සිටින්නේද, ඔහු තම

අසල් වැසියා කෙරෙහි යහපත් ශීලයෙන් හැසිරෙතු' යනු වෙන් පැවැසූ බව අබූෂුරෛහ් (රලි) තුමා වාර්තා කරයි.
*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම, නබිනායක තුමා 'මහු විශ්වා සවන්තයා නොවන් නේය. මහු විශ්වාසවන්තයා නොවන්නේය. මහු විශ්වාස වන්තයා නොවන්නේය' යනුවෙන් (තුන්වරක්) පැවැසූ කළ 'කවරෙකු නබිතුමනි' යනුවෙන් එතුමාගෙන් විමසූහ. එවිට එතුමා 'කවරෙකුගේ හිරිහැරයෙන් සිය අසල්වැසියා රැකවරණය නොලබමින් සිටින්නේද හෙතම මහුය' යනු වෙන් පැවැසීය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

2-මහුට උපකාර කිරීම. එනම්, ඒවා මහු උදව් උපකාර පැතූවිට මහුට උදව් උපකාර කිරීම. මහු ලෙඩවූ කළ ඒ ගැන මහු ගෙන් විමසීම, මහු ප්‍රීතියට පත්වූ කළ මහුට ප්‍රශංසා කිරීම, මහු දුක් හා පීඩාවට ලක්වූ කළ මහුව සැනසුම් කිරීම, අවශ්‍යවූවිට උපකාර කිරීම, මහුට අභිබවා සලාම් කීම, මහු හා මහුගේ දරුවන් සමඟ සිහිඳුකමින් කතා බහවල යෙදීම, ආගමික හා ලෞකික කරුණුවල මහුට මගපෙන්වීම, මහු ගෙන් සිදුවන වැරදීන් කෙරෙහි සමාව දීම, මහුගේ රහස්‍ය යන් කෙරෙහි පර්යේෂණය නොකිරීම, ගොඩනැගිලි හා පාරවල් තැනීමේදී මහුට හිරිහැර නොදීම හා මහුගේ නිවැස් ඉදිරියෙහි කුණු රොඩු හැලීම මගින් මහුට කරදර නොකිරීම යනාදීන්ය. මේ සියල්ල මුස්ලිම්වරුන් සෑම දෙනා කෙරෙහිම අණකර ඇති සාරධර්මයන්ය.

3-කුසල් කිරීම මගින් මහුට ගරු කිරීම. නබිනායක තුමා 'මුස්ලිම් ස්ත්‍රීයනි, ස්වල්ප මස් සහිත එළු කුරයක් වුවද එය

නින්දිත බව සිතා එය අසල් වැසියාට ලබාදීමෙන් වැළකී නොසිටින්න' යනුවෙන් පැවසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිනායක තුමා, තමා අමතා 'අබූදර්, ඔබ ව්‍යංජනය උයන කළ එහි ජලය වැඩිකර ඔබ අසල් වාසීන්ටද එයින් සළකන්න' යනුවෙන් පැවසූ බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

ආයිෂා (රලි) තුමිය, නබිනායක තුමාගෙන් 'මාහට අසල් වැසියන් දෙදෙනෙක් සිටිති. එයින් මා කවරෙකුට ප්‍රථම යෙන් තෑගිබෝග (හදියා) ලබාදිය යුතුද ?' යනුවෙන් විමසූ කළ එතුමා 'ඔවුන් අතර කවරෙකුගේ නිවස ඔබට ඉතා යාබදව පිහිටා ඇත්තේද, ඔහුට ලබා දෙන්න' යනු වෙන් පැවසූ බව එතුමිය වාර්තා කරන්නීය

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

4-හිරිහැර නොකිරීම මගින් ඔහුට ගරුකිරීම. තමාගේ මායිම් (පොදු) බිත්තියෙහි ඔහු තම නිවසට අයත් බාල්කය වැනි දේ සවිකිරීම නොවැළක්විය යුතුයි. එසේම, ඔහු සමග විමසීම් නොකර ඔහුගේ ඉඩමට යාබදව පිහිටා ඇති තම ඉඩම හෝ ගොඩනැගිල්ල කුලියට දීම හෝ විකිණීම හෝ නොකළ යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'ඔබලා ගෙන් කවරෙකු හෝ තම බිත්තියෙහි අසල් වැසියා බාල්ක යක් සවිකිරීම තහනම් නොකරන්න' යනුවෙන් පැවසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම, 'පුද්ගලයෙකුගේ වත්තකට කොටස් කරුවෙකු හෝ යාබද අසල්වැසියෙකු හෝ සිටීනම්, ඔහුට නොදන්වා එය විකුණුම් නොකරන්න' යනුවෙන් නබිනායක තුමා පව සන්නේය. *(හාකිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

# මුස්ලිම්වරයාගේ අයිතිවාසිකම්

මුස්ලිම්වරයා තම සහෝදර මුස්ලිම්වරයාට තමා කළ යුතු අනිවාර්ය කරුණු හා සාරධර්මයන් ඇති බව විශ්වාස කළ යුතුයි. ඒවා අල්ලාහ්ට කළ යුතු වන්දනාමානයක් ලෙසද, ඔහු කරා ලඟාවීමට අයත් මගක් ලෙසද අවබෝධ කරගෙන නිසිපරිදි ඒවා ඉටුකළ යුතුයි. මක්නිසාදයත්, මෙම අනිවාර්ය කරුණු හා සාරධර්මයන් තම සහෝදර මුස්ලිම්වරයාට කළ යුතු බව අල්ලාහ් අනිවාර්ය කර ඇත. ඒවා මෙසේය.

1 –ඔහුව මුනගැසුවිට තම කතාබහ ආරම්භ කිරීමට පෙර ඔහුට 'අස්සලාමු අලෛක්කුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු' යනු වෙන් සලාමය පවසා මුසාෆහා කළ (අතිනත දිය) යුතුයි. එයට පිළිතුරක් වශයෙන් ඔහු 'වඅලෛකු මුස්සලාම් වරහ් මතුල්ලාහි වබරකාතුහු' යනුවෙන් කිව යුතුයි.

අල්ලාහ් මේ බව 'ඔබලාට සලාමය පැතු කළ එයට පිළි තුරක් ලෙස එයට වඩා අලංකාරමත් (වචන වලින්) සලාමය පවසන්න. නොඑසේනම්, (අවම වශයෙන්) එලෙසම පිළි තුරු සලාමය පවසන්න. *(අල්කුර්ආන් –4:86)*

නබිනායක මුහම්මදු (සල්) තුමා 'වාහනයේ ගමන් කරන්නා ඇවිදමින් ගමන් කරන්නාටද, ඇවිදමින් ගමන් කරන්නා

අසුන් ගෙන සිටින්නාටද, ස්වල්ප පිරිස් අධික පිරිසටද සලාමය කිව යුතුයි' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමාද, 'ඔබ හඳුනන හා නාඳුනන අයට සලාමය පව සන්න' යනුවෙන් පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්ර් (රලි) තුමාද වාර්තා කරති. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

2-ඔහු කිඹුහුමක් යවා 'අල්හම්දු ලිල්ලාහ්' (සියළු ප්‍රශංසා අල් ලාහ්ටට හිමිවේ) යනුවෙන් පැවැසූ කළ, 'යර්හමකල්ලාහ්' (අල්ලාහ් ඔබට භාග්‍ය ලබා දෙනු මැනවි) යනුවෙන් ඔහු කිව යුතුයි. එයට පිළිතුරක් වශයෙන් ඔහු 'යහ්දීකුමුල්ලාහ් වයුස්ලිහ් බාලකුම්' (අල්ලාහ් ඔබට සුමග පෙන්වනු මැන. ඔබගේ තත්ත්වයන් ශීලාචාර කරනු මැනවි) යනුවෙන් පැවැසිය යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'ඔබලාගෙන් කෙනෙකු කිඹුහුමක් යවා 'අල්හම්දු ලිල්ලාහ්' යනුවෙන් කිව කළ (එයට සවන් දෙන) ඔහුගේ සහෝදරයා 'යර්හමු කල්ලාහ්' යනුවෙන් පවසනු. ඔහු එසේ යර්හමුකල්ලාහ් යනුවෙන් පැවැසූ කළ, කිඹුහුම යැවූ තැනැත්තා ඔහුට 'යහ්දීකුමුල්ලාහ් වයුස්ලිහ් බාලකුම්' යනුවෙන් පවසනු' මෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, 'නබිනායක තුමා කිඹිසීමක් කළානම් තම අතින් හෝ රෙද්දකින් හෝ මුහුණ වසා ගන්නා බවත්, එමගින් තම ශබ්දයද පහත්කර ගන්නා බවත්' අබූහුරෛරා (රලි) තුමා පවසන්නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

3-ඔහු ලෙඩවූ කළ ඔහුගේ සුව දුක් විමසීම් හා ඔහු ලෙඩෙන් මිදීම සඳහා ප්‍රාර්ථනා කිරීම් කළ යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'මුස්ලිම්වරයෙකුට තම මුස්ලිම් සහෝදරයා

කෙරෙහි අනිවාර්ය කරුණු පහක් ඇත. ඒවා, තමාට කී සලාමයට පිළිතුරු දීම, ලෙඩුන් සුව දුක් විමසීම, අවමංගල්‍ය (ජනාසා) කටයුතුවල සහභාගිවීම, භෝජන සංග්‍රහය සඳහා කෙරෙන ඇරයුම පිළිගැනීම හා මහු කිඹිහුමක් යවා අල්හම්දු ලිල්ලාහ් යනුවෙන් කියූ විගස යර්හමුකල්ලාහ් යනුවෙන් කීම යනාදීන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

4–මහු මරණයට පත්වූ කළ මහුගේ ජනාසා කටයුතුවලට සහභාගිවිය යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'මුස්ලිම් වරයෙකු තම මුස්ලිම් සහෝදරයා කෙරෙහි කළයුතු අනිවාර්ය කරුණු පහක් ඇත. ඒවා, තමාට පිළිගැන්වූ සලාමයට පිළිතුරු දීම, ලෙඩුන් සුව දුක් විමසීම, ජනාසා කටයුතුවල සහභාගිවීම, භෝජන සංග්‍රහය සඳහා කෙරෙන ඇරයුම පිළිගැනීම හා මහු කිඹිහුමක් යවා අල්හම්දු ලිල්ලාහ් යනුවෙන් කියූ විගස යර්හමුකල්ලාහ් යනුවෙන් කීම යනාදීන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නෙන්ය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

5–මහු කිසියම් කරුණක් පිළිබඳව දිවුරා ඇත්තේනම්, මහු එය කඩ නොකර ඉටු කිරීම සඳහා මහුට උදව් කිරීම.

ලෙඩුන්ගේ සුව දුක් විමසන ලෙසත්, ජනාසා කටයුතුවල සහභාගිවන ලෙසත්, කිඹිහුමකට පිළිතුරු දෙන ලෙසත්, දිවුරුම් කළ අයට එය ඉටුකිරීම සඳහා උදව් කරන ලෙසත්, අපරාධයට ලක්වූ තැනැත්තාට උදව් කරන ලෙසත්, කෙරෙන භෝජන සංග්‍රහ ඇරයුම පිළිගන්නා ලෙසත් සලාමයට පිළිතුරු ලබාදෙන ලෙසත් නබිනායක තුමා අපට

අණකර ඇති බව බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

6-ඔහු කිසියම් කරුණක් කෙරෙහි උපදෙස් පැතු කළ ඔහුට උපදෙස් කළ යුතුයි. එනම්, එකී කරුණෙහි ඇති යහපත හා ප්‍රයෝජනය පැහැදිළිකර අවබෝධකර දිය යුතුයි. මේ ගැන නබිනායක තුමා 'පුද්ගලයෙකුගෙන් තම සහෝදර යෙකු උපදෙස් පැතු කළ ඔහුට උපදෙස් කරනු' යනුවෙන් පැවැසීය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

7-තමා ප්‍රියකරන දේම ඔහු කෙරෙහි ප්‍රිය කළ යුතු අතර, තමා අප්‍රිය කරන දේම ඔහු කෙරෙහි අප්‍රිය විය යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'තමා ප්‍රියකරන දේ තම සහෝදරයා කෙරෙහි ප්‍රියකරන තෙක් ඔබගෙන් කවරෙකු හෝ විශ්වාස වන්තයෙකු විය නොහැක' යනුවෙන් පැවැසූ බව අනස් (රලි) තුමාද, 'විශ්වාසවන්තයෙකු තව විශ්වාස වන්තයෙකුට උදාහරණයනම්, ගොඩනැගිල්ලක් සේය. එහි කොටසක් තවත් කොටසක් උසුලගෙන (මුක්කුදී) සිටින්නේය' යනුවෙන් පැවැසූ බව අබූ මූසා (රලි) තුමාද වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

8-ඔහුට උදව් උපකාර කළ යුතුයි. ඔහුට උදව් උපකාර අවශ්‍ය වන කුමන අවස්ථාවක හෝ ඔහුව නොසැළකිලිමත්ව අතහැරිය නොයුතුයි. මක්නිසාදයත්, 'ඔබ සහෝදරයා අප රාධ කරන්නෙකු හෝ අපරාධයට ලක්වූ තැනැත්තෙකු හෝ වේවා ඔහුට උදව් උපකාර කරන්න' යනුවෙන් නබි නායක තුමා පැවැසූවිට පුද්ගලයෙකු 'අල්ලාහ්ගේ දූතයා නෙනි, අපරාධයට ලක්වූ තැනැත්තාට උද්ව් උපකාර කළ හැක. නමුත්, අපරාධ කරන්නාට උදව් උපකාර කරන්නේ

කෙසේද ?' යනුවෙන් විමසීය. එවිට එතුමා 'අපරාධ කිරීමෙන් මනුව වැළක්වීම ඔබ මනුට කරන උදව් උපකාරයේ' යනුවෙන් පැවැසූ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම, 'තම සහෝදර මුස්ලිම් වරයාගේ නම්බුව ආරක්‍ෂා කරන්නාගේ මුහුණ පරලොවෙහි අල්ලාහ් අපායයෙන් ආරක්‍ෂා කරයි' යනුවෙන් නබිනායක තුමා පැවැසූ බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(අහ්මද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

9-මනුට කිසියම් කරදරයක් හෝ හානියක් හෝ නොකළ යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'සෑම මුස්ලිම් වරුන්ටම (තම සහෝදර) මුස්ලිම් වරයාගේ ලේ, සම්පත් හා නම්බුව යනාදීන් තහනම්ය' යනුවෙන් පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිනායක තුමා 'කිසියම් මුස්ලිම් වරයෙකු හෝ වෙනත් මුස්ලිම්වරයෙකු බියගැන්වීම තහනම්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබ්දුල් රහ්මාන් බින් අබී ලෛලා (රලි) තුමා වාර්තා කරන්නේය. *(අබූදාවූද් හා අහ්මද් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබිනායක තුමා 'කවරෙකුගේ දිවෙන් හා අතින් අන් මුස්ලිම්වරුන් (හිරිහැරයෙන් තොරව) නිදහසින් ජීවත් වන්නේද සත්‍ය මුස්ලිම් මනුමය' යනුවෙන් පැවැසූ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරයි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

10-මනු සමග බැගෑපත්කමින් හැසිරිය යුතු අතර, මනු කෙරෙහි අහංකාර නොකළ යුතුයි. අනුමතවූ සභාවෙහි

ඔහු අසුන්ගෙන සිටින කළ එහි තමා අසුන්ගැනීම සඳහා ඔහුව එතැනින් නැගිට්ටවිය නොයුතුයි. අල්ලාහ් 'ඔබ මුහුණ අහංකාරමත්ව මිනිසුන්ගෙන් හරවා නොතබන්න. පොළොවෙහි අහංකාරයෙන් නොඇවිදින්න. නිසැකව, අහංකාර කරන හා ආඩම්බරවන කිසිවෙකු අල්ලාහ් ප්‍රිය නොකරන්නේය' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-31:18)*

නබිනායක තුමා 'කවරෙකු අල්ලාහ් කෙරෙහි බැගෑපත් කමින් සිටින්නේද, ඔහුව අල්ලාහ් උසස් කරයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රළි) තුමා වාර්තා කරන්නේය. *(මුස්ලිම් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

නබිනායක මුහම්මදු (සල්) තුමා සැම දෙනා සමඟ බැගෑපත්කමින් හැසිරෙන්නේය. වැන්දඹුවන් හා දිළින්දන් කරා ගොස් ඔවුන්ගේ අවශ්‍යතාවයන් අහංකාර නොකරමින් ඉටුකර දෙන්නේය. එතුමා 'ඔබලාගෙන් කවරෙකු හෝ පුද්ගලයෙකු අසුන්ගෙන සිටින ස්ථානයෙන් ඔහුව ඉවත් කොට එහි අසුන් නොගන්න. අමතරව එහි විශාලකර අසුන් ගන්න' යනුවෙන් පැවසූ බව ඉබ්නු උමර් (රළි) තුමා වාර්තා කරන්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

11-ඔහුව දින තුනකට වඩා පිළිකුල් කර නොසිටිය යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'මුස්ලිම්වරයෙකු තම සහෝදරයාව දින තුනකට වඩා පිළිකුල්කරමින් සිටිය නොයුතුයි. ඔවුන් දෙදෙනා හමුවන අවස්ථාවන්හි කෙනෙකු අනෙකා නොසලකා නොයා යුතුයි. ඔවුන් දෙදෙනා අතර ප්‍රථමයෙන් සලාමය ආරම්භ කරන්නා ශ්‍රේෂ්ඨයාය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ අයියූබ් (රළි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම, නබිනායක තුමා '...ඔබලා පරස්පරව කෙනෙකු අනෙකුට පිළිකුල නොහඟවන්න. ඔබ සැම දෙනාම අල් ලාහ්ගේ දාසයන්වූ සහෝදරයන් සේ සිටින්න' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන් නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

12-මිනිසුන් ගැන කේලාම් කීම, මහුව නින්දිතයෙකු ලෙස සැළ කීම, මහුව විහිළු කිරීම, මහුට විකට නම් කිරීම හා මහු ගැන ව්‍යාජ තොරතුරු පතුරුවීම යනාදීන් නොකළ යුතුයි. මේ බව අල්ලාහ් 'විශ්වාස වන්තයිනි, (සැක සහිත) අධික සිතුවිලිවලින් ඔබලා වැළකී සිටින්න. මක්නිසාදයත්, සිතු විල්ලෙහි උදාවන සමහරයන් පාපයන් ලෙස පවතී. (අන් අයගේ අඩුපාඩු ගැන) සමීක්ෂණය නොකරන්න. එසේම, ඔබලාගෙන් සමහරුන් තවත් සමහරයන් ගැන කේළාම් නොකියන්න. ඔබලාගෙන් කවරෙකු හෝ නැසීගිය තම සහෝදරයාගේ මාංශ අනුභව කිරීමට ප්‍රිය වන්නෙහිද ? (නැත) එය ඔබලා පිළිකුල හඟවමින් අප්‍රිය කරති' *(අල්කුර්ආන්-49-12)* යනුවෙන්ද,

'විශ්වාස වන්තයිනි, එක් සමාජයෙකු තවත් සමාජයක් කෙරෙහි විහිළු නොකරනු. මක්නිසාදයත්, (විහිළුවට ලක් වුවත්) මවුන්ට වඩා ශ්‍රේෂ්ඨයන් විය හැක. (එසේම) කිසි යම් ස්ත්‍රීන් වෙනත් ස්ත්‍රීන් කෙරෙහි (විහිළු නොකරනු) මක්නිසාදයත්, මවුහු මවුන්ට වඩා ශ්‍රේෂ්ඨ වන්තීන් විය හැක. තවද, ඔබලා පරස්පරව කෙනෙකු අනෙකුට නින්දා නොකරන්න. (ඔබලා) කෙනෙකු අන් කෙනෙකු පරස්පරව (නරක) විකට නම්වලින් නොකැඳවන්න. විශ්වාසය කළා

යින් පසු (එසේ නරක) විකට නම් තැබීම දුශ් චරිතයෙකි. කවරෙකු හෝ (මෙයින්) පාපොච්චාරණය නොකළේනම්, අපරාධකරුවන් හෙතම මවුන්මයවේ' *(අල්කුර්ආන්-49:11)* යනුවෙන්ද පවසන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා 'කේළාම් කීම යනු කුමක් බව ඔබලා දැන සිටින්නේද ?' යනුවෙන් විමසූ කළ එතු මාගේ ශ්‍රාවකරුවන් 'මේ ගැන දැන සිටින්නේ හෙතම අල්ලාහ් හා ඔහුගේ දූතයාය' යනුවෙන් කීහ. එවිට නබි තුමා 'කේළාම් කීම යනුවෙන් හැඳින්වන්නේ, ඔබ සහෝද රයා ගැන ඔහු අප්‍රියවන දේ කීමකි' යනුවෙන් පැවැසීය. එවිගස මා, 'මා පවසන කරුණු මාගේ සහෝදරයා වෙත තිබේනම් කුමක් සිතන්නේද ?' යනුවෙන් විමසීමි. එයට එතුමා 'ඔබ පවසන කරුණු ඔහු මත තිබේනම්, නිසැක යෙන්ම, ඔබ කේළාම් කීවෙය. ඔබ පැවැසූ දේ ඔහු මත නොවන්නේනම්, ඔබ ඔහුට දොස් පද කීවෙය' යනුවෙන් පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, නබිනායක තුමා තම අවසන් හජ් කර්තව්‍යය ඉටු කළ සමයේ මිනිසුන් අමතමින් කළ දේශනයෙහි '...ඔබ ලාගේ ප්‍රාණයන්, ඔබලාගේ සම්පත් හා ඔබලාගේ නම්බුව යනාදීන් කෙරෙහි හානි කිරීම ඔබලා අතර පරස්පරව තහනම්ය..' යනුවෙන් පැවැසූ බව අබී බක්රත් (රලි) තුමා තම පියාගෙන් සවන් දුන් බව වාර්තා කරන්නේය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, 'කේලාම් කියන්නන් ස්වර්ගයෙහි නොපිවිසෙති' යනුවෙන් නබිනායක තුමා පැවැසූ බව හුදෛෆා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

13-මඟු ජීවතුන් අතර සිටිනකල හෝ මඟු නැසීගිය පසු හෝ මඟුට නොබැණිය යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'මුස්ලිම්වරයෙකුට බැණීම පාප ක්‍රියාවෙකි. මඟුව ඝාතනය කිරීම දේව ප්‍රතික්ෂේප කිරීමකි' යනුවෙන් පැවැසූ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමාද, 'නැසීගිය අයට නොබණින්න. මන්දයත්, මවුන් කළ දේ කෙරෙහි කුලිය මවුන් ලබාගෙන සිටිති' යනුවෙන් පැවැසූ බව ආයිෂා (රලි) තුමියද වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

14-මඟු ගැන ඊර්ෂයා කිරීම, වැරදි ආකල්ප ගැනීම, වෛරය කිරීම හා මඟු ගැන ගැඹුරෙන් සමීක්ෂණය කිරීම යනාදීන් නොකල යුතුයි. මක්නිසාදයත්, අල්ලාහ් 'විශ්වාසවන්තයිනි, (සැක සහිත) අධික සිතුවිලිවලින් මබලා වැළකී සිටින්න. මන්දයත්, සිතුවිල්ලෙහි උදාවන සමහරයන් පාපයන් ලෙස පවති. (එසේම, අන් අයගේ අඩුපාඩු ගැන) සමීක්ෂණය නොකරන්න' යනුවෙන් පවසයි. *(අල්කුර්ආන්-49-12)*

15-මඟුව රැවටීම, මඟුට ද්‍රෝහිකම් කිරීම හා මඟුව අසත්‍ය කිරීම තහනම්ය. මන්දයත්, අල්ලාහ් 'කවරෙකු විශ්වාසනීය පිරිමින් හා විශ්වාසනීය ස්ත්‍රීන් හට මවුන් නොකළ කාර්ය යක් කෙරෙහි නින්දා කරන්නේද, මවුහු නිසැකයෙන්ම, දොස් පද හා ප්‍රසිද්ධ පාපයන් උසුලාගෙන සිටින්නෝය' *(අල්කුර්ආන්-33-58)* යනුවෙන් පවසන්නේය.

එසේම, නබිනායක තුමා 'කවරෙකු කෙරෙහි ගුණාංග සත රක් පවතින්නේද, මඟු පැහැදිලි කුහකයාය. කවරෙකු මත

මත එයින් එක් ගුණාංගයක් තිබී, මහු එයින් ඉවත්වන තෙක් මහු කුහකමෙහි එකී ගුණාංගයෙහිම සිටී. ඒවා, මහු විශ්වාස කළාතම් ද්‍රෝහිකම් කරයි. මහු යමක් ප්‍රකාශ කළාතම් අසත්‍යයම ප්‍රකාශ කරයි. මහු ගිවිසුමක් කළාතම් එය බිඳ දමයි. මහු තර්ක කළාතම් පාපයෙහි පිවිසේ' යනුවෙන් පැවසූ බව අබ්දුල්ලාහ් බින් අම්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

16-මහු හා සමග යහපත් සාර ධර්මයෙන් හැසිරීම. එනම්, මහුට උපකාර කිරීම මහුට හිරිහැර නොකිරීම, මුහුණේ ප්‍රබෝධයෙන් මහුව මුණ ගැසීම, මහු කරන උපකාරයන් පිළිගැනීම, මහුගෙන් සිදුවන වැරදීන් කෙරෙහි සමාව දීම හා මහුට කළ නොහැකි කාර්ය නොපැවරීම යනාදී ගුණ ධර්මයෙන් මහු හා සමග හැසිරිය යුතුයි. මන්දයත්, නබි නායක තුමා 'ඔබ කුමන ස්ථානයක සිටියද, අල්ලාහ් කෙරෙහි බියබැතිසිතින් සිටින්න. අකුසලක් සිදුවූ විගස කුසලක් ඉටු කරන්න. එය (කුසල) අකුසල විනාශ කර දමයි. ඔබ මිනිසුන් අතරෙහි සාරධර්මයෙන් හැසිරෙන්න' යනුවෙන් පැවසූ බව අබුදර් (රලි) තුමා වාර්තා කරන් නේය. *(බුහාරි හා හාකිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

17-මහු තමාට වඩා වැඩිහිටියෙකුනම් මහුට ගරු කළ යුතුයි. මහු තමාට වඩා බාලයෙකුනම් මහුට ආදරය කළ යුතුයි. මන්ද, නබිනායක තුමා 'අප වැඩිහිටියන් ගරු නොකරන්නාද, අප බාලයන්ට ආදරය නොකරන්නාද අපේ අය නොවන්නාය' යනුවෙන් ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරයි. *(අබුදාවූද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

# කාෆිර්වරුන් කෙරෙහි සාරධර්ම

ඉස්ලාම් හැර අන් සියලු ආගම් අසත්‍ය බවද, ඒවා අනුගමනය කරන්නන් කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරන්නන් ලෙසද, ඉස්ලාම් ධර්මය පමණක් හෙතම සත්‍ය ආගම බවද, එය පිළිගෙන අනුගමනය කරන්නන් පමණක් විශ්වාසනීය මුස්ලිම්වරුවන් බවද මුස්ලිම්වරයා විශ්වාස කළ යුතුයි. කුමක් නිසාදයත්, අල්ලාහ් 'සැබැවින්ම, අල්ලාහ් වෙත පිළිගත් ආගම නම්, හෙතම එය ඉස්ලාමය වේ' *(අල්කුර්ආන්-3:19)* යනුවෙන්ද, 'ඉස්ලාමය හැර අන් කිසියම් ආගමක් කවරෙකු හෝ ප්‍රිය කරන්නේනම්, (එය) කිසි විටක මහුගෙන් පිළිගනු නොලැබේ. (මෙවන්) අය පරලෝ දිනයෙහි අලාභකරුවන් අතරෙහි සිටිති *(අල්කුර්ආන්-3:85)* යනුවෙන්ද පවසන්නේය.

එනිසා, අල්ලාහ්ගේ ආගමවූ ඉස්ලාම් ධර්මය පිළිනොගෙන සිටින සැම දෙන කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරුවන් බව මුස්ලිම්වරයා පිළිගත යුතුයි. මවුන් සමග පහත සඳහන් සාර ධර්මයෙන් හැසිරිය යුතුයි.

1-මහුගේ දේව ප්‍රතික්ශේපය පිළිගැණිම හෝ එය කෙරෙහි තෘප්තියක් හෝ නොවිය යුතුයි. මන්දයත්, දේව ප්‍රතික් ශේපය කෙරෙහි තෘප්තිවීම දේව ප්‍රතික්ශේප කිරීමකි.

2-අල්ලාහ් මහු කෙරෙහි අප්‍රිය කරන සේ මුස්ලිම් වරයාද මහුව අප්‍රිය කළ යුතුයි. මන්ද යත්. ප්‍රිය වීම හා අප්‍රි යවීම අල්ලාහ් කෙරෙහි පමණක් විය යුතුයි. මහු අල්ලාහ්ව ප්‍රතික් ශේප කරන කළ අල්ලාහ් මහු කෙරෙහි අප්‍රියවන හෙයින් මුස්ලිම්වරයාද මහු කෙරෙහි අප්‍රිය විය යුතුයි.

3-ඔහුව ප්‍රිය වීම හා ඔහු සමග මිත්‍රත්වය පැවැත්වීම නොකළ යුතුයි. මක්නිසාදයත්, අල්ලාහ් 'දේව විශ්වාසීන් තමන් සේ දේව විශ්වාසීන් හැර (කිසි සේත්) දේව ප්‍රතික්ශේප කරන්නන් සහකාරයන් ලෙස තෝරාගත නොයුතුයි' *(අල්කුර්ආන්-3:28)* යනුවෙන්ද

'නබිතුමනි, අල්ලාහ්ව හා පරලොව දිනය කෙරෙහි විශ්වාස කරමින් සිටින සමාජයින් අල්ලාහ් හා ඔහුගේ දූතයාට විරුද්ධකම් කරන්නන් කෙරෙහි ප්‍රිය කරන්නන් ලෙස ඔබ නොදිටී. එවන්නන් තම දෙමාපියන් හෝ තම පුත්‍රයන් හෝ තම සහෝදරයන් හෝ තම පවුල් ඥාතීන් හෝ වෙවා විය හැක' *(අල්කුර්ආන්-58:22)* යනුවෙන්ද පවසයි.

4-ඔහු මුස්ලිම්වරුන්ට එරෙහි සටන් කරන්නෙකු නොවන්නේ‌ම්, ඔහු හා සමග යුක්ති සහගතව හා සාධාරනත් වයෙන් හැසිරිය යුතු අතර, ඔහුට කුසල් හා උපකාර කළ යුතුයි. මක්නිසාදයත්, අල්ලාහ් 'ධර්මය පිළිබඳ කරුණු කෙරෙහි කවරෙකු ඔබලා සමග සටන් නොකර හා ඔබලාව ඔබලාගේ නිවසින් පිටමන් නොකර සිටින්නේද, මවුන්ට කුසල් කිරීමද මවුන් කෙරෙහි යුක්ති සහගතව හැසිරීමද අල්ලාහ් නොවළක් වන්නේය. අල්ලාහ් යුක්ති සහගතව හැසිරෙන්නන් ප්‍රිය කරන්නේය' *(අල්කුර්ආන්-60:8)* යනුවෙන් පවසන්නේය.

5-පොදුවෙන් සැම දෙනා සමග හැසිරෙන සේම ඔහු හා සමගද හැසිරිය යුතුයි. එනම්, ඔහුට කුස ගින්න ඇතිවන කළ ඔහුට ආහාර සැපයීම, පිපාසය ඇතිවන කළ ජලය ලබාදීම, ඔහු ලෙඩවූ කළ ඔහුට ප්‍රතිකාර ලබා දීම හෝ එම විපාකයෙන් ඔහුව රැක ගැනීම හා ඔහුට සිදුවන දුක්

පීඩාවලින් ඔහුව ආරක්ෂා කිරීම යනාදි සාරධර්මයන් හැසි රිය යුතුයි. නබිනායක තුමා මේ බව 'ඔබ පොලෝ තලය මත සිටින්නන්ට ආදරය දක්වන්න. අහසෙහි සිටින්නන් ඔබට ආදරය දක්වති' යනුවෙන් පැවැසූ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා වාර්තා කරයි. *(තබරානි හා හාකිම් ඇසුරෙනි)*

6-ඔහු මුස්ලිම්වරුන් කෙරෙහි සටන් කරන්නෙකු නොවන් නේනම්, ඔහුගේ සම්පත් හා නම්බුවට කිසියම් අපරාධයන් සිදු කළ නොයුතුයි. මන්දයත්, අල්ලාහ් පැවැසූ බව නබි නායක තුමා 'මාගේ දාසයිනි, අපරාධ කිරීම මා මාහටම තහනම් කළෙමි. එසේම, එය ඔබලා අතරද, තහනම් කළෙමි. එබැවින්, ඔබලා කෙනෙකු අනෙකුට පරස්පරව අපරාධය නොකරන්න..' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූදර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

7-ඔහුට තෑගි බෝග ලබා දීම, ඔහුගෙන් තෑගි බෝග පිළිගැනීම හා ඔහු ක්‍රිස්තියානි හෝ යුදෙව් වරයෙකුනම් ඔහුගේ (ඉස්ලාමයට පටහැනි නොවන) ආහාරයෙන් අනුභව කිරීම යනාදීන් අනුමත වේ. මේ බව අල්ලාහ් 'ආගම් ලද අය (යුදෙව් හා ක්‍රිස්තියානින්)ගේ ආහාරයන් ඔබලාට අනුමතවේ' *(අල්කුර්ආන්-5:5)* යනුවෙන් පවසයි. එසේම මදීනාවෙහි එක් යුදෙව්වරයෙකු කළ ඇරයුම පිළි ගත් නබිතුමා ඔහු සැපයූ ආහාරය අනුභව කළේය.

8-ඔහුට විශ්වාසනීය ස්ත්‍රිය විවාහකර නොදිය යුතුයි. ප්‍රතික් ෂේප කරන්නා ආගම් ලද යුදෙව් හෝ ක්‍රිස්තියානි ස්ත්‍රී යෙකුනම් ඇයට මුස්ලිම් පිරිමියෙකු හා සමග විවාහ විය හැක. මේ බව අල්ලාහ් 'අල්ලාහ්ට ආදේශ කරන ස්ත්‍රීන් (අල්ලාහ්ව) විශ්වාසය කරන තෙක් කිසියම් අවස්ථාවක

හෝ මවුන් හා සමග ඔබලා විවාහ නොවන්න' *(අල්කුර්ආන්-2-221)* යනුවෙන්ද,

'විශ්වාසනීය යහපත් ශීල ස්ත්‍රීන් හා ඔබලාට පෙර ආගම් පිරිනමනලද ස්ත්‍රීන් ගණිකාවන් ලෙස හෝ අනියම් භාර්යාවන් ලෙස හෝ නොපවත්වා ඔවුන්ට (මනාලියට අනිවාර්යයෙන් පිරිනැමිය යුතු තෑග්ගවූ) මහරය ලබාදී ඔවුන්ව විවාහ කර ගැනීම ඔබලාට අනුමතවේ' *(අල්කුර්ආන්-5:5)* යනුවෙන්ද පවසන්නේය.

9-මඅු කිඹුහුමක් යවා අල්හම්දු ලිල්ලාහ් (ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමිවේ) යනුවෙන් පැවසූ කළ එයට පිළිතුරක් වශයෙන් යහ්දීකුමුල්ලාහ් වයුස්ලිහු බාලකුම් (අල්ලාහ් ඔබලාට යහමග පෙන්වනු මැනවි. ඔබලාගේ කාර්යයන් ශීලාචාරය කරනු මැනවි) යනුවෙන් කිව යුතුයි. මක්නිසාද යත්, යුදෙව් වරුන් නබි නායක තුමා 'යර්හමුකල්ලාහ්' (අල්ලාහ් ඔබලාට භාග්‍යයන් ලබාදෙනු මැනවි) යනුවෙන් තමන්ට කිව යුතු යනු අපේක්ෂාවෙන් එතුමාගේ ඉදිරියෙහි කිඹුහුම් යවන කළ 'අල්හම්දු ලිල්ලාහ්' යනුවෙන් කියති. නමුදු, නබිතුමා එවන් අවස්ථාවල 'යහ්දීකුමුල්ලාහු වයුස් ලිහු බාලකුම්' (ඔබට අල්ලාහ් සුමග පෙන්වනු මැනවි. ඔබ ලාගේ කාර්යයන් ශීලාචාර කරනු මැන) යනුවෙන් පවසයි.

10-අභිබවා ගොස් මඅුට සලාමය නොකිව යුතුයි. නමුත් මඅු සලාමය පැවැසූවේද, 'වඅලෛකුම්' (ඔබට එසේම ලැබෙනු මැනවි) යනුවෙන් පිළිතුර දිය යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'ආගම් ලද අය (යුදෙව් හා කිතුමතුන්) ඔබලාට සලාමය පැවැසූවේද, ඔබලා 'වඅලෛකුම් යනුවෙන් පවසන්න'

යනුවෙන් ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

12-සිරිත් විරිත්වල හා චාරිත්‍ර වාරිත්‍රවල ඔවුන්ට පටහැනිව හා ඔවුන්ට සමානවීමෙන් තොරව තම සිරිත් විරිත් හා චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කළ යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'කවරෙකු කුමන සමාජය කෙරෙහි සමානව සිටින් නේද, ඔහු එම සමාජයෙහිම කෙනෙකු වේ' යනුවෙන් ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

# ප්‍රාණීන් කෙරෙහි සාරධර්ම

ලොවෙහි ජීවත්වන අධික ප්‍රාණින් ගෞරවණීය නිර්මාන යන් ලෙස සිතා මුස්ලිම්වරයා ඒවාට ආදරය කළ යුතු අතර, ඒවා හා සමග පහත සඳහන් සාරධර්මයෙන් හැසිරිය යුතුයි.

1-ඒවා කුස ගින්නට හා පිපාසයට ලක්වූ කළ ආහාර පාන යන් ලබා දිය යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'තෙත ගතිය යුත් අක්මාව ලද සෑම දේට කුලිය තිබේ' යනු වෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

2-ඒවාට ආදරය හා ප්‍රිය දැක්විය යුතුයි. මන්දයත්, ඉබ්නු මස්ඌද් (රලි) තුමා 'අපි නබිනායක මුහම්මද් (සල්) තුමා සමග ගමනක යෙදී සිටිමු. එතුමා තම අවශ්‍යතාවයක් සඳහා පිටතට ගියේය. එවිට අපි පැටවී දෙන්නෙක් සමග කුරුල්ලෙක් දැක එම පැටවුන් අපි පිටතට ගත්තෙමු. වහාම එම මව කුරුල්ලා තැති ගෙන අත් තටු ගසන්නට විය. එවිට නබිතුමා පැමිණ 'මෙම පැටවී වෙන්කර මව

කුරුල්ලා වේදනා කළේ කවරෙකුද ? වහාම එකී පැටවුන් මව වෙතම තබන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව පවසන් නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

3-ඒවා කපන කළ හෝ ඝාතනය කරනකළ වදහිංසා නොකළ යුතුයි. මේ ගැන නබිනායක (සල්) තුමා 'තිසැකව, අල්ලාහ් සැම දේ කෙරෙහි උපකාර කරන මෙන් අණකර ඇත. ඔබලා ප්‍රාණීන් ඝාතනය කරන කළ යහපත් ශීලයෙන් ඝාත නය කරන්න. ඒවා කපන කළ යහපත් ශීලයෙන් කපන්න. කැපීමට ලක්වන ප්‍රාණීන්ට වද හිංසා නොකරන්න. කපන පිහිය තියුණුවෙන් තබා ගන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව ෂද්දාද් බින් අව්ස් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

4-කිසියම් ක්‍රමයකින් හෝ ඒවා වද කළ නොයුතුයි. කුස ගින්නෙන් තැබීම හෝ පහර දීම හෝ ඉසිලීමට නොහැකි බර ඒවා මත පැටවීම හෝ ඒවා කෲර ලෙස මැරීම හෝ ගින්නෙන් පිලිස්සීම නොකළ යුතුයි. මන්දයත්, 'කාන්තා වක් බළලෙකු බැඳ තබා එයට ආහාර පානයන් නොදී ඒවා කැම සැවීම සඳහා පිටත යාම වළක්වා වදකර මැරූ හේතුවෙන් ඒ කාන්තාව අපායට පිවිසීය' යනුවෙන් නබි නායක තුමා පැවැසූ බව උමර් (රලි) තුමා වාර්තා කරන් නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම, කුඹියන් සිටින තැනක යාබදව ගමන් කරන කළ ඒවා ගින්නෙහි පිළිස්සා තිබීම දුටු නබිනායක තුමා 'ගින්න මවා නිර්මානය කළ දෙවියා හැර අන් කවරෙකු හෝ ගින්නෙන් වේදනා කළ නොහැක' යනුවෙන් පැවැසීය.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

5-වෙරි බල්ලා, වෘකයා, සර්පයා, ගෝනුස්සා හා මීයා යනාදි (මිනිසුන්ට) හානි සිදුකරන ප්‍රාණීන් ඝාතනය කිරීමට හැක. නබිනායක තුමා මේ බව 'හානිය ඇති කරන ප්‍රාණීන් පසක් (මක්කාවේ) හරම් මායිමෙහිද වෙනත් තැන්වලද ඝාතනය කිරීමට අනුමතකි. ඒවා සර්පයා, කලු සුදු කපුටා, මීයා, වෙරි බල්ලා හා රාජාලියා යනාදීන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)* වෙනත් ග්‍රන්ථයක ගෝනුස්සා ඝාතනය කරන ලෙසද එයට ශාපකරන ලෙසද වාර්තාවේ.

6-හඳුනාගැනීම වැනි හේතූන් මත එළුන්, ගවයන් හා ඔටුන් යනාදි සිව්පාවන්හි කණ්වල සළකුණක් වශයෙන් හාංවඩු ගැසීමට හැක. මක්නිසාදයත්, 'නබිනායක තුමා සකාත යට අයත් ඔටුවෙකුට තම අතින්ම සළකුණක් වශයෙන් හාංවඩු ගැසීය. සිව්පාවන් හැර අන් සතුන් කෙරෙහි මෙසේ හාංවඩු ගැසීම තහනම්ය. මන්දයත්, මුහුණෙහි හාංවඩු ගසා තිබූ බූරුවකු දුටු නබිනායක තුමා 'මෙකී මුහුණෙහි හාංවඩු ගැසූ තැනැත්තාට අල්ලාහ් ශාප කරන්නේය' යනු වෙන් ප්‍රකාශ කළේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

7-ඒවා වෙනුවෙන් සකාතය අනිවාර්යවී ඇත්නම් එය සුදුස් සන්ට ලබාදීම මගින් ඒවා කෙරෙහි අල්ලාහ් වෙනුවෙන් කළ යුතු අනිවාර්ය කරුණු ඇති බව දැනගත යුතුයි.

8-අල්ලාහ්ට කළයුතු වන්දනාමානයන් අගය නොකොට හා ඔහු සිහිකිරීම නොසළකා ඒවා කෙරෙහි යොමුවිය නොයුතුයි. අල්ලාහ් මේ ගැන 'විශ්වාසිනි, ඔබලාගේ දරුවන් හා ඔබලාගේ ධනයන් අල්ලාහ් සිහිකිරීම කෙරෙහි ඔබලාව නොසැළකිලිමත් නොකරනු' *(63:9)* යනුවෙන් පවසයි.

එසේම නබිනායක තුමා මේ පිළිබඳ දීර්ග හදීසයක් මෙසේ පවසන්නේය.

'අශ්වයන් කරුණු තුනක් මත පරිහරණය කරනු ලැබේ. ඒවා කෙනෙකුට කුලිය ලබාදෙන සේද, තවත් කෙනෙකුට (අපායට) තිරයක් වශයෙන්ද, වෙනත් කෙනෙකුට පවක් වශයෙන්ද පවතී.

කවරෙකු අල්ලාහ්ගේ මගෙහි (සටන් කිරීමේ චේතනාවෙන් අශ්වයෙක් ඇති කර එය මේච්චල් කිරීම සඳහා) පැලැටීන් ඇති තැනක දීර්ග ලණුවකින් බැඳ දමන්නේද, එය එතැන් සිට කුමන දුර ප්‍රමාණයක් මේච්චලට ගියත් එතරම් ප්‍රමාණ කුලියක් මහුට ලැබේ. එය ලණුව කඩාගෙන වතාවක් හෝ දෙවතාවක් සැම තැනම වට කළද, එය තබන සැම අඩියක් සඳහාද එයගේ සැම කසලයක් සඳහාද මහුට කුලිය ලැබෙන්නේය. එයට ජලය පෙවීමේ අදහසක් මහුට නොමැති වුවත් එය කුමන ගඟකට ගොස් හෝ ජලය පානය කළේද එයටද මහුට කුලිය ලැබේ.

කවරෙකු අන් අයගෙන් සිඟා නොකා ස්ව ගෞරවයෙන් සිය ජීවිතය ගත කිරීම සඳහා අශ්වයෙක් ඇතිකර, අල්ලාහ්ගේ අණට කීකරුවී එයට තමා කළ යුතු වගකීම් සියල්ල නිසියාකාරව ඉටු කරන්නේද මහුට එය අපායෙන් තිරයක් ලෙස පවතී.

කවරෙකු ආඩම්බරයට හෝ මුනිච්චාවට හෝ මුස්ලිම්වරුන්ට විරුද්ධකම් පවත්වීමට හෝ අශ්වයක් ඇති කරන්නේද, එම අශ්වයා මහුට පවක් ලෙස පවතී'. මෙය අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරයි. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

මේවා සියල්ල අල්ලාහ් හා නබිනායක තුමා පෙන්වා දුන් මග අනුගමනය කරමින් මුස්ලිම්වරයෙකු ප්‍රාණීන් කෙරෙහි හැසිරිය යුතු සාරධර්මයන්ය. සෑම නිර්මාතයන් කෙරෙහි පොදු ධර්මයක්වූ ඉස්ලාමය මෙසේ ක්‍රියාවෙහි යෙදෙන මෙන් අණ කරයි.

# සභාවෙහි සාරධර්ම

මුස්ලිම්වරයා තම පුරා ජීවිතයම ඉස්ලාමයේ මගපෙන්වීමට යටත්ව එය අනුගමනය කරමින් ගතකළ යුතුයි. ඉස්ලාමයේ එම මගපෙන්වීම මුස්ලිම් වරයා සභාවෙහි අසුන් ගැනීම හා තම සහෝදරයන් අතර අසුන් ගැනීමේ ක්‍රමය ඇතුළු මහුගේ සිය ජීවිතයේ සෑම ක්‍රියාවන්ද අන්තර්ගතව පවතී. එබැවින් මුස්ලිම් වරයා සභාවෙහි අසුන් ගන්නා කළ පහත සඳහන් සාරධර්මයන් පිළිපැදිය යුතුයි.

1-සභාවෙහි අසුන් ගැනීමට අදහස් කරන කළ ප්‍රථමයෙන් එකී සභාවෙහි අසුන්ගෙන සිටින්නන්ට සලාමය පවසා පසුව අසුන් ගත යුතුයි. එසේ සභාවෙහි අසුන්ගෙන සිටින කවරෙකු හෝ නැගිට්ටවමින් එකී ස්ථානයෙහි තමා අසුන් නොගෙන යුතුයි. එසේම දෙන්නෙකු අසුන්ගෙන සිටින කළ ඔවුන්ගේ අනවසරයෙන් ඔවුන් අතරෙහි අසුන් ගැනීම තහනම්ය. මන්දයත්, නබිතුමා 'ඔබලාගෙන් කවරෙකු හෝ සභාවෙහි අසුන්ගෙන සිටින කෙනෙකු නැගිට්ටවා එකී ස්ථානයේ මහු අසුන් නොගන්න. නමුත්, සභාව විශාලත්ව කර ගන්න' යනුවෙන් පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

ඉබ්නු උමර් (රළි) තුමා තමා වෙනුවෙන් කෙනෙකු සිය අසුනෙන් නැගිටී සිටී කළ එතුමා එකී අසුනෙහි අසුන් නොගත්තේය. මක්නිසාදයත්, නබිනායක තුමා 'සභාවෙහි දෙන්නෙකු අතරෙහි ඔවුන් දෙදෙනාගෙන් අවසරයෙන් තොරව අසුන් ගත නොයුතුයි' යනුවෙන් ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රළි) තුමා වාර්තා කරන්නේය.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

2-පුද්ගලයෙකු සභාවෙහි තම අසුනෙන් නැගිට්ට පිටත්වී නැවත පැමිණිවිට එම අසුනට හිමි කාරයා හෙතම මඟුමය. මක්නිසාදයත්, නබිනායක තුමා 'ඔබලාගෙන් කෙනෙකු සභාවක සිය අසුනෙන් නැගිට්ට ගොස් නැවත පැමිණිවිට එම අසුනට හිමිකාරයා හෙතම මඟුමය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රළි) තුමා වාර්තා කරන්නේය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

3-සභාවක මාධ්‍යයෙහි අසුන් ගැනීම තහනම්ය. මන්දයත්, සභාවක මාධ්‍යයෙහි අසුන් ගන්නාට නබි නායකතුමා ශාප කළ බව හුතෛෆා (රළි) වාර්තා කරන්නේය.

*(අබූදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)*

4-සභාවක අසුන්ගෙන සිටිනවිට අදාල සාරධර්මයන් අනුගම නය කළ යුතුයි. එනම්, දත් කැණීම, නාහයතුල ඇඟිලි දැමීම, කෙළ ගැසීම හා කෑරීම යනාදීන් නොකිරීමද, අධි කව සෙලවීමෙන් තොරව සෙනසීමෙන් සිටිමද කතාබහක යෙදෙන කළ සත්‍යයම පැවැසීමද තමා ගැන හෝ තම පරම්පරාව ගැන හෝ අඩම්බරයෙන් ප්‍රකාශ නොකිරීමද අන් අය කතා කරන කළ එය ශ්‍රවණයකර සවන්දීමද, සභාවෙහි ප්‍රකාශ කරන්නාට බාධා නොකිරීමද සභාවෙහි

සාරධර්මයන්ය. මුස්ලිම් වරයා මෙම සාරධර්මයන් කරුණු දෙකක් මත අනුගමනය කළ යුතුයි. එකක්, මුස්ලිම් වරයෙකුට හිරිහැර කිරීම තහනම් බැවින් තම ක්‍රියාවෙන් හෝ හැසිරීමෙන් තම සහෝදරයාට හිරිහැර නොකිරීම සඳහාය. මන්දයත්, නබිනායකතුමා 'කවරෙකුගේ දිවෙන් හා අතින් පිටස්තර මුස්ලිම්වරුන් හිරිහැරයෙන් තොරව නිදහසින් සිටින්නෝද, සත්‍ය මුස්ලිම්වරයා හෙතම මනුම යවේ' යනුවෙන් පවසන්නේය.

දෙවනුව, තම සහෝදරයින්ගේ ආදරය හා ප්‍රිය ලබාගැනීම සඳහාය. මන්දයත්, මුස්ලිම්වරුන් අතර පරස්පර ආදරයෙන් හා ප්‍රීයෙන් ආශ්‍රය කරන මෙන් ඉස්ලාමය අණ කරන්නේය.

# ගමන් මාර්ගයෙහි සාරධර්ම

**ගමන් මාර්ගයෙහි අසුන් ගැනීමට සිදුවූ කළ පහත සඳ හන් සාරධර්මයන් අනුගමනය කළ යුතුයි.**

1-තම බැල්ම පහත හෙලිය යුතු අතර, අන් ස්ත්‍රීන් කරා තම බැල්ම යොමු කිරීමෙන්ද වැළකී සිටිය යුතුයි. එසේම, කව රෙකු කෙරෙහි හෝ අහංකාරයෙන් හෝ නින්දිත වශයෙන් හෝ නොබැලිය යුතුයි.

2-මගීන්ට බැණීම, දොස්පද කීම, නින්දිත වචන පැවැසීම, අඬුපාඩු කීම, පහර දීම, ඔවුන්ගේ අතේ මිටේ ඇති දේ උදුරා ගැනීම, මාර්ගය මාධ්‍යයෙහි සිට ඔවුන්ට බාධා කිරීම, මංකොල්ල කෑම යනාදී කිසිඳු අවහිර හෝ නොකළ යුතුයි.

3-මගීන් තමාට පවසන සලාමයට පිළිතුරු දිය යුතුයි. සලාම යට පිළිතුරු දීම අනිවාර්යවේ. මේ බව අල්ලාහ් 'ඔබලාට

සලාමය පවසනවිට එයට පිළිතුරු ලෙස එයට වඩා අලංකාරමත් (වචනවලින්) සලාමය පවසන්න. නොඑසේනම්, එයම නැවත පවසන්න' යනුවෙන් පවසයි. *(අල්කුර්ආන්-4:86)*

4-තම ඉදිරියෙහි කුසලක් වැළක්වූ කළ හෝ නොසැළකුවිට ඒ අවස්ථාවේ එම කුසල ඉටුකරන මෙන් අණ කිරීම ඔහුගේ වගකීමකි. මන්දයත්, කුසල් කෙරෙහි අණ කිරීම සෑම මුස්ලිම් වරයෙකුටම අනිවාර්යවේ.

උදාහරණයක්නම්, සලාතය සඳහා අදානය (කැඳවීම්) කියන කල, සභාවෙහි සිටින්නන් හෝ මාර්ගයෙහි සිටින්නන් කවරෙකු හෝ සලාතය සඳහා නොපැමිණියේනම්, සලාතය කෙරෙහි ඔවුන්ට අණ කිරීම ඔහුට අනිවාර්යවේ.

5-තම ඉදිරියෙහි අකුසලක් සිදුවන කළ එය වළක්වා සිටීම ඔහුගේ වගකීමකි. මන්දයත්, කුසල් කෙරෙහි අණකිරීම සේම, අකුසල කෙරෙහි වළක්වාලීමද සෑම මුස්ලිම්වරයෙකුටම අනිවාර්යවේ. නබිනායක තුමා 'ඔබලාගෙන් කවරෙකු හෝ අකුසලක් දුටුවිට එය තම අතින් වළක්වනු. එයට අපහසු වන්නේනම්, එය තම දිවෙන් වළක්වනු. එයටද අපහසු වන්නේනම්, එය තම සිත්සතනින් පිළිකුල හඟවමින් වළක්වනු. විශ්වාසයෙහි අසරණම ස්ථාවරය හෙතම මෙයවේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූසරද් (රලි) තුමා වාර්තා කරන්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

උදාහරණයක්නම්, පුද්ගලයෙකු සීමා ඉක්මවා ගොස් තවත් කෙනෙකුට පහර දෙන්නේනම් හෝ ඔහුගේ අතේ මිටේ ඇති දේ උදුරා ගන්නේනම්, තම සක්තිය මත එය වැළක් වීම ඒ අවස්ථාවේ ඔහුට අනිවාර්යවේ.

6-ගමන් මග වැරදිවීමෙන් මගපෙන්වන මෙන් කරන ඉල්ලීම අගයකොට මඟුට මග පෙන්විය යුතුයි. මේ සියල්ල නබි නායක තුමාගේ ජීවන මගෙන් ලැබී ඇති සාරධර්මයන්ය. නබිනායක තුමා ප්‍රකාශ කළ වදනක් අබූ සර්ද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'ගමන් මාර්ගයන්හි අසුන්ගැනීම කෙරෙහි මා අවවාද කරමි' යනුවෙන් නබිනායක තුමා පැවැසූකළ, සහාබාවරුන් 'එය අපි අසුන්ගෙන කතාබහවල යෙදෙන ස්ථානයකි. එය හැර අපිට වෙනත් ස්ථානයක් නොවන්නේය' යනුවෙන් කීහ. එවිට එතුමා 'ඔබලා එහි අසුන්ගෙනම සිටිය යුතුනම්, මාර්ගයට කළයුතු වගකීමයන් ඔබලා ඉටු කරන්න' යනු වෙන් පැවැසීය. පසුව ඔවුහු 'මාර්ගයට කළ යුතු වගකීම් කුමක්ද ?' යනුවෙන් විමසූහ. ඒවිට එතුමා '(අන් ස්ත්‍රීන් කරා නොබලා) බැල්ම පහත හෙලීම, (අන් අයට) හිරිහැර නොකර සිටීම, සලාමයට පිළිතුරු දීම, කුසල් කෙරෙහි අණ කිරීම හා අකුසල් කෙරෙහි වැළකීම යනාදීන්ය' යනුවෙන් පැවැසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

වෙනත් වාර්තාවල නොමග යන අයට නිවැරදි මාර්ගය පෙන්වන මෙන්ද සටහන්ව ඇත.

සභාවක අසුන්ගෙන සිට (අවසානයෙන්) නැගිට්ට යනවිට අල්ලාහ්ගෙන් පාප සමාව අයැදීමද සභාවෙහි හැසිරිය යුතු සාරධර්මයෙකි. මක්නිසාදයත්, එම සභාවෙහි යම් වැරදීම් සිදුවුවද එය එයට ප්‍රතිකාරයක් ලෙස පවතී. නබිනායක මුහම්මදු (සල්) තුමා සභාවක සිට සමුගැනීමට අදහස් කරන විට....

سُبْحَانَكَ اللَّهُمَّ وَبِحَمْدِكَ أَشْهَدُ أَنْ لاَ إِلَهَ إِلاَّ أَنْتَ أَسْتَغْفِرُكَ وَأَتُوبُ إِلَيْكَ

'සුබ්හාන කල්ලාහුම්ම වබි හම්දික අෂ්හදු අල් ලාඉලාහ ඉල්ලා අන්ත අස්තග්ෆිරුක වඅතූබු ඉලෛක්' යනුවෙන් පැවැසීය. එවිට පුද්ගලයෙකු 'නබිතුමාණෙනි මීට පෙර ඔබතුමා නොපැවැසූ දෙයක් (දැන්) පවසන්නේය. එය කුමක්ද ? යනුවෙන් විමසීය. එයට නබිතුමා 'එය සභාවෙහි සිදුවූ වැරදීම් සඳහා ප්‍රතිකාරය වෙය.' යනුවෙන් ප්‍රකාශ කළ බව අබුබර්සා අල් අස්ලමී (රලි) තුමා වාර්තා කරන්නේය.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

# ආහාර ගැනීම කෙරෙහි සාරධර්ම

මුස්ලිම්වරයා අහාර පානයන් ගැනීම අනෙක් සෑම කාර්යයන් කෙරෙහි උපකාරයක් වශයෙන් බව සිතිය යුතු මිස එයම ප්‍රධාන පරමාර්ථයක් වශයෙන් නොසිතිය යුතුයි. ඔහු ආහාර පානයන් අනුභව කරන්නේනම්, අල්ලාහ්ට වන්දනාමානය කිරීම කෙරෙහි තම ශාරීරික ආරෝග්‍ය රැක ගැනීම සඳහා විය යුතුයි. පරලොව දිනයෙහි ජයග්‍රහණයට හා විමුක්තියට ඔහුව සුදුස්සා ලෙසට පරිවර්තනය කරන්නේ හෙනම මෙම වන්දනාමානයන්ය. එබැවින් ඔහු අනුභව කිරීමේ හා පානය කිරීමේ අදහසින් හෝ එකී ආශාවෙන් හෝ ආහාර පානයන් ගැනීමෙන් වැළකී සිටිය යුතුයි. එසේම, මුස්ලිම්වරයා ආහාර පානයන් ගැනෙන කළ අනිවාර්යයෙන් අනුගමනය කළ යුතු ෂරීආ (ආගමික) සාරධර්මයන් පිළිපැදිය යුතුයි.

## ❑-අනුභව කිරීමට පෙර

1-පිරිසිදු කෑම හා බීම සොයා ගත යුතුයි. ඒවා හරාම් හෙවත් තහනම් දේයින් තොරව හලාල් නම්වූ පවිත්‍ර පැහැදිළි අනුමත ආහාර හා පානයන් විය යුතුයි. මක්නිසාදයත්, අල්ලාහ් 'විශ්වාස වන්තයිනි, අපි ඔබලාට ලබා දී ඇති දේයින් පිරිසිදු (හලාල්) දේ පමණක් අනුභව කරන්න' යනු වෙන් පවසන්නේය. *(අල්කුර්ආන්-2:172)*

මෙහි පිරිසිදු යනුවෙන් හඳුන්වන්නේ පිළිකුල හා අපවිත්‍ර නොවන හලාල් නම්වූ අනුමත දේය. නබිනායක තුමා මේ ගැන පවසන කළ 'හරාම් හෙවත් තහනම් දේ මගින් වර්ධනයවූ ශරීරයට සුදුසුම ස්ථානය අපායවේ.' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූබක්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(හාකිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

2-කෑම හා බීම ගෙනෙන කළ එයටද කුලිය ලැබීමේ චේතනා වෙන් 'අල්ලාහ්ට වන්දනාමානය කිරීම කෙරෙහි ශක්තිය ලැබීම සඳහා මෙය අනුභව කරමි' යනුවෙන් සිතාගත යුතුයි. මක්නිසාදයත්, අනුමතවූ කරුණක් පිරිසිදු චේතනා වෙන් කරන කළ එය කුලිය ලැබෙන වන්දනාමානයක් ලෙසට පරිවර්තනයවේ.

3-තම දෑතෙහි කිලිටු තිබේනම් හෝ පවිත්‍ර බව ස්ථිර කිරීමට නොහැකිනම් ආහාර අනුභව කිරීමට පෙර තම දෑත සෝදාගත යුතුයි.

4-ආහාර අනුභව කරන කළ නබිනායක තුමා අසුන් ගන්නා සේ බැගෑපත්කමින් අසුන්ගෙන සිටිය යුතුයි. නබිනායක තුමා 'මා හාන්සිවී සිට ආහාර අනුභව නොකරමි' යනුවෙන්

පැවැසූ බව බුහාරි ග්‍රන්ථයෙහි සඳහන් වදනක් අබූජුහ්‍ෆා (රලි) තුමාද, 'දාසයෙකු අනුභව කරන සේම මාද ආහාර අනුභව කරමි. දාසයෙකු (බැගැපත්කමින්) අසුන් ගන්නා සේම මාද අසුන් ගනිමි' යනුවෙන් පැවැසූ බව අබූයඃලා ග්‍රන්ථයේ සඳහන් වදනක් ආයිෂා (රලි) තුමියද වාර්තා කරන්නේය.

5-තිබෙන ආහාරය ගැන තෘප්තිවිය යුතු අතර ඒ ගැන විවේචනය නොකළ යුතුයි. කැමැති වුවද අනුභව කළ හැක. අකැමැති වුවද අනුභව නොකර සිටිය හැක. මන්දයත්, 'නබිනායක තුමා කිසියම් ආහාරයක් හෝ විවේචනය නොකරන්නේය. කැමැති වුවද අනුභව කරයි. අකැමැති වූවද (අනුභව නොකර) වැළකී සිටී' යනුවෙන් අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරයි.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

6-අමුත්තා හෝ බිරිඳ හෝ දරුවා හෝ මෙහෙකරුවා හෝ සමඟ එක්ව ආහාර අනුභව කළ යුතුයි. මක්නිසාදයත්, නබිතුමාගේ ශ්‍රාවකරුවන් පිරිසක් එතුමාගෙන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, අපි ආහාර අනුභව කරන්නෙමු. නමුත්, කුස පිරෙන්නේ නැතැ ? යනුවෙන් විමසුම් කළ විට එතුමා 'ඔබලා තනිතනිවද අනුභව කරන්නේ ? යනුවෙන් ඇසීය. ඔවුහු ඔව් යනුවෙන් පිළිතුරු දුන්හ. එවිට එතුමා 'ඔබලා සමූහයෙන් අනුභව කරන්න. එකළ බිස්මිල්ලාහ් උසුරන්න. අල්ලාහ් ඔබලාගේ ආහාරයෙහි විස්තීරණය ලබාදෙයි' යනුවෙන් පැවැසූ බව වහ්ෂී බින් හර්බ් (රලි) තුමා වාර්තා කරයි.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

# ❑-අනුභව කරන කළ

1-බිස්මිල්ලාහ් උසුරා ආරම්භ කිරීම. නබිනායක තුමා 'ඔබලා ආහාර අනුභව කරනකළ අල්ලාහ්ගේ නාමය (බිස්මිල්ලාහ්) උසුරා ආරම්භ කරන්න. ආරම්භ කරන කළ බිස්මිල්ලාහ් උසුරීමට අමතකවූයේනම්, (සිහිවූ කළ) බිස්මිල්ලාහි අව්ව ලහූ වආකිරහූ යනුවෙන් උසුරන්න' යනුවෙන් පැවැසූ බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය.

*(අබූදාවූද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

2-අල්හම්දු ලිල්ලාහ් යනුවෙන් අල්ලාහ්ව ප්‍රශංසා කර අවසන් කිරීම. නබිනායක තුමා මේ බව මෙසේ ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේය.

පුද්ගලයෙකු ආහාර අනුභව කර අවසන්වූ පසු 'අල්හම්දු ලිල්ලාහිල්ලදී අත්අමනී හාදා වරසකනීහි මින්ගයිරි හව්ලින් මින්නී වලා කුව්වතින්' යනුවෙන් පැවැසුවේනම්, ඔහුගේ පෙර පාපයන් සියල්ල සඳහා සමාව ලබා දෙනු ලැබේ'.

*(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

3-තම වමතෙන් (රොටී වැනි දේ නම් ඇඟිලි තුනෙන්) අනුභව කිරීම. ආහාරය කුඩා පිඩුවක් ලෙස රැගෙන හපා අනුභව කළ යුතුයි. එසේම පිඟානයෙහි මාධ්‍යයෙන් තොරව එහි පැත්තකින් අනුභව කළ යුතුයි.

උසාමා බින් අබී සලමා (රලි) තුමා 'මා කුඩා කොල්ලෙකු වශයෙන් නබිනායක තුමාගේ ඔඩොක්කු වෙහි සිටින කල මාගේ අත ආහාර පිඟානයෙහි එහා මෙහා ඇවිදමින් පැවැතිය. ඒ දුටු එතුමා 'දරුවනී, ඔබ ආහාර අනුභව කරනකල

බිස්මිල්ලාහ් උසුරා දකුණතින් පිගානයෙහි පැත්තකින් අනුභව කරන්න' යනුවෙන් මාහට පැවසූ බවට වාර්තා කරත් තේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

4-අනුභව කරන ආහාරයෙන් කිසිවක් බිම වැටුනද එකී කිලිටුව ඉවත් කොට එය අනුභව කළ යුතුයි. මේ ගැන නබිනායක තුමා 'ඔබලාගෙන් කෙනෙකුගේ ආහාරයෙන් පිඩුවක් හෝ බිම වැටුනේනම්, එය රැගෙන එකී කිලිටුව ඉවත්කොට අනුභව කරන්න. ෂාතාන් වෙනුවෙන් එය එසේ අතහැර නොදමන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරයි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

5-උණුවූ ආහාර මත පිඹිය නොයුතු අතර, එය නිවෙන්නට පෙර අනුභව නොකළ යුතුයි. එසේම, ජලය පානය කරන කල එහි ප්‍රශ්වාස නොකල යුතු අතර, භාජනයෙහි පිටත ප්‍රශ්වාස කළ යුතුයි. මේ පිළිබඳ නබි වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා බාජනයෙහි ප්‍රශ්වාස කිරීමද එහි පිඹීමද වැළැක්වේය. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

6-කුස පිරෙන තෙක් අනුභව කිරීමෙන් වැළකි සිටිය යුතුයි. මේ පිළිබඳව නබිනායක තුමා 'කිසියම් පුද්ගලයෙකු තම කුසට වඩා නින්දිත පසුම්බියක් නොපිරවන්නේය. මිනිසාට තම පිට කොන්ද කෙළින් කිරීම කෙරෙහි සමහර ආහාර පිඩුවන් ප්‍රමාණවේ. නොඑසේනම්, තම කුසෙහි තුනෙන් එකක් ආහාරය සඳහාද, තුනෙන් එකක් ජලය සඳහාද, තුනෙන් එකක් ආශ්වාස ප්‍රශ්වාස සඳහාද තබා ගත යුතුයි' යනුවෙන් ප්‍රකාශ කළ බව මික්දාම් (රලි) තුමා වාර්තා කරන්නේය. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

7-සභාවෙහි තමාට වඩා වයසෙන් හා තාරාතිමෙන් උසස් තැනැත්තන් සිටින කළ ඔවුන් අභිබවා ආහාර පානයන් ගැනීමට සීඝ්‍රවිය නොයුතුයි. මෙසේ කිරීම සාරධර්මයට පටහතිවේ.

8-අහාර අනුභව කරන කළ තමා සමග අනුභව කරන සහෝදරයන් කෙරෙහි බැලීම හෝ අවධානය යොමු කිරීම හෝ නොකළ යුතුයි. මන්දයත්, මෙයින් ඔවුහු ලැජ්ජා වීමට හැක.

9-පොදුවෙන් මිනිසුන් පිළිකුල්වන කාර්යයන් නොකළ යුතුයි. භාජනයතුල තම අත ගසා දැමීම, අනුභව කරන කළ මුවෙන් කිසිවක් නොහැලීම සඳහා තම හිස භාජනය කෙරෙහි හාත්සි කිරීම, රොටි වැනි දේ තම කටෙන් හපා අනුභව කළ පසු ඉතිරි කොටස භාජනය තුලට දැමීම හා නින්දිත හා පිළිකුල් කතාබහවල යෙදීම යනාදීන් වැළකී සිටිය යුතුයි. මන්දයත්, මේවා තමා සමග අනුභව කරන සහෝදරයන්ට බාධාවන් ලෙස පැවැතිය හැක.

## ❑-අනුභව කළ පසු

1-නබිතුමාව අනුගමනය කරමින් තම කුස පිරෙන්නට පෙර අනුභව කිරීම අවසන් කළ යුතුයි.

2-අත (ඇඟිලි) උරා පියා දමා හෝ සෝදා හෝ පරිපූරණයෙන් පිරිසිදු කළ යුතුයි.

3-හැලූ ආහාරයන් අහුලා ගත යුතුයි. මෙය ලැබූ දායාදයන් කෙරෙහි .තුති පුද කිරීමකි.

4-කට පවිත්‍රවීම සඳහා දත් පිරිසිදුකර කට සෝදා ගත යුතුයි.

5-ආහාර පානයන් අනුභවකර අවසන්වූ විගස අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතුයි. එසේම තමාට භෝජන සංග්‍රහයක් කළ අයට 'අල්ලාහුම්ම බාරික් ලහුම් ෆීමා රසක්තහුම්, වග්ෆිර්ලහුම් වර්හම්හුම්' යනුවෙන් ප්‍රාර්ථනා කළ යුතුයි.

# ගමන් කිරීම කෙරෙහි සාරධර්ම

ගමන් බිමන් කිරීම මිනිස් ජීවිතයෙහි අත්‍යවශ්‍ය උවමනාවකි. හජ් හා උම්රා කර්තව්‍යයෙහි යෙදීම, යුද්ධ කිරීම, වෙළ දාම් කිරීම, අධ්‍යාපනය ලබා ගැනීම හා සහෝදරයන් මුණ ගැසීම යනාදී කාර්ය සඳහා ගමන් බිමනෙහි යෙදීම අනිවාර්ය වේ. එබැවින් ඉස්ලාමය ගමන් බිමන් කිරීම පිළිබඳ නීතිරීතීන් හා පිළිවෙත් කෙරෙහි ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙන්නේය. එනිසා, එවා කෙරෙහි මනා අවබෝධයක් ලබා එසේ ක්‍රියා වෙහි යෙදීම යහපත්ශීල මුස්ලිම් වරයාට අනිවාර්ය වේ. එම නීති රීතීන් හා පිළිවෙත් මෙසේය.

## ❑ -නීතිරීතීන්

1-රකඅත් සතරකින් සමන්විත සලාතයන් කෙටිකර රකඅත් දෙකක් බැගින් ඉටුකළ යුතුයි. නමුදු මග්රිබ් සලාතය පමණක් කෙටි නොකර එසේම ඉටුකළ යුතුයි. තමා වාසය කරන ගම පසුකර යාමෙන් සිට ගමනය අවසන්කොට නැවත පැමිණෙන තෙක් සලාතයන් කෙටිකර ඉටු කළ හැක. නමුත්, ගමන යෙදෙන ගමෙහි දින සතරක් හෝ එයට වැඩි කාලයක් රැඳී සිටීමට අදහස් කරන්නේනම්, ඒ දිනයවල (එතැන් සිට ගම බලා පිටත්වන තෙක්) සලාතය

කෙටි නොකර පරිපූර්ණයෙන් ඉටුකළ යුතුයි. ගමන අවසන් කොට එතැනින් පිටත්ව ගමට පැමිණෙන තෙක් (ගමනෙහි) සලාතයන් කෙටිකර ඉටුකළ හැක. මේ පිළිබඳව අල්ලාහ් 'ඔබලා ගමනෙහි යෙදෙන කළ සමහර සලාතයන් කෙටි කර ඉටු කිරීමෙන් ඔබලාට වරදක් නොවන්නේය' යනුවෙන් පවසන්නේය. *(අල්කුර්ආන් -4:101)*

එසේම මේ පිළිබඳ නබි වදනක් අනස් (රලි) තුමා 'අපි නබිනායක තුමා සමග මදීනාවෙන් සිට මක්කාවට පිටත් වුයෙමු. නැවත මදීනාවට පැමිණෙන තෙක්ම එතුමා (රක අත් සතරකින් සමන්විත සලාතයන්) රකඅත් දෙක දෙක බැගින් ඉටු කළේය' යනුවෙන් වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

2-ගමනෙහි දින තුනක කාලයක් (දෝවනය කරන කළ) පාමේස් මත පිරිමැදිය හැක. අලි බින් අබී තාලිබ් (රලි) තුමා 'නබිනායක තුමා මගීන්ට රාත්‍රිය සමග දින තුනක්ද මගීන් නොවන්නාට රාත්‍රිය සමග දිනක්ද (පාමේස් මත පිරිමැදීම සඳහා) පිළියෙල කළේය' යනුවෙන් වාර්තා කරයි.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

3-ජලය නොලැබූ විට හෝ එය ලැබීමට අපහසුවූ විට හෝ මිල අධිකවූවිට (දෝවනය කිරීම වෙනුවට) තයම්මුම් කළ හැක. මේ බව අල්ලාහ් පවසන කල 'ඔබලා රෝගාතුරුව හෝ මගීන් ලෙස හෝ මල මූත්‍රා පහකර හෝ ස්ත්‍රීන් සමග සංසර්ගයෙහි යෙදී හෝ සිට පසුව ජලය නොලැබුවේනම්, පිරිසිදු පස්වලින් ඔබලාව පිරිසිදුකර ගන්න. එනම්, එයින් ඔබලාගේ මුහුණෙහි හා අතෙහි පිරිමදින්න.' යනුවෙන් පව සන්නේය. *(අල්කුර්ආන් -4:43)*

4-රාමසාන් කාලයේ උපවාසයෙන් මිදීමට හැක. මේවා පසුව නැවත ඉටුකළ යුතුයි. මේ බව අල්ලාහ් 'ඔබලාගෙන් කව රෙකු රෝගාතුරුව හෝ ගමනෙහි යෙදමින් හෝ සිටියද, ඔහු (එම දිනවල උපවාසයේ නොයෙද ඒවා) පසුව වෙනත් දිනයන්හි උපාවසයේ යෙදිය යුතුයි.' යනුවෙන් පවසයි.

*(අල්කුර්ආන්-2:184)*

5-කාලීන (නෆ්ල්) සලාතයන් වාහනයෙහි අසුන්ගෙන සිටම එය ගමන් කරන දිසාව කෙරෙහි මුහුණ පා ඉටුකළ හැක. නබිනායක තුමා තම මටුවා (වාහනය) මුහුණ පා සිටි දිසාව කෙරෙහි මුහුණ පාමින් කාලීන (සුන්නත්) සලාතයන් ඉටු කරන බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

6-ලුහර් හා අසර් සලාතයන්ද මග්රිබ් හා ඉෂා සලාතයන්ද ජම්උ තක්දීම් (පෙර එකතු කිරීම) හෝ ජම්උ තාකීර් (පසු එකතු කිරීම්) වශයෙන් ඉටු කළ හැක. ජම්උ තක්දීම් නම්, ලුහර් හා අස්ර් සලාතයන් ලුහර් සලාතයේ වේලාවෙ හිද මග්රිබ් හා ඉෂා සලාතයන් මග්රිබ් සලාතයේ වේලා වෙහිද (පෙර එකතුකර) ඉටු කිරීමවේ. ජම්උ තාකීර්නම්, ලුහර් හා අස්ර් සලාතයන් අස්ර් සලාතයේ වේලාවෙහිද මග්රිබ් හා ඉෂා සලාතයන් ඉෂා සලාතයෙහි වේලාවෙහිද (පසු එකතුකර) ඉටුකිරීමවේ. මුආද් (රලි) තුමා 'අපි නබි නායක තුමා සමග තබූක් යුද්ධය සඳහා පිටත්ව ගියෙමු. එවිට එතුමා ලුහර් හා අස්ර් සලාතයන්ද මග්රිබ් හා ඉෂා සලාතයන්ද ජම්උ (එකතු)කර ඉටු කළේය' යනුවෙන් වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ❑ - පිළිවෙත්

1-මුස්ලිම්වරයා ගමනෙහි යෙදීමට පෙර තමා අපාරධයෙන් පැහැර ගත් දේද තමාව විශ්වාස කරමින් තමා වෙත භාර කරන ලද දේද අයිතිකරුවන්ට භාරදිය යුතුයි. මන්දයත්, සමහරවිට ගමනෙහි ඔහුට මරණය සිදුවීමට හැක.

2-තමා රැගෙන යාමට පිළියෙල කරන ආහාර පානයන් හලාල් (අනුමත ඒවා) විය යුතුයි. එසේම, තමාගේ යැපැන්නන්වූ බිරිඳ, දරුවන් හා දෙමාපියන්ගේ අවශ්‍යතාවය සඳහා අවශ්‍ය මුදල ලබා දිය යුතුයි.

3-තම පවුල් ඥාතීන්, සහෝදරයන් හා මිත්‍රයන්ගෙන් සමු ගෙන මෙසේ පැවැසිය යුතුයි.

أَسْتَوْدِعُكُمُ اللهَ الَّذِيْ لاَ تَضِيْعُ وَدَائِعُهُ

*'අස්තව්දිඋකු මුල්ලාහල්ලදී ලාතලීඋ වදාඉඋහු'*

(මා ඔබලාව අල්ලාහ් වෙත භාරකරමි. ඔහු වෙත භාරකරන දේ නිශ්ප්‍රයෝජන නොවන්නේය) එයට ඔවුහූ මෙසේ කිව යුතුයි.

أَسْتَوْدِعُ اللهَ دِيْنَكَ وَأَمَانَتَكَ وَخَوَاتِيْمَ عَمَلِكَ

*අස්තව්දිඋල්ලාහ දීනක වඅමානතක ව(ක්)හවාතීම අමලික.*

(මගේ ආගමද, මගේ අමානත් හෙවත් විශ්වාසනීය භාර කාරත්වයද, මගේ ක්‍රියාවන්හි පලයද අල්ලාහ් වෙත භාර කරමි - (අහ්මද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි) යනුවෙන්ද,

زَوَّدَكَ اللهُ التَّقْوَى وَغَفَرَ ذَنْبَكَ وَيَسَّرَ لَكَ الْخَيْرَ حَيْثُ مَا كُنْتَ

*සව්වදකල්ලාහුත් තක්වා වගෆර දන්බක වයස්සර ලකල් (ග්)හයිර හයිසු මා කුන්ත.*

(අල්ලාහ් ඔබට බියබැතිකම ගමන් සාධක වශයෙන් පරිවර්තනය කරනු මැනවි. ඔබගේ පාපයන් කෙරෙහි සමාව ලබා දෙනු මැනවි. ඔබ කුමන තැනක සිටියද කුසල ඔබට පහසු කරනු මැනවි. (ධාරමී ග්‍රන්ථය ඇසුරෙනි) යනුවෙන් ද ප්‍රාර්ථනා කළ යුතුයි.

ලුක්මාන් (අලෛ) තුමා 'කුමක් හෝ අල්ලාහ් කෙරෙහි භාර කළානම්, ඔහු එය ආරක්‍ෂා කරයි' යනුවෙන් ප්‍රකාශ කළ වදනක් නබිනායකතුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(නසාර් ග්‍රන්ථය ඇසුරෙනි)*

4-සුදුසු පුද්ගලයන් තුන්දෙනෙක් හෝ සතර දෙනෙක් හෝ එයට වැඩි දෙනෙක් හෝ තෝරා ඔවුන් හා සමග තම ගමන යෙදිය යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා 'තනිවම ගමනෙහි යෙදෙන පුද්ගලයා හෙතම සාතාන්ය. එකතුවී ගමනෙහි යෙදෙන දෙන්නා හෙතම සාතාන් දෙන්නාය. එකතුවී ගමනෙහි යෙදෙන තුන්දෙනා හෙතම මගීන් මවුන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අම්ර් බින් ෂුඅෙබ් (රලි) තුමා වාර්තා කරයි. *(අබුදාවුද් ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම නබිනායක තුමා 'තනිව ගමන් කිරීමෙහි ඇති විපත් හා බාධාවන් මා දැන සිටින සේ මිනිසුන් දැන සිටියේනම්, රාත්‍රියෙහි කවරෙකු හෝ තනිව ගමනෙහි යෙදීමෙන් වැළකී සිටී' යනුවෙන් පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

5-මගීන් ඔවුන් අතර කෙනෙකුව අමීර් - නායකයා ලෙස
තෝරාගත යුතුයි. ඔහු ඔවුන්ගේ අදහස් උදහස් මත ඔවුන්ට
මගපෙන්විය යුතුයි. මන්දයත්, නබිතුමා 'තුන්දෙනෙකු ගම
නෙහි පිටත්වූයේනම්, ඔවුහු ඔවුන් අතර කෙනෙකුව අමීර්
ලෙස පත්කර ගනු' යනුවෙන් පැවැසූ බව අබූ සර්දුල් කුද්රි
(රලි) තුමා වාර්තා කරයි. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

6-ගමනය ආරම්භ කිරීමට පෙර සලාතුල් ඉස්තිහාරා (යහ
පත උදෙසා ඉටුකරන සලාතය) ඉටුකළ යුතුයි. මන්දයත්,
නබිනායක තුමා ගමන් කරන අවස්ථාවන්හි හා අනෙකුත්
සෑම අවස්ථාවල මෙම සලාතය ඉටුකිරීම කෙරෙහි වැඩි
යෙන් උනන්දුකර ඇත. කෙතරම්නම්, අල්කුර්ආනයේ පරිච
ජේදයන් අපට ප්‍රමුඛත්වයක් දී ඉගැන්වූ සේම මෙම සලා
තය කෙරෙහිද උනන්දුවෙන් අපට ඉගැන්වූ බව ජාබිර්
බින් අබ්දුල්ලාහ් (රලි) තුමා වාර්තා කරන්නේය.
*(බුහාරි, මුස්ලිම් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

7-ගමනය ආරම්භ කිරීම සඳහා වාහනයෙහි නැගු විගස නබි
තුමා මෙසේ ප්‍රාර්ථනා කළ බව ඉබ්නු උමර් (රලි) තුමා
වාර්තා කරන්නේය.

[اَللهُ أَكْبَرُ، اَللهُ أَكْبَرُ، سُبْحَانَ الَّذِيْ سَخَّرَ لَنَا هَذَا وَمَا كُنَّا لَهُ مُقْرِنِيْنَ، وَإِنَّا إِلَى رَبِّنَا لَمُنْقَلِبُوْنَ ، اَللّهُمَّ إِنَّا نَسْئَلُكَ فِيْ سَفَرِنَا هَذَا الْبِرَّ وَالتَّقْوَى، وَمِنَ الْعَمَلِ مَا تَرْضَى، اَللّهُمَّ هَوِّنْ عَلَيْنَا سَفَرَنَا هَذَا وَاطْوِ عَنَّا بُعْدَهُ، اَللّهُمَّ أَنْتَ الصَّاحِبُ فِي السَّفَرِ وَالْخَلِيْفَةُ فِي الْأَهْلِ، اَللّهُمَّ إِنِّيْ أَعُوْذُ بِكَ مِنْ وَعَثَاءِ السَّفَرِ وَكَآبَةِ الْمَنْظَرِ، وَسُوْءِ الْمَنْظَرِ فِي الْمَالِ وَالْأَهْلِ] (رواه مسلم)

*අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, සුබ්හානල්ලදී සග්හරලනා හාදා වමා කුන්නා ලහු මුක්රිනීන්. වඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලිබූන්. අල්ලාහුම්ම ඉන්නා නස්අලුක ෆී සෆරිනා හාදාල්බිර්ර වත්තක්වා, වමිනල් අමලි මා තර්ළා, අල්ලාහුම්ම හව්වින් අලෙනා සෆරනා හාදා වත්ව් අන්නා බුංදා, අල්ලාහුම්ම අන්තස් සාහිබු ෆිස්සෆරි වල් කලීෆතු ෆිල් අහ්ලි. අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මින් වුඅසාඉස් සෆරි වකආ බතිල් මන්ලරි. වසූඉල් මන්ලරි ෆිල්මාලි වල්අහ්ලි.* *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

(අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණෙ, අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණෙ, අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයාණෙ, මෙය වශීකර දුන් නැනැත්තා පවිත්‍ර වන්නායාය. නිසැකයෙන්ම, මෙය වශීකර ගැනීමේ හැකියාව අපහට නොමැත. නියත වශයෙන්ම, අපි අප දෙවියා කෙරෙහිම නැවත යායුතුව සිටින්නන්ය. දෙවියනේ, මෙම ගමනෙහි යහපත, දේව භක්තිය හා ඔබට තෘප්තිය ගෙන දෙන ක්‍රියාවන්හි යෙදීමේ භාග්‍ය අපි ඔබෙන් අයැදින්නෙමු. දෙවියනේ, මෙම ගමන අපහට පහසුකර එහි දුර ප්‍රමාණය කෙටිකර දෙනු මැනව. දෙවියනේ, මෙම ගමනෙහි අප මිත්‍රයා හා අප පවුලෙහි නියෝජිතයා පෙහතම ඔබමය. දෙවියනේ, ගමනෙහි දුෂ්කරතාවයද ශෝකජනීය පෙණුමද ධනය හා පවුල කෙරෙහි අලාභයෙන් නැවත ඒමද යනාදීන් කෙරෙහි ඔබෙන් රැකවරණය පතමි.)

8–බ්‍රහස්පතින්දා උදැසෙන සමයෙහි ගමනය සඳහා පිටත්විය යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'බ්‍රහස්පතින්දා උදැසෙන

සමයේ ගමනෙහි යෙදෙන්නාට අල්ලාහ් ආශිර්වාද කරනු මැනවි' යනුවෙන් ප්‍රාර්ථනා කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරයි. *(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, 'නබිනායක තුමා බ්‍රහස්පතින්දා දවස හැර අන් දවස්වල ගමන සඳහා පිටත්වීම බොහෝ අඩු' බව කඃබ් බින් මාලික් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා නසාඉ ග්‍රන්ථ ඇසුරෙනි)*

9-මගෙහි උස් බිම (සානුව)ක නගින කළ (අල්ලාහු අක්බර් යනුවෙන්) තක්බීරය කිව යුතුයි.

පුද්ගලයෙකු 'නබිතුමනී, මා ගමනක යෙදීමට අදහස් කරමි. මාහට දේශනා කරන්න' යනුවෙන් නබි තුමාගෙන් විමසූවිට එතුමා 'ඔබ අල්ලාහ් කෙරෙහි බියහැතිකම වෙළා ගන්න. සෑම උස් බිමක (සානුව) නගිනකළ අල්ලාහු අක් බර් යනුවෙන් තක්බීරය කියන්න' යනුවෙන් දෙශනා කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

10-ගමනෙහි මිනිසුන් කෙරෙහි බියට පත්වූයේනම්, පහත සඳ හන් පරිදි ප්‍රාර්ථනා කළ යුතුයි. නබිනායක තුමා මිනිසුන් කෙරෙහි බියට පත්වූ කළ මෙසේ පැවැසූ බව අබී බුර්දත බින් අබ්දුල්ලාහ් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

اَللّٰهُمَّ إِنَّا نَجْعَلُكَ فِيْ نُحُوْرِهِمْ، وَنَعُوْذُ بِكَ مِنْ شُرُوْرِهِمْ

*අල්ලාහුම්ම ඉන්නා නජ්අලුක ෆී නුහුරිහිම් වනඌදු බික මින් ෂුරූරිහිම්.*

(දෙවියනේ, ඔවුන් ඉදිරියෙහි ඔබව තබන්නෙමු. ඔවුන්ගේ උවදුරුවන් කෙරෙහි ඔබෙන් රැකවරණය පතන්නෙමු)

11-ගමනෙහි කරන ප්‍රාර්ථනාවන් පිළිගනු ලබන බැවින් මොලොවෙහි හා පරලොවෙහි යහපත ලබා දෙන මෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුතුයි. මක්නිසාදයත්, නබි නායක තුමා 'ප්‍රාර්ථනාවන් තුනක් සත්සුදක්සේ පිළිගනු ලැබේ. ඒවා අපරාධයට ලක්වූ තැනැත්තා (ශාපකර) කරන ප්‍රාර්ථනාව, මගියා කරන ප්‍රාර්ථනාව හා පියා තම දරුවාට කරන ප්‍රාර්ථනාව යනාදීන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය.

12-කිසියම් තැනක බැසූ විට මෙසේ පැවැසිය යුතුයි.

أَعُوْذُ بِكَلِمَاتِ اللهِ التَّامَّاتِ مِنْ شَرِّ مَا خَلَقَ

*අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාත්ති මින් ෂර්රි මා (ක්)හලක්*

(අල්ලාහ්ගේ පරිපූරණ වැකි මගින් ඔහු නිර්මානය කළ සැම දේහි උවදුරුවලින් මා රැකවරණය පතමි)

එසේම, රාත්‍රිය පැමිණෙවිට මෙසේ පැවැසිය යුතුයි. මන්දයත්, නබිතුමා ගමනෙහි රාත්‍රී කාලය පැමිණ විට මෙසේ පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා වාර්තා කරන්නේය.

يَا أَرْضُ ، رَبِّيْ وَرَبُّكِ اللهُ أَعُوْذُ بِاللهِ مِنْ شَرِّكِ وَشَرِّ مَا فِيْكِ وَشَرِّ مَا خُلِقَ فِيْكِ وَمِنْ شَرِّ مَا يَدِبُّ عَلَيْكِ وَأَعُوْذُ بِاللهِ مِنْ أَسَدٍ وَأَسْوَدَ وَمِنْ الْحَيَّةِ وَالْعَقْرَبِ وَمِنْ سَاكِنِ الْبَلَدِ وَمِنْ وَالِدٍ وَمَا وَلَدَ

*යා අර්ලු රබ්බී වරබ්බුකිල්ලාහු අඌදු බිල්ලාහි මින් ෂර්රිකි වෂර්රි මා ෆී(ක්)කි වෂර්රි මා (ක්)හුලික ෆීක්කි වමින් ෂර්රි මා යදිබ්බු අලෙකි වඅඌදු බිල්ලාහි මින් අසදින් වඅස්වද වමිනල් හයියති වල්අක්රබි වමින් සාකි නිල් බලදි වමින් වාලිදින් වමා වලද්.*

*(අබුදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

(පොළොව ! ඔබගේ හා මාගේ දෙවියා පොතම අල්ලාහ්ය. ඔබගේ උවදුරුවලින්ද, ඔබතුල ඇති (ජලය, ගින්න, සුළඟ යනාදී) දේහි උවදුරුවලින්ද, ඔබ මත නිර්මානය කර ඇති දේහි උවදුරුවලින්ද, ඔබ මත බඩගා යන දේහි උවදුරු වලින්ද අල්ලාහ්ගෙන් රැකවරණය පතමි. එසේම, සිංහයා, නාගයා, සර්පයා හා ගෝනුස්සා යනාදීන්ගේ උවදුරුවලින්ද, මෙම ගමෙහි වසන්නන්ගේ හා අනෙකුත් සෑම ප්‍රාණීන්ගේ උවදුරුවලින්ද අල්ලාහ්ගෙන් රැකවරණය පතමි)

13-තනිව සිටින කල බියට පත්වූනම් මෙසේ උසුරිය යුතුයි.

سُبْحَانَ الْمَلِكِ الْقُدُّوْسِ رَبُّ الْمَلاَئِكَةِ وَالرُّوْحِ جُلِّلَتِ السَّمَاوَاتُ بِالْعِزَّةِ وَالْجَبَرُوْتِ

*සුබ්හානල් මලිකිල් කුද්දූස්. රබ්බුල් මලාඉකති වර්රූහ්. ජුල්ලිලතිස් සමාවාත්තු බිල් ඉස්සත්ති වල් ජබරූත්.*

සුරදූතවරුන්ගේ හා (අග්‍ර සුරදූතවරයාවූ) ජිබ්රීල්ගේ දෙවියා පාරිශුද්ධ රජ්ය. පවිත්‍ර වන්නායය. ඔහුගේ ගෞරවය හා මැඩ පවත්වා පාලනය කරන සමත්කම මගින් අහස ඉතා විශාල වශයෙන් නිර්මානය කරන ලදී.

14-නගරයකට පැමිණ විට මෙසේ උසුරිය යුතුයි. මෙසේ නබි නායක තුමා උසුරා ඇත.

اَللّٰهُمَّ اجْعَلْ لَنَا بِهَا قَرَارًا، وَارْزُقْنَا فِيْهَا رِزْقًا حَلَالًا ، اَللّٰهُمَّ إِنِّيْ أَسْأَلُكَ خَيْرَ هَذِهِ الْمَدِيْنَةِ وَخَيْرَ مَا فِيْهَا، وَأَعُوْذُ بِكَ مِنْ شَرِّهَا وَشَرِّ مَا فِيْهَا

*අල්ලාහුම්මජ්අල් ලනා බිහා කරාරා, වර්සුක්නා ෆීහා රිස්කන් හලාලා, අල්ලාහුම්ම ඉන්නී අස්අලුක හයිර හාදිහිල් මදීනති ව(ක්)හයිර මා ෆීහා, වඅඌදු බික මින් ෂර්රිහා වෂර්රි මා ෆීහා.*

(දෙවියනේ ! මෙම නගරය සැනසුම් සහගත ස්ථානයක් ලෙසට පත්කරනු මැනවි. මෙහි අපහට අනුමත (හලාල්) ආහාර පානයන් ලබාදෙනු මැනවි. දෙවියනේ! මෙම ගමෙහි යහපත හා මෙම ගමෙහි ඇති දේහි යහපතද ලබාදෙන මෙන් ඔබෙන් අයැද සිටිමි. එසේම, මෙම ගමෙහි උවදුර හා මෙම ගමෙහි ඇති දේහි උවදුරුවලින්ද මා ඔබෙන් රැකවරණය පතමි)

15-ගමන අවසන් කොට පැමිණ විට මෙසේ කිව යුතුයි. නබි නායක තුමා මෙසේ පවසා ඇත.

آئِبُوْنَ تَائِبُوْنَ عَابِدُوْنَ لِرَبِّنَا حَامِدُوْنَ

*ආඉබූන තාඉබූන ආබිදූන ලිරබ්බිනා හාමිදූන්*

(නැවත පැමිණෙන්නෙමු. පව්සමාව අයැදින්නෙමු. වැඳුම් පිදුම් කරමින් සිටින්නෙමු. අප දෙවියා කෙරෙහි ප්‍රසංසා කරමින් සිටින්නෙමු)

16-දැනුම් දීමකින් තොරව රාත්‍රී කාලයෙහි හදිසියෙන්ම සිය නිවසට නොපැමිණිය යුතුයි. මන්දයත්, මෙයින් ඔවුහු කල බලයට පත්වීමට හැකිවේ. එබැවින්, තම පැමිණීම පිළිබඳ සුභාරංචිය පෙරාතුරුව දැන්විය යුතුයි.

17-ස්ත්‍රියෙකු මහ්රම් (සැමියා හා වෙනත් විවාහවීමට තහනම්වූ ගෞරවනීය අය) සමගෙන් තොරව ගමන් බිමන් නොකළ යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා මේ බව මෙසේ ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය.

[لاَ يَحِلُّ لِامْرَأَةٍ تُؤْمِنُ بِاللهِ وَالْيَوْمِ الآخِرِ أَنْ تُسَافِرَ مَسِيْرَةَ يَوْمٍ وَاحِدٍ لَيْسَ لَهَا ذُوْ حُرْمَةٍ] (رواه ابن ماجة)

අල්ලාහ්ව හා අවසන් දිනය විශ්වාසකර සිටින ස්ත්‍රියෙකු මහ්රම් හෙවත් විවාහවීමට තහනම්වූ (ගෞරවනීය) පුද්ගලයෙකු හා සමගෙන් තොරව දිනක දුර ප්‍රමාණයක් ගමන් බිමන් කිරීම තහනම්ය. *(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

# ඇඳුම් පැළඳුම් කෙරෙහි සාරධර්ම

1-පොදුවෙන් ඇඳුමක් වශයෙන් හෝ තලප්පාවක් වශයෙන් හෝ වෙනත් ඇඳුමක් වශයෙන් හෝ වේවා සේද පැළඳීම පිරිමින්ට තහනම්ය. මක්නිසාදයත්, නබිතුමා 'මාගේ සමාජයේ පිරිමින්ට සේද හා රත්රන් තහනම්ය. නමුත් ඔවුන්ගේ ස්ත්‍රීන්ට අනුමතය' යනුවෙන් ප්‍රකාශ' කළ බව අබූ මූසා අල් අෂ්අරි (රලි) තුමා වාර්තා කරන්නේය.

2-(කලිසම, සරම හා වෙනත්) ඇඳුම් වර්ගයන් වළලුකරට වඩා පහළට බසින සේ නොපැළඳිය යුතුයි. මන්දයත්, නබි තුමා 'වළලුකරට වඩා පහළට එනු සේ ඇඳුම් පැළඳීම අපායයෙහි පිවිස කරයි' යනුවෙන් පැවසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

3-පාට ඇඳුම්වලට වඩා සුදු ඇඳුම් පැළඳීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතුයි. නමුත් සෑම පාට ඇඳුම්ද අනුමතවූ බව සැළකිය යුතුයි. මේ බව නබිනායක තුමා 'සුදු ඇඳුම් පැළඳින්න. එය පිරිසිදු හා ශ්‍රේෂ්ඨවේ. එමගින්ම ඔබලාගෙන් නැසීගිය තැනැත්තන්ට කෆන් (ඇඳුම්) පළඳින්න' යනුවෙන් පැවසූ බව සමුරා (රලි) තුමා වාර්තා කරයි. *(තිර්මිදි ඇසුරෙනි)*

4-මුස්ලිම් ස්ත්‍රිය තම දෙපා ආවරණය වන පරිදි ඇඳුම් පැළඳිය යුතුයි. එසේම, සාළුවක් හිස මත දමා එමගින් තම බෙල්ල හා පයෝධර ආවරණය කළ යුතුයි. මක්නිසාදයත් මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ يَا أَيُّهَا النَّبِيُّ قُلْ لِأَزْوَاجِكَ وَبَنَاتِكَ وَنِسَاءِ الْمُؤْمِنِينَ يُدْنِينَ عَلَيْهِنَّ مِنْ جَلَابِيبِهِنَّ ﴾ [الأحزاب:٥٩]

නබිතුමනි ! ඔබ බිරිඳන්ටත් ඔබ දියණියන්ටත් විශ්වාසනීය ස්ත්‍රීන්ටත් ඔවුහු තම ඇඳුමෙහි සාළුව (ශරීරය මත) හෙලිය යුතු බව ඔබ පවසන්න. *(අල්කුර්ආන්-33:59)*

﴿ وَلْيَضْرِبْنَ بِخُمُرِهِنَّ على جُيُوبِهِنَّ ﴾ [النور:٣١]

තවද, ඔවුහු තම සාළුව මගින් තම පයෝධර ආවරණය කළ යුතුයි. *(අල්කුර්ආන්-24:31)*

5-රත්රන්වලින් යුත් මුදු පැළඳිය නොයුතුයි. එනමුත් රිදීවලින් යුත් මුදු පැළඳීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය. නබිනායක තුමා 'මාගේ සමාජයේ පිරිමින්ට සේද ඇඳුම් හා රත්රන් තහනම්වූ අතර ඒවා ස්ත්‍රීන්ට අනුමතවේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූමූසා අල්අෂ්අරි (රලි) තුමා වාර්තා කරන්නේය.

*(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

6-එක් පාවහනක් පමණක් පැළඳ ඇවිදිය නොයුතුයි. නබි නායක තුමා මේ බව 'ඔබලාගෙන් කවරෙකු හෝ එක පාව හනකින් නොඇවිදින්න. පාවහන් දෙකම ගලවා ගන්න නොඑසේනම්, පාවහන් දෙකම පැළඳ ගන්න' යනුවෙන් පැවැසූ බව අබූහුරෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, පාවහන් පැළඳින කළ දකුණු පාදයෙන් ආරම්භ කළ යුතුයි. ගලවන කළ වම් පාදයෙන් ආරම්භ කළ යුතුයි. නබිනායක තුමා මේ බව 'ඔබලාගෙන් කවරෙකු හෝ පාවන් පළඳින්නේනම්, දකුණු පාදයෙන් ආරම්භ කරන්න. පාවහන් ගැලවීමට අදහස් කරන්නේනම්, වම් පාදයෙන් ආරම්භ කරන්න' යනුවෙන් පැවැසූ බව අබූහු රෙයිරා (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

මෙසේම, ඇඳුම් පැළඳින කළද පිළිවෙල් හා සාරධර්මයන් අනුගමනය කළ යුතුයි. නබිනායක තුමා පාවහන් පැළඳීම, හිසකෙස් පීරීම හා පිරිසිදු කිරීම වැනි අවස්ථාවන්හි දකුණෙන් ආරම්භ කිරීම ප්‍රියවන බව ආයිෂා (රලි) තුමිය වාර්තා කරන්නීය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

7-පිරිමින්ට අයත් ඇඳුම් ස්ත්‍රීන්ද ස්ත්‍රීන්ට අයත් ඇඳුම් පිරිමින්ද නොපැළඳිය යුතුයි. මක්නිසාදයත්, නබිනායක තුමා ස්ත්‍රීන් ගේ ඇඳුම් පැළඳින පිරිමින්ට හා පිරිමින්ගේ ඇඳුම් පැළඳින ස්ත්‍රීන්ට ශාප කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

එසේම, නබිතුමා ස්ත්‍රීන්ට උපමාවන පිරිමින් හා පිරිමින්ට උපමාවන ස්ත්‍රීන් ශාප කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරයි. *(බුහාරි හා ඉබ්නු මාජා ග්‍රන්ථ ඇසුරෙනි)*

8-නව ඇඳුමක් පැළඳින කල මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි. නබිනායක තුමා මෙසේ ප්‍රාර්තනා කළ බව තිර්මිදි හා අබූදාවූද් ග්‍රන්ථවල වාර්තාවී ඇත.

اَللّٰهُمَّ لَكَ الْحَمْدُ أَنْتَ كَسَوْتَنِيْهِ أَسْئَلُكَ مِنْ خَيْرِهِ وَخَيْرِ مَا صُنِعَ لَهُ
وَأَعُوْذُ بِكَ مِنْ شَرِّهِ وَشَرِّ مَا صُنِعَ لَهُ

*අල්ලාහුම්ම ලකල්හම්දු අන්ත කසව්තනීහි අස්අලුක මින් ඛෛරිහි වඛෛරි මා සුනිඅ ලහු, වඅඌදු බික මින් ෂර්රිහි ව ෂර්රි මා සුනිඅ ලහු.*

(දෙවියනේ ! ප්‍රශංසා සියල්ල ඔබටම හිමිවේ. මෙය ඔබම මාහට පැළඳවූයේය. මෙයින් සිදුවන කුසලද, මෙය කුමන හේතූන් මත නිශ්පාදනය කර ඇත්තේද එකී කුසලද මා ඔබෙන් අයැද සිටිමි. එසේම, මෙයින් සිදුවන උවදුරුවලින්ද, මෙය කුමන හේතූන් මත නිශ්පාදනය කර ඇත්තේද එකී උවදුරුවලින්ද මා ඔබෙන් රැකවරණය පතමි)

# මූලික පෞද්ගලිකත්ව පිරිසිදුකම්

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ මාර්ගයෙන් ලැබී ඇති මූලික පෞද්ගලිකත්ව පිරිසිදුකම් පහකි. මේ බව නබිනායක තුමා 'මූලික පෞද්ගලිකත්ව පිරිසිදුකම් පහකි. ඒවා චර්මඡේදනය කිරීම, රහස් ප්‍රදේශ රෝමයන් ඉවත් කිරීම, කිහිල්ල රෝමයන් ඉවත් කිරීම, නියපොතු කැපීම හා උඩුරැවුල කැපීම, යනාදීන්ය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## මුස්ලිම්වරයා අනුගමනය කළ යුතු පෞද්ගලිකත්ව පිරිසිදුකම් පිළිබඳ සාරධර්මයන් :

1-පිහිය හෝ බ්ලේඩ යනාදියෙන් රහස් ප්‍රදේශ රෝමයන් බූ ගෑසිය යුතුයි.

2-කත්නා හෙවත් චර්මඡේදනය කළ යුතුයි. එනම්, එය පුරුෂ ලිංගයේ ඉදිරියෙහි වසා ඇති හම කපා ඉවත් කිරීම වේ. මෙය දරුවා ප්‍රසූතවී සත්වන දිනයෙහි ඉටු කිරීම සතුටුදා යකවේ. වැඩිවියට පත්වන තෙක් ප්‍රමාද කිරීමෙන් ප්‍රශ්න යක් නොවන්නේය.

3-උඩු තොල් වසා ඇති උඩු රැවුල කපාගත යුතුයි. නමුත් යටි රැවුල නොකපා සණත්වයෙන් වැවිය යුතුයි. මේ බව නබිනායක තුමා 'උඩු රැවුල කපා ගන්න. යටි රැවුල වවා ගන්න. ගිනි වැඳුම් කරුවන්ට විරුද්ධකම් කරන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන වදනක් මුස්ලිම් ග්‍රන්ථයෙහිද, 'ආදේශ කරන්නන්ට

විරුද්ධකම් කරන්න. උඩු රැවුල කපා ගන්න. යටි රැවුල (නොකපා) වවා ගන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන වදනක් බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථවලද සටහන්වී ඇත.

එසේම, හිස කෙස්හි කොටසක් හැර කොටසක් පමණක් බූගෑසීමෙන් වැළක්විය යුතුයි. මක්නිසාද යත්, නබිනායක තුමා මෙසේ කිරීම වැළක්වූ බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

තවද, මුස්ලිම් වරයෙකු හිස කෙස් වවා ගන්නේනම්, එය පීරා පිරිසිදු කිරීම මගින් එය ගරු කළ යුතුයි. මන්දයත්, නබිනායක තුමා 'කවරෙකුට හිස කෙස් තිබේද ඔහු එයට ගරු කරනු' යනුවෙන් ප්‍රකාශකළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

4-කිහිල්ල රෝමයන් කඩාගත යුතුයි. එයට අපහසුවන්නේ නම්, බූ ගැසිය යුතුයි.

5-මූලික පෞද්ගලිකත්ව පිරිසිදුකම්වලින් නියපොතු කැපීමද එකකි. පළමුව දකුණු අතින් ආරම්භකර පසුව වම් අතද, පසුව දකුණු කකුලද, පසුව වම් කකුලද යන පිළිවෙළට නියපොතු කැපීම සතුටු දායක කරුණකි.

මුස්ලිම්වරයා මේ සියල්ල නබිනායක මුහම්මදු (සල්) තුමා පිළිපැදීමේ හා අනුගමනය කිරීමේ චේතනාවෙන් කළ යුතුයි. මේවා කෙරෙහි කුලිය ලැබෙන්නේ හොතම මෙම සිතුවිල්ල අනුවය. මක්නිසාදයත්, ක්‍රියාවන් සියල්ල සිතුවිල්ල අනුවම පිහිටේ. සෑම මිනිසෙකුටම ඔවුනොවුන්ගේ සිතුවිල්ල අනුවම කුලිය ලැබෙන්නේය.

# නිදාගැනීමෙහි සාරධර්ම

මුස්ලිම්වරයා, නින්ද අල්ලාහ් තම දාසයන්ට පිරිනැමූ දායාදයක් ලෙස සැළකිය යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمِنْ رَّحْمَتِهِ جَعَلَ لَكُمُ الَّيْلَ وَالنَّهَارَ لِتَسْكُنُوْا فِيْهِ وَلِتَبْتَغُوْا مِنْ فَضْلِهِ وَلَعَلَّكُمْ تَشْكُرُوْنَ﴾ [القصص:٧٣]

මහු ඔබලා කෙරෙහි රාත්‍රිය හා දහවල සකසා දීම මහු (අල්ලාහ්)ගේ භාග්‍යයෙන් එකකි. මෙය ඔබලා (රාත්‍රියෙහි) විවේක ගැනීම හා (දහවල්හි) මහුගේ දායාද සොයා ගැනීම සඳහාය. (මේ සඳහා) මහුට ඔබලා තුතිය පුදකරත්ත. *(කුර්ආන්-28:73)*

මුස්ලිම්වරයා නිදා ගන්නා කල පහත සඳහන් සාරධර්ම අනුගමනය කිරීම මේ භාග්‍යයට තුති පුද කිරීමක් ලෙස පවතී.

1-ඉශා ගැනීම, අමුත්තන් සමග කතාබහක යෙදීම හා සිය බිරිඳ සමග අල්ලාප සල්ලාපයෙහි යෙදීම යනාදි හේතුවෙන් තොරව ඉෂා නැමදුමෙන් පසු නිදාගැනීම ප්‍රමාද නොකළ යුතුයි. 'නබිනායක තුමා ඉෂා නැමදුමට පෙර නිදාගැනීම හා ඉෂා නැමදුමට පසු (නිශ්ඵල) කතා බහක යෙදීම අප්‍රිය කළේය' යනුවෙන් අබූබර්සා (රලි) තුමා වාර්තා කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

2-නිදාගැනීමට පෙර වුලූ හෙවත් දෝවනය කර ගැනීමට උනන්දුවිය යුතුයි. නබිතුමා 'ඔබ නිදාගැනීමට අදහස් කරන කල නැමදුම සඳහා දෝවනය කරන සේම දෝවනය කර ගන්න' යනුවෙන් පැවැසූ බව බර්රාඋ බින් ආසිබ් (රලි) වාර්තා කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

3-පළමුව කොට්ටය මත තම දකුණු අත තබා දකුණු පැත්තට හැරී නිදාගත යුතුයි. පසුව වම් පැත්තට හැරීමෙන් ප්‍රශ්න යක් නොවන්නේය. නබිනායක තුමා 'ඔබ නිදා ගැනීමට අදහස් කරන කල දෛනික නැමදුම සඳහා දෝවනය කරන සේම දෝවනය කර ගන්න. පසුව දකුණු දිසාව කෙරෙහි නිදා ගන්න' යනුවෙන් පැවසූ බව බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා වාර්තා කරන්නේය.

*(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

එසේම, නබිනායක තුමා 'ඔබ දෝවනය කර නිදාගැනීමට ගියද ඔබ දකුණු අත (හිස යටහි) කොට්ටයක් සේ තබා ගන්න' යනුවෙන් ප්‍රකාශකළ බව බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා වාර්තා කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

4-රාත්‍රියෙහි හෝ දහවල්හි හෝ වෙවා මූණින්තලාවයෙන් නිදා ගත නොයුතුයි. මක්නිසාදයත්, මෙසේ නිදාගෙන සිටි පුද් ගලයෙකු දුටු නබිතුමා 'මෙය අල්ලාහ් අප්‍රිය කරන නිදා ගැනීමකි' යනුවෙන් පැවසූ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. *(හාකිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

5-හැකියාව පරිදි නබි වදන් මගින් ලැබී ඇති ප්‍රාර්ථනාවන් උසුරිය යුතුයි. ඒවායින් සමහර උසුරීම් මෙසේය.

අ-සුබ්හානල්ලාහ් 33 වරක්ද, අල්හම්දු ලිල්ලාහ් 33 වරක්ද, අල්ලාහ් අක්බර් 34 වරක්ද උසුරීම.

දිනක් නබිතුමාගේ දියණියවූ ෆාතිමා (රලි) තුමිය හා ඇගේ සැමියාවූ අලි (රලි) තුමා නබිනායක තුමාගෙන් තම නිවැසෙහි තමන්ට උදව් කිරීම සඳහා සේවකයෙකු ලබා දෙන මෙන් ඉල්ලා සිටීහ. එයට නබිතුමා 'ඔබලා ඉල්ලා සිටී දෙයට වඩා උතුම් දෙයක් මා ඔබලාට දැනුම්

දෙන්නෙහිද ?' යනුවෙන් විමසා 'ඔබලා නිදාගැනීමට යන කල සුබ්හානල්ලාහ් 33 වරක්ද, අල්හම්දු ලිල්ලාහ් 33 වරක්ද, අල්ලාහ් අක්බර් 34 වරක්ද උසුරන්න. එය ඔබලාට සේවකයාට වඩා උතුම්ය' යනුවෙන් පැවැසීය.

*(බුහාරි හා අබුදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)*

ආ-සූරා ෆාතිහා පරිච්ඡේදය, සූරා බකරා පරිච්ඡේදයේ ප්‍රථම වැකි සතර, ආයතුල් කුර්සී, සූරා බකරා පරිච්ඡේදයේ අවසාන වැකි දෙක, සූරා අල්ඉහ්ලාස් පරිච්ඡේදය, සූරා අල්ෆලක් පරිච්ඡේදය හා සූරා අන්නාස් පරිච්ඡේදය යනාදීන් පාරායනා කිරීම. මන්දයත්, මේ බව නබි වදන් වල උනන්දු කර ඇත.

ඉ-නින්දෙන් අවදිවූ විට 'අල්හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානා බඃද මා අමාතනා වඉලෛහින් නුෂූර්' යනුවෙන් උසුරීම.

اَلْحَمْدُ للهِ الَّذِيْ أَحْيَانَا بَعْدَ مَا أَمَاتَنَا وَإِلَيْهِ النُّشُوْرُ

*අල්හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානා බඃද මා අමාතනා ව ඉලෛහින් නුෂූර්*

(ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමිවේ. මරණය නම්වූ නින් දෙහි පසුවීමෙන් පසු පණ පොවා නැගිට්ටුවේ හෙතම මහුය. තවද, (පරමාර්ථ දිනයෙහි නැවත නැගිට්ටව මහු වෙතම අපි යා යුතුවේ)

***සර්ව බලධාරි අල්ලාහ් අප සැමට ඔහුගේ භාග්‍යයන් හා දායාදයන් පහළ කරනු මැනවි.***

# පටුන - محتويات الكتاب

1-අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම - 03
2-සහාබාවරුන් ප්‍රිය කිරීම - 12
3-සහාබාවරුන් හා නබි පවුල් ඥාතීන් - 14
4-ඉස්ලාමීය විද්වතුන් - 16
5-වගකීම් දරන්නන් - 17
6-අල්ලාහ් කෙරෙහි සාරධර්ම - 20
7-අල්ලාහ්ගේ වැකි කෙරෙහි සාරධර්ම - 25
8-නබිතුමා කෙරෙහි සාරධර්ම - 28
9-ආත්මභාවය කෙරෙහි සාරධර්ම - 31
10-දෙමාපියන්ට කළ යුතු කාර්ය - 38
11-දරුවන්ට කළ යුතු කාර්ය - 41
12-සහෝදරයන් කෙරෙහි සාරධර්ම - 44
13-සැමියා හා බිරිඳ කෙරෙහි සාරධර්ම - 44
14-පවුල් ඥාතීන් කෙරෙහි සාරධර්ම - 53
15-අසල් වාසීන් කෙරෙහි සාරධර්ම - 55
16-මුස්ලිම්වරයාගේ අයිතිවාසිකම් - 59
17-කාෆිර්වරුන් කෙරෙහි සාරධර්ම - 69
18-ප්‍රාණීන් කෙරෙහි සාරධර්ම - 73
19-සභාවෙහි සාරධර්ම - 77
20-ගමන් මාර්ගයෙහි සාරධර්ම - 79
21-ආහාර ගැනීම කෙරෙහි සාරධර්ම - 82
22-ගමන් කිරීම කෙරෙහි සාරධර්ම - 88
23-ඇඳුම් පැළඳුම් කෙරෙහි සාරධර්ම - 99
24-මූලික පෞද්ගලිකත්ව පිරිසිදුකම් - 103
25-නිදා ගැනීමෙහි සාරධර්ම - 105

سنهالي

# منهاج المسلم

ردمك : ٥ - ٠٦ - ٨٦٤ - ٩٩٦٠

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف [illegible] ص.ب [illegible] الرياض [illegible] الرمز البريد الإلكتروني E-mail : Sultanah22@hotmail.com
شركة الراجحي المصرفية حساب رقم ١٥٠١١٠٠٠٨